# 2014 – 11 – 04 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

| | | |
|---|---|---|
| **01.** | එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| 02. | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| **03.** | ජ්. පී. ලක්ෂමී හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| **04.** | එච්. එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 05. | පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **06.** | ග්‍රේෂන් කෙරමිණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **07.** | ජ්. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **08.** | ජේ. ඩබ්. හාෂිනී මේනුකා විජේසූරිය මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| **09.** | ජේ. ඩබ්. ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **10.** | ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **11.** | ඩී. ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **12.** | කේ. පුෂ්පික ඉන්දුජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. **09.35** ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. ☸

## (01)

### 01:01 2014 – 10 – 07 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2014 – 10 – 07 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජ්. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවක් නොමැති වූ බැවින් 2014 – 10 – 07 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## 2014 – 10 – 13 දින පවත්වන ලද විශේෂ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2014 – 10 – 07 දින පවත්වන ලද විශේෂ සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවක් නොමැති වූ බැවින් 2014 – 10 – 13 දින පවත්වන ලද විශේෂ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## (02) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන **නැත**

## (03) ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

☞ **පෙ. ව. 9.40 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්. අනුර කිත්සිරි මහතා සභාවට පැමණෙන ලදී.**

**3:1** ‘ දස වසරක රජයේ සංවර්ධන කටයුතු පිළිබඳ ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම ’ මැයෙන් ජනාධිපති කාර්යාලයේ ගරු ජනාධිපති සහකාර ලේකම් තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදි.

පසු ගිය දස වසර තුළ රජය මගින් දිවයින පුරා ක්‍රියාත්මක කළ සංවර්ධන කටයුතු පිළිබඳ ජනතාව දැනුවත් කිරීම උදෙසා ප්‍රචාරක දැන්වීම් පුවරු දිවයින පුරා ප්‍රදර්ශනය කිරීමට කටයුතු යොදා ඇති බවත් මෙය ජනාධිපති කාර්යාලයේ අධීක්ෂණය යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන බවත් දිවයින පුරා කරන ලද ක්ෂේත්‍ර අධ්‍යනයකින් පසු දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීමට සුදුසු ස්ථාන හදුනාගෙන ඇති බවත් ඒ අනුව අම්බලන්ගොඩ නගර සීමාව අසල වෙරළ තීරයේ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අම්බලන්ගොඩ නගරය සීමාව අසල වෙරළ තීරයේ දස වසරක රජයේ සංවර්ධන කටයුතු පිළිබඳ ප්‍රචාරක දැන්වීම් පුවරුව ප්‍රදර්ශනය කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

3:2 ‘ 2014 සිංහල සාහිත්‍ය දිනය වෙනුවෙන් නගර සභා ශාලාව වෙන්කර ගැනීම ’ මැයෙන් අම්බලන්ගොඩ ගා/ශ්‍රී දේවානන්ද විදුහලේ ආදි ශිෂ්‍ය සංගමයේ සම ලේඛම් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

විද්‍යාලයේ දූ දරුවන්ගේ සිංහල සාහිත්‍ය දැනුම හා කුසලතා නැංවීම අරමුණු කරගෙන 2014 වර්ෂය වෙනුවෙන් සිංහල සාහිත්‍ය දිනයක් පැවැත්වීමට තීරණය කර ඇති බවත් මෙවැනි උත්සවයක් පැවැත්වීම සඳහා විද්‍යාලයේ ශාලා පහසුකම් නැති බැවින් මෙම සාහිත්‍ය දින උත්සවය පැවැත්වීමට 2014 නොවැම්බර් මස 05 වන දින පෙ. ව. 7.30 සිට ප. ව. 1.30 දක්වා කාලය අම්බලන්ගොඩ නගර සභා ශාලාව ගෙවීමකින් තොරව ආසන 450 , ජලය , විදුලිය , යන සියලුම පහසුකම් සහිතව ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අම්බලන්ගොඩ නගර සභා ශාලාව ගෙවීමකින් තොරව 2014 සිංහල සාහිත්‍ය දිනය වෙනුවෙන් අම්බලන්ගොඩ ගා/ශ්‍රී දේවානන්ද විදුහලට ලබා දීමටත් ජලය සහ විදුලිය වෙනුවෙන් මුදල් අය කිරීමටත් ගරු සභාව තීරණය කරන ලදී .**

3:3 ‘ 23 වන වරටත් ඉදිරිපත් කරන තොරණ සඳහා අධාර කැටයක් පවත්වා ගෙන යාම සහ ආධාර සංදර්ශණයක් පැවැත්වීම ’ මැයෙන් අම්බලන්ගොඩ සී. ඩූගන්ස් බෞද්ධ සමිතිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2015 වසර සඳහා සී. ඩූගන්ස් බෞද්ධ සමිතිය 23 වෙනි වරටත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන තොරණ සඳහා අම්බලන්ගොඩ බස් නැවතුම්පලේ ආධාර කැටයක් පවත්වාගෙන යාම සහ තොරණ සඳහා ආධාර සංදර්ශනයක් පැවැත්වීමට තානායම් භූමිය ලබා දෙන ලෙසත් මේ සම්බන්ධයෙන් විනෝද බද්දෙන් සී. ඩූගන්ස් බෞද්ධ සමිතිය නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සී. ඩූගන්ස් බෞද්ධ සමිතියට තොරණ සඳහා අම්බලන්ගොඩ බස් නැවතුම්පලේ ආධාර කැටයක් පවත්වාගෙන යාමට සහ ආධාර සංදර්ශනයක් පැවැත්වීමට තානායම් භූමිය ලබා දීමට ගරු සභාව තීරණය කළ අතර තානායම් භූමියේ සංවර්ධන කටයුතු ආරම්භ කළහොත් මේ සඳහා තානායම් භූමිය ලබා දීමට නොහැකි වන බව තව දුරටත් සඳහන් කරන ලදී.**

3.4 ප්‍රදේශවාසීන්ට හිරිහැරයක්ව පවතින එඬේරමුල්ල කුණු බක්කිය ඉවත් කිරීම පිළිබඳ වැඩ අධිකාරීගේ සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව සභාගත කරන ලදී.

එඬේරමුල්ල ප්‍රදේශවාසීන්ගෙන් ලැබී ඇති ලිපිය අනුව ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ බවත් ඒ අනුව මෙම ස්ථානයේ ඉදිකර තිබෙන කුණු බක්කිය කුණු දැමීම සඳහා භාවිතා කර නොතිබූ බවත් අවට කුණු යොදා තිබූ බවත් මේ හේතුවෙන් ප්‍රදේශවාසීන්ට ගැටලුකාරී තත්වයන් උද්ගත වී ඇති බවත් මෙම කුණු බක්කිය දැනටත් අබලන්ව පවතින බැවින් එය පිහිටා ඇති ආකාරය අනුව එහි ඇති කුණු ට්‍රැක්ටරයට ලබා ගත නොහැකි බවත් මෙම ස්ථානයේ ඇති කුණු බැකෝ යන්ත්‍රයක් භාවිතා කර ඉවත් කළ යුතු බවත් මෙම කුණු බක්කිය දැනට ප්‍රයෝජනයට නොගන්නා බැවින් සහ ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීමද මෙම කුණු බක්කිය ඉවත් කිරීම බැවින් සහ මෙවැනි කුණු බක්කියක් තිබීම නුසුදුසු බැවින් මෙම කුණු බක්කිය ඉවත් කිරීම සුදුසු බව සඳහන් කර තිබූ අතර මෙය සභාවේ මුදල් යොදා ඉදිකර ඇති බැවින් සභාවේ අනුමැතිය ලබාගෙන මෙම කුණු බක්කිය ඉවත් කිරීම සුදුසු බවත් නිර්දේශ කර තිබුණි.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මහජනතාවට හිරිහැරයක්ව පවතින එඬේරමුල්ල ප්‍රදේශයේ පවතින දැනට භාවිතා නොකරන දිරාපත්ව ඇති කුණු බක්කිය ඉවත් කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

☞ **පෙ. ව. 9.45 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී වී. සරත් ශ්‍රීලාල්ද සිල්වා මහතා සභාවට පැමිණෙන ලදී.**

3.5 නව වෙළඳ සංකීර්ණයේ නො.07 කඩ කාමරයේ අයිතිය ලබා ගැනීම මැයෙන් නො. 13/1, රේවත පාර" බලපිටිය ලිපිනයේ පදිංචි ඒ.සී.එන් . ෂන්රාන් විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

අබ්දුල් කාදර් මොහොමඩ් ෂන්රාන් වන අය විසින් විජේන්ද්‍ර ආචාරිගේ ඥානසිරි මහතාට අයත් නව වෙළඳ සංකීර්ණයේ නො.07 කඩ කාමරය බද්දට ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශකර සිටින බවත් ඔහු නමින් ගිවිසුම් සකස්කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමණි ඇත්තටම ඔය කඩ කාමර දුන්නේ අපේ පාලන කාලේ. 1984 චක්‍ර ලේඛනයක් තිබුණා ඒ චක්‍ර ලේඛනය අනුවයි දුන්නේ. ඒ චක්‍ර ලේඛනයේ තියෙන්නේ ඒ කඩ බදු දීමක් කරන්න බෑ යම් කිසි ආකාරයකින් සැමියා මැරුණොත් බිරිඳටත් බිරිඳ මැරුණොත් දරුවන්ටත් මේ කඩ අයිති වන ආකාරයට.ඥානසිරි මහත්මයා මුලින්ම මේ කඩේ අරගනද කියන්න මං දන්නෑ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඥානසිරි මහත්මයා මුලින්ම අරන් තියෙන්නේ.1990 ජූලි 10.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

මේ ගැසට් එකට අනුව මේ කඩ කාටවත් දෙන්න අයිතියක් ඔවුන්ට නෑ. අයිතිකරු නැතිනම් ඒක නගර සභාවට පැවරෙනවා. පරම්පරාවේ ලේ ඥාතිකම උප්පැන්න සහතිකය මගින් පෙන්නුවහම තමයි මේ කඩ වල අයිතිය ලැබෙන්නේ.එනිසා මේ කඩ මෙහෙම පවරන්න බෑ. ඒ හින්දා කොමසාරිස්තුමාගෙන් හරි අහලා බලලා නීත්‍යානුකූල තත්වය අනුව මේක කරන්න. මේ විදියේ ගිවිසුම් ගහලා බෑ කඩ පවරන්න.මගේ ලග චක්‍ර ලේඛය තියෙනවා. මං ඒක ඉදිරිපත් කරනවා. මොකද අපේ දේවල් ලක්ෂ ගණන් වලට විකුණලා අපට සුලු මුදලක් දෙනවා කියන එක හරියන්නෑ. මේ කඩය අපට ගත්තොත් හොඳ මුදලකට විකුණන්න පුලුවන්.සභාවට ආදායමක් එන විදියට ටෙන්ඩර් කරන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

යම් කිසි චක්‍ර ලේඛයක් අලුතින් නිකුත් කරන කොට පරන චක්‍ර ලේඛය අවලංගු වෙනවා. මොකද දකුණු පළාත් සභාව තමයි මේ සම්බන්ධ චක්‍ර ලේඛයක් නිකුත් කරන්න බලාත්මක ආයතනය. එතකොට දකුණු පළාත් සභාවෙන් නව චක්‍ර ලේඛයක් නිකුත් කරන කොට 1984 තිබ්බ චක්‍ර ලේඛය අවලංගු කරලා තමයි නව චක්‍ර ලේඛය නිකුත් කරන්නේ. ඒ අනුව අපි අනුගමනය කරන්න ඕන දැනට පවතින චක්‍ර ලේඛය. ඒ චක්‍ර ලේඛයේ තියෙනවා සභාව තීරණය කරන සාධාරණ මුදලක් එකතුකරන්න පුලුවන් කියලා. ඔබතුමා කිව්වේ චක්‍ර ලේඛන අංක දපාපා/පාපාකො/2010/01 චක්‍ර ලේඛයනේ. ඒකේ 20 වන ඡේදයේ සඳහන් වන්නේ මේ ආකාරයට, මීට පෙර මේ සම්බන්ධයෙන් නිකුත් කරන ලද සියලුම චක්‍ර ලේඛන අවලංගු වන අතර මෙම චක්‍ර ලේඛය 2011 ජනවාරි පලවන දින සිට ක්‍රියාත්මක වේ.ඒ කියන්නේ ඊට කලින් නිකුත් කරපු චක්‍ර ලේඛන සියල්ල අවලංගුයි. එතකොට අපි බැඳී සිටින්නේ මේකට. මේ චක්‍ර ලේඛයෙන් ඔබතුමා කියන දේට විකල්පයක් තියෙනවා. මම දන්නවා ගාලු පාර අයිනේ ලක්ෂ 08 ට දීපු කඩේ ලක්ෂ 35 ට විකුණන්නේ.එනිසා සභාව විදියට අපට පුලුවන් නිළධාරීන් ඉදිරිපත් කරපු යෝජනාවට ප්‍රතිවිරුද්ධ යෝජනාවක් ඉදිරිපත් කරන්න. ඒ අවස්ථාව මේ චක්‍ර ලේඛයෙන් දීලා තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

ඔය පාරේ විතරක් නෙවෙයි අනෙකුත් පාරවල් වල බැලුවහමත් ලක්ෂ 14- 15 කඩ ගන්නේ මිනිස්සු අපේ නගර සභාවෙන්. එතකොට අපි මොනවද නගර සභාවක් විදියට මේ කරන්නේ. ආර්ථික වශයෙන් අපි වැටිලා ඉන්නවා. එහෙම වේලාවක අපි ආදායමක් ලබන්න පුලුවන් අවස්ථාවල මුදලක් ලබා ගන්න ඕන නගර සභාවට.නැතිව අරයයි මෙයයි දෙන තක්සේරු නොවෙයි අද පවතින තත්වයට හරියන තක්සේරුවක් ගන්න .අලුත් පාරේ අද වෙළඳ වටිනාකම ඉතාමත් ඉහලයි. අපි අපේ දේවල් වලට තියෙන වටිනාකම ගන්න ඕන.ඒකයි අපේ නගර සභාවේ කාර්යයභාරය වෙන්න ඕන.ගිවිසුම් කරුවන්ට බෑ අරයට දෙන්න මෙයාට දෙන්න කියලා කියන්න. කඩ අයිති අපට. එනිසා අපියි ටෙන්ඩර් කරන්න ඕන. මම පුද්ගලිකව කාටවත් දොස් කියනවා නෙවෙයි. මේ කඩ යන්නේ ලක්ෂ 30-40 යි බස් නැවතුම්පලේ.අපි ලක්ෂයක් වගේ මුදලක් අරගන වැඩක් තියෙනවද.එහෙම නම් මේ ලක්ෂය, ලක්ෂ 05 ක්වත් කරන්න නගර සභාවට ආදායමක් එන්න. අපි මේවට තාම ණය ගෙවනවා. ඔතනටත් ඇති ගාණක් ගෙවන්න මං හිතන විදියට. අපේ කාලෙත් අපි මේවා ගෙවුවා .මේ කඩේටත් අපි දේශිය සංවර්ධන බැංකුවෙන් ණයක් අරගත්තා. ලක්ෂ 17 1/2 ක් විතර ගත්තා. ඒක අපි කී මනී එකෙන් සොයලා ඒවා ගෙවුවා. මම ඉල්ලනවා තමුන්නාන්සෙගෙන් මේ පිළිබඳව තව ටිකක් සොයලා බලලා කටයුතු කරන්න කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙතන මුස්ලිම් ජාතිකයෙක් ඉල්ලන්නේ. එනිසා වෙනසක් කරන්නත් බෑ. මොකද ජාතිය පිළිබඳ ගැටලුවක් බවට මෙය පත්වෙන්න පුලුවන්. එනිසා අනෙක් මන්ත්‍රිවරුන්ගේ මේ පිළිබඳ අදහස කුමක්ද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සමාවෙන්න සභාපතිතුමණි මට නැවත පැහැදිලි කරන්න පුලුවන්ද මේ ගැටලුව

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහෙමයි මේ කඩ දීලා තියෙන්නේ පරන ගිවිසුම් යටතේ 1990 දී. එහිදී 7 වන ජේදයේ සඳහන් වනවා කඩ කාමරය බඳුකරුට ඔහුගේ හෝ ඇයගේ ස්වාමිපුරුෂයාට භාර්යාවට හෝ දරුවකුට මෙම කඩයේ බදු අයිතිය පවරා දෙන ලෙස සභාප්‍රකාරව ලිඛිතව ඉල්ලා සිටීමට බදුකරුට අයිතියක් ඇත.එහෙත් එවැනි සෑම අවස්ථාවකම සභාපතිතුමාගේ ලිඛිත අවසරය ලබා ගත යුතුය කියලා සඳහන් කරලා තියෙනවා.මේ අනුව ඒ කාලේ පවරන්න පුලුවන් වුනේ තමන්ගේ කලත්‍රයට හෝ දරුවකුට විතරයි.නමුත් අද වන විට ඒ චක්‍ර ලේඛය වෙනස් වෙලා ඒක පවරන්න පුලුවන් තත්වයට ඇවිත් තියෙනවා නව චක්‍ර ලේඛන වලින්. එතකොට ඉල්ලීමක් ඇවිත් තියෙනවා දැනට මේ කඩේ අයිති එක්කෙනාගෙන් වෙනත් කෙනෙකුට අයිතිය පවරන්න.දිවුරුම් ප්‍රකාශයකුත් දීලා තියෙනවා.එතකොට දැන් පැවරීම් සඳහා බල පවත්වන්නේ දකුණු පළාත් සභාවේ චක්‍ර ලේඛන අංක 105/01 කියන චක්‍ර ලේඛනය. ඒකේ තියෙන්නේ පලාත් පාලන ආයතන සතු වෙළඳපල කඩ කාමර සති පොළ කඩ කාමර සහ සභාව සතු අනෙක් කඩ කාමර බදු දීම.එතකොට ඒ බදු දීම සහ පැවරීම් කිරීමේදී කරන්න ඕන ආකාරය සඳහන් කරලා තියෙනවා. ඒකේ 11 වන ජේදයේ තියෙනවා බදුකරු විසින් වෙනත් පාර්ශවයකට බදු අයිතිය පැවරීම සභාවේ අවසරයකින් තොරව කිසිවිටකත් නොකළ යුතුය කියලා. 12 තියෙනවා බදුකරුගේ ලිඛිත ඉල්ලීම පිට වෙනත් පාර්ශවයකට බදු අයිතිය පැවරීම පහත පිළිවෙලට කළ යුතුය.

01) දෙපාර්ශවය ලිඛිතව ඉල්ලීම කළ යුතුය.

02) එම ඉල්ලීමට සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

03) 4 පරිදි නව තක්ස්රුවක් යටතේ අවම ලන්සුව තීන්දු කළ යුතුය. එම ලන්සුවේ පෙර ගෙවූ එක්වන් මුදල අඩු කළ විට ලැබෙන වෙනස හෝ එම වෙනස සභාව තීරණය කරන සාධාරණ මුදලක් එකතු කොට නව එක්වන් මුදල තීරණය කර නව බදුකරුගේන් ඉහත අංක 04 පරිදි අය කර ගත යුතු අතර බදු කුලිය නව තක්සේරුගත කුලිය විය යුතුය.

04) බදුකරු කඩයේ අයිතිය නැවත නගර සභාවට පැවරීමට අදහස් කරන්නේ නම් මාස 3 කට පූර්ව එම දැනුම් දීම ලිඛිතව කළ යුතුය.

05) බදු කාලය වසර 05 ක් ඉක්මවා ගිය පසු කඩකාමරය නැවත භාර දීමකදී පැරණි බදුකරු වෙත එක්වන් මුදල නිදහස් කිරීමට හිමිකමක් නැත.එසේ වුවද වසර 5ක් ඇතුලත 12. 4 යටතේ පූර්ව දැනුම් දීම මත එම කඩකාමරය නැවත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීමෙන් පසු අයකරනු ලබන එක්වන් මුදලින් පැරණි බදු කරු ගෙවූ එක්වන් මුදල නිදහස් කිරීමට

කටයුතු කළ යුතුය. යම් හෙයකින් නව එක්වන් මුදල පැරණි එක්වන් මුදලට වඩා අඩුවන අවස්ථාවකදී අඩු කළ යුතු වන්නේ නව එක්වන් මුදලට සමාන මුදලකි.

මේ අනුව බලනකොට මේ පැවරීම බලගන්වලා තියෙනවා. මෙතනදී අපට විවාදගත කරුණ වන්නෙ එකයි.මේ තක්සේරුගත මුදල සාධාරණද නැද්ද, එහෙම නැත්නම් යම් මුදලක් එකතුකරනවද, ඒසේ නම් ඒ මුදල එකතු කරන්නේ කෙහොමද කියන එකයි.මෙහිදී අපේ අවම ලන්සුව විදියට සඳහන් කරලා තියෙන්නේ ලක්ෂ 03යි.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

අපි පිළිගන්නවා ජයන්ත මන්ත්‍රීතුමා කියන එක. නමුත් මේ එක්වන් වාරික ක්‍රමවේදය ගැන සලකා බැලීමේදී කඩකාරයගේ පැත්තෙන් එයා මූලික මුදල ගෙවලා තියෙන්නේ. ඒ මුදල 1990 ඉදල අද වන විට බලන කොට මේ මන්ත්‍රීවරු කියන මුදල ඔවුන් ගෙවලා තියෙන්නේ. ලක්ෂ 5 කට අවුරුදු 14 සාමාන්‍ය පොළිය බැලුවත් . එහෙම බැලුවොත් කඩහිමියන් වසර 15 තිස්සේ කඩයට පොලිය ගෙවලා තියෙනවා. මේ මතුවුන කරුණත් එක්ක මම දකිනවා අපට ප්‍රවේශයක් තියෙනවා කී මනී එක වැඩි කරන්න. මේ ගිවිසුම තුළ ඒ අවකාශය අපට තියෙනවා. මේ සියලුම කඩ වල මේ එක් වන් වාරිකය ගෙවීමේ කී මනී එක වැඩි කිරීම වෙළඳපල අනුව තිරණය කරලා යම් කිසි යෝජනාවක් සභාවේ අනුමත කර ගත්තට පස්සේ අපට සභාවේ මේ වැඩි කිරීම කරන්න පුලුවන්. මේ කඩය ලබා දෙන්න. නමුත් මෙවැනි යෝජනාවක් සම්මත කර ගත්තට පස්සේ අපට ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන්න පුලුවන්නේ. තැනින් තැනට කඩවල වටිනාකම වෙනස් වෙනවා කියලා අදහසකුත් තියෙනවානේ සභාපතිතුමා. උඩ කඩේ එක ගාණක්, යට කඩේ එක ගාණක් . එනිසා සභාව විදියට අපට තියෙන්න ඕන පොදු ස්ථාවර මිළක්.එහෙම නම් සරසවි හන්දියේ උඩ තට්ටුවේ කඩ පැවරීමේදී එක්වන් වාරිකය ලක්ෂ 3 හෝ 4යි. මොකද මේක සරසවි හන්දියට වගේම පොල්වත්ත හන්දියටත් බලපානවා සභාපතිතුමණි. ඒ කඩයක් මාරුකරන කොට ලක්ෂ 05 ක් ගෙවන්න බෑ. මොකද ඒ කඩයක් එච්චර වටින්නෑ. මාළු මාරකට් එකේ උඩ කඩයක් එච්චර වටින්නෑ. රු. 2000-3000 බද්ධට ඒ කඩ යන්නේ. එනිසා මම කියන්නේ අද සරසවි හන්දියට එන යෝජනාව හෙට බස් ස්ටෑන්ඩ් එකට , පොල්වත්ත කඩ වලට එන්න පුලුවන්. ඒකයි අපි කියන්නේ සමස්ථයක් විදියට මේක වැඩි කරලා යෝජනා සම්මත කර ගන්න කියලා.මෙහිදී මෙතුමාට පමණක් වැඩි කිරීමත්, මේ මුදලට ලබා නොදීමත් අසාධාරණයි.මොකද ඊයේ වෙනකම් අපි දුන්නා. එනිසා මෙය ලබා දීමට මම විරුද්ධ නෑ. මම කියන්නේ අපි යෝජනාවක් සම්මත කරලා තියාගමු සභාවේ ඉදිරි වැඩ කටයුතු සඳහා එනකොට සභාව මෙවැනි අපහසුතාවලට ලක්වෙන්නෑ නිත්‍යානුකූලභාවයක් තියෙන නිසා.

☞ **පෙ. ව. 10.05 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. භාෂිණී මෙනුකා විජේසූරිය මහත්මිය සභාවට පැමිණෙන ලදී.**

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

විපක්ෂනායකතුමා ,ආදායම් නිළධාරි මහත්මිය මේ එක්වන් වාරිකය තක්සේරු කරලා තියෙන්නේ චක්‍ර ලේඛයට අනුව බදු මුදල වගේ සිය ගුණයක් වන ආකාරයට. විකල්පයක් තියෙනවා සභාවට අතිරේක මුදලක් එකතුකරන්න.මේකේ බදු කුලිය 2007 .07.26 සංශෝධනය වෙලා තියෙනවා රු.2000.00 කියලා. ඉන් පසු සංශෝධනය වෙලා නෑ. තුන් ලක්ෂ පනස්දහසයි තක්සේරු මුදල තිරණය කරලා තියෙන්නේ වැඩි වීමත් එක්ක. කලින් එක්කෙනා ගෙවලා තියෙනවා එක් වන් වාරිකය ලක්ෂ එකහමාරක්. එනිසා ආදායම් නිළධාරි තිරණය කරලා තියෙනවා මේ චක්‍ර ලේඛනය අනුව ඉතිරි මුදල ලක්ෂ දෙකයි ගන්න පුලුවන්.නමුත් මේ චක්‍ර ලේඛයේම කියලා තියෙනවා අපට අවශ්‍ය නම් අතිරේක මුදලක් එකතු කරන්න පුලුවන්. එහෙම එකතු කරනවනම් ඒ මුදල කීයද කියලා දැන් තිරණය කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

පැවරුම් ගාස්තුත් එක්කද සභාපතිතුමා මේ මුදල තිරණය කරලා තියෙන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නව චක්‍ර ලේඛනය අනුව පැවරුම් ගාස්තු අය කිරීමක් වෙන්නෑ. පැවරීමේ ක්‍රම වේදය කලින්ට වඩා වෙනස් වෙනවා.මෙම චක්‍ර ලේඛය සකස් කරද්දි මමත් සහභාගි වුණා. එහිදි මම සදහන් කළා මේ චක්‍ර ලේඛය අපට ගැලපෙන්නෑ කියලා. මොකද අපේ වෙළඳ අගය මීට වෙනස් කියලා. එහිදි ඔවුන් සදහන් කළේ මේ චක්‍ර ලේඛය වීරකැටියටත් ගැලපෙන්න ඕන කියලා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>

සරත් මන්ත්‍රීතුමා සදහන් කළ ආකාරයට පොල්වත්ත වෙළඳ සංකීර්ණයේ මාසික කුලිය රු. 4000.00 ක් විතර වෙනවා. එහෙම වුනොත් කඩ පැවරීමකදි ලක්ෂ 4 ඉක්මවනවා තක්සේරු මුදල. සතොස වෙළඳ සංකීර්ණයේ මාසික කුලිය රු. 5000.00 පමණ වෙනවා.. ඒ තත්වයේදි ලක්ෂ 5 ඉක්මවනවා. එහෙම බැලුවොත් විෂමාකාර අයකිරීම් තත්වයක් තමයි ඇති වෙන්නේ. එතකොට වැඩිම වෙළඳ වටිනාකමක් තියෙන බස් නැවතුම්පල ආශ්‍රිතව ලක්ෂ 80 ක විතර වෙළඳ වටිනාකමක් තියෙනවා.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නමුත් අපි ගන්නේ ලක්ෂ 2 යිනේ. නමුත් දැන් ඒ මුදල අයකරලා මදි. ඔබතුමාලා ඒ කාලේ අපි ලක්ෂ 2 කරද්දිත් විරුද්ධ වුණා. නමුත් දැන් බැලුවහම ඒ මුදලත් මදි.

<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>

මේ චක්‍ර ලේඛය මත පදනම්ව ඉදිරියේදි වැඩ කිරීමේදි තම කඩ පැවරීමේදි ව්‍යාපාරිකයන් විශාල අසාධාරණයකට ලක් වෙන්න ඉඩ තියෙනවා.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙහෙමයි අපේ කඩ අරගෙන විශාල මුදලක් සොයන ව්‍යාපාරිකයෝ ඉන්නවා. එවැනි අවස්ථා වල සභාවටත් යම් කිසි මුදලක් ලබා ගැනීම ඉතාමත් සාධාරණයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>

මෙතනදි මුදල වැඩි කරනවා කියන ඒකේ සාධාරණත්වයක් තියෙන්න පුලුවන්. ඒ ආකාරයෙන්ම අනෙක් අයටත් මේ චක්‍ර ලේඛයම බලාත්මක කරන්න වෙනවා.

☞ **පෙ. ව. 10.11 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා සභාවට පැමිණෙන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>

සභාපතිතුමණි ඔබතුමා සදහන් කළා මේ චක්‍ර ලේඛය මුළු ලංකාවටම සුදුසු ආකාරයටය හදලා තියෙන්නේ කියලා. නමුත් අම්බලන්ගොඩ කියන්නේ වෙළඳ වටිනාකම ඉහළම ස්ථානයක තියෙන තැනක්. එනිසා සරත් මන්ත්‍රීතුමා පැහැදිලි කළ ආකාරයට වෙළඳ වටිනාකම් අනුව ධීවර වෙළඳ සැල , බස් නැවතුම්පළ පවතින වෙළඳ වටිනාකම අනුව තක්සේරුවක් කළ යුතුයි එක්වන් මුදල. අපට එතකොට ඒ අනුව කටයුතු කරන්න පුලුවන්නේ ඉදිරියේදි.

☞ **පෙ. ව. 10.15 ට පමණ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා සභාවට පැමිණෙන ලදී.**

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙතනදීත් අපට දෙපාරක් හිතන්න වෙනවා මන්ත්‍රීතුමා. මොකද බස් නැවතුම්පලේ කොනේ කඩේ වටිනාකම එකක්. මැද කඩයක වටිනාකම තව එකක්.

☞ **පෙ. ව. 10.21 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා සභාවට පැමිණෙන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

ඒ ඒ කඩ අනුව පුලුවන්නේ අපට තක්සේරු කරන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එහෙම වුනොත් බස් නැවතුම්පළේ උඩ සහ යට කඩ වෙන වෙනම තක්සේරු කරන්න වෙනවා. අදායම් පරීක්ෂකවරු තමයි පළාත් පාලනයේ තක්සේරුකරුවන් වන්නේ. එනිසා ආදායම් පරීක්ෂකවරුන්ට බලය තියෙනවා ආදායම තක්සේරු කරන්න. එහෙම බලයක් නෑ කියලා කියන්න බෑ.

**ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

මම සඳහන් කළේ ව්‍යාපාරිකයකු ලෙස සරත් මන්ත්‍රීතුමා පෙන්වා දුන්න කාරණයට අපිත් එකඟයි. මොකද පොල්වත්ත කඩේක තක්සේරුවත් බස් නැවතුම්පලේ කඩේක තක්සේරුවත් වෙනස් වෙන්න ඕන. ධීවර වෙළඳ ආයතනයේ ඊටත් වඩා වෙනස් වෙන්න ඕන. බදු මුදල හරියට තිරණය කරලා ඒ වගේ 100 ගුණයක්නේ තක්සේරු මුදල වන්නේ. ඒ ආකාරයට නිසි පරිදි කරන්න කියලා මම කියන්නේ. එතකොට අපට මීට වඩා සාධාරණයක් ඉටු කරගන්න පුලුවන්.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

චක්‍ර ලේඛයේ සඳහන් වන්නේ ප්‍රධාන තක්සේරුකරු හෝ පළාත් පාලන ආයතනයේ තක්සේරුකරු සිටිනම් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තක්සේරුකරුගෙන් ලබා ගන්නා තක්සේරුව පදනම් කරගෙන කඩ කාමර කුලී මුදල් තීරණය කරන්න පුලුවන් කියලා.පළාත් පාලනේ තක්සේරුකරුවන් කියන්නේ ආදායම් නිළධාරින් තමයි. ආදායම් නිළධාරින්ට පුලුවන් කඩ කුලිය තක්සේරු කරන්න. මෙතනදී මෙහෙම දෙයක් තියෙනවා. මේ තක්සේරු මුදල වසරින් වසර අලුත් වන ආකාරයට සකස් කරන්න ඕන. මොකද දවසින් දවස වෙළඳ වටිනාකම වෙනස්වෙනවා. එහෙම නම් වසරින් වසර මේ කඩ කුලිය වෙනස් විම අයවැයට යන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමණි , තක්සේරුව ගැන කතා කරන විට ප්‍රධාන තක්සේරුකරු කියන්නේ තක්සේරු දෙපාර්තමේනතුව.දැන් අපි නිවසක් ඉදිකළහම ආදායම් නිළධාරින්ගෙන් තක්සේරුවක් ගන්නවා. ඒක තාවකාලික තක්සේරුවක්. ඒක තක්සේරු දෙපාර්තමේන්තුවට ඇරලා අපි තක්සේරුව ලබා ගන්න ඕන. එතනදි ප්‍රදාන තක්සේරුකරු ලබා දෙන තක්සේරුව තමයි නගර සභාව ගන්න ඕන. ඒක ඇත්තටම ගන්න ඕන.මොකද අපේ නිළධාරින්ට වඩා ඔවුන් දන්නවා මේවායේ වටිනාකම. නැතිනම් සභාවට පාඩුවක්වෙනවා. මේකත් ප්‍රධාන තක්සේරු කරුගෙන් ගන්නවනම් හොදයි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

චක්‍ර ලේඛයේ සඳහන් වෙන්නේ ප්‍රධාන තක්සේරුකරු හෝ කියලා. එතකොට මේ නිළධාරින් තිදෙනාගෙන් කාගෙන් හරි ගන්න පුලුවන්. ප්‍රධාන තක්සේරුකරුගෙන්ම ගන්න අවශ්‍ය නෑ. මෙහිදී එක දෙයයි සභාවට තිරණය කරන්න තියෙන්නේ. මේ තක්සේරු මුදල පිළිගන්නවද නැතිනම් තව මුදලක් එකතුකරනවද කියන එක විතරයි.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමණි, ආදායම් නිළධාරී මහත්මිය වාර්තාවක් ඉදිරිපත් කරලා තියෙනවා. අපට යම් කිසි ආකාරයකට මේ සඳහා අනුමැතිය ලබා දෙන්න පුලුවන්. මොකද නිත්‍යාණුකුලයි අපි කරපු ක්‍රම වේදය.නමුත් මේ කාරණයේ දෙපැත්තක් තියෙනවා සභාපතිතුමණි. අපි ඒ අවස්ථාව අනුව තක්සේරු කරලා කඩ ලබා දෙන්න අවසර දෙනවා. මෙතනදී මගේ ඥාතියෙක් හෝ හිතවතෙක් වුනොත් ඔහු කෙලින්ම එන්නේ මං ළඟට මේක කියලා අඩු කරලා දෙන්න කියලා. එය ප්‍රායෝගික සත්‍ය. මෙහිදී අපි වගේම නිළධාරීනුත් අසීරුවට ලක් වෙනවා. නමුත් අපි සම්මතයක ඉන්නවනම් කිසිම ගැටලුවක් නෑ. මේ කියන චක්‍ර ලේඛය තුළ අපට එහෙම සම්මතයකට යන්න පුලුවන්නම් පවතින ගැටලුව වෙන්නේ පොල්වත්තයි අම්බලන්ගොඩයි කොහොමද අපි සංසන්දනය කරන්නේ කියන එක.සරසවියේ උඩ කඩේට අපි 100% වැඩි කරලා අය කරනවා. පොල්වත්ත කඩේකටත් අපි

100% අය කරනවා. නමුත් ඒක ප්‍රායෝගික නෑ. මොකද එතකොට ලක්ෂ 05 ක් විතර වෙනවා. ප්‍රායෝගික නැත්තේ ඉතිහාසය අනුව. කාලයත් එක්කනේ බද්ධ වැඩි වෙලා තියෙන්නේ. බද්ධ මත පදනම්ව තක්සේරු කිරීමත් ගැටලුවක්. මොකද සමහර කඩ වලට අවුරුදු 15 ටත් වැඩි . ඒ කඩ වල බද්ධ රු.15000.00 වෙලා තිබ්බොත් පහලොස්දාහේ ඒවා සියක් වෙනවා තක්සේරුව. සමහර කඩ වලට වෙන්නේ අවුරුදු 3යි. ඉතින් එහෙම බැලුවමත් ගැටලුවක් තියෙනවා. මේක මගේ පුද්ගලික අදහස. මේ පිළිබඳ චක්‍ර ලේඛයේ තියෙන නිසා මම ඒ සම්බන්ධයෙන් තර්ක කරන්න යන්නෑ.ඒක නිසා මම කියන්නේ ආදායම් නිළධාරියගේ තක්සේරුවට එකඟවෙලා මේක කරන්න පුලුවන්නම් ගැටලුවක් නෑ. අපි අදායම් නිළධාරිනිය ලව්වා සකස්කර ගමු තක්සේරුවක් සෑම කඩයකටම. ඒක සභාපතිතුමා කියන ආකාරයට වසරින් වසර වෙනස් විය යුතු නම් අය වැයට යෝජනා යටතේ ඉදිරිපත් කළා නම් හරිනේ. එහෙම වුනහම නිත්‍යානුකූල බවකුත් තියෙනවා අපිත් නිළධාරිනුත් අපහසුතාවයට ලක් වෙන්නෙත් නෑ.ඒකයි මම කියන්නේ ආදායම් නිළධාරිනියට මෙම යෝජනාව සකස් කරන්න කියමු. අපි එය සභාවේ අනුමත කරලා ප්‍රධාන තක්සේරුකරුගේ අනුමැතිය ලැබෙනව නම් ක්‍රියාත්මක කරන්න පුලුවන්නේ. එතකොට අදායම් නිළධාරින්ට පුලුවන් මෙය අයවැය යෝජනා ලෙසට වසරින් වසර අයවැයට එකතු කරන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ලේකම් මහත්තයා මෙවර අය වැය යෝජනා වලට ලබා දෙන්න ඒ ඒ විෂයන්ට අනුව කඩ වල එක්වන් වාරිකය අය කිරීම සම්බන්ධ යෝජනාවක්. එතකොට අපි ඒක සභා සම්මත කර ගත්තම වසරින් වසර වෙනස් කරනවද කියන එක අපට සාකච්ජා කරලා තීරණය කරන්න පුලුවන්. එවැනි යෝජනාවක් ස්ථිර වෙලා තියෙන කොට මීට වඩා පහසුවෙන් එක් දිනකින් වුනත් කඩ පැවරීම කරන්න පුලුවන්.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

එතකොට සභාපතිතුමණි මේ ගන්න කෙනත් වෙනත් කෙනෙකුට මේ කඩය විකුණුවොත්.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමි**

එතකොට අපට පුලුවන් සභාවෙන් මුදලක් අය කරන්න.මතක තියා ගන්න මේ චක්‍ර ලේඛය අනුව නිළධාරින්ට වගේම සභාවටත් පුලුවන් මුදලක් එකතුකරන්න. ඒකයි මන්ත්‍රීවරුන්ට කිවේ මුදලක් එකතු කරන්න ඕන නම් යෝජනා කරන්න කියලා.අපි සභාවෙන් බස් නැවතුම් පලට යෝජනා කරන මුදල ලක්ෂ 2 යි. අනෙක් ඒවට ලක්ෂයයි. ඒ මුදල සභාව යෝජනා කරන මුදල ලෙස සලකලා යෝජනා වලට ඇතුලත් කරලා මන්ත්‍රීවරුන්ට ඉදිරිපත් කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමණි දැන ගැනීම පිණිස අහන්නේ. මේ ආකාරයට පළමු පැවරීම වුනහයින් පස්සේ මේ ලක්ෂ එකහාමාර නැවතත් වලංගුද. නැතිනම් එකම ලක්ෂ එකහමාර දෙතුන්වතාවක් හුවමාරු වෙනවද?

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මම මේ චක්‍ර ලේඛය සකස් කරද්දි විරුද්ධ වෙද්දි ඔවුන් කිවේ පළාතකට මේක සකස් කරද්දි අපේ දේවල් විතරක් ඇතුලත් කරන්න බෑ කියලා මෙය පුංචි ප්‍රාදේශිය සභාවකටත් වලංගු වෙන්න ඕන කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

මෙහිදී අපි පොදු වෙළඳපල කඩ පිළිබඳවත් සැලකිලිමත් වෙන්න ඕන. මොකද කඩේක වටිනාකම රු. 25000.00 යි. පැවරුම් ගාස්තු ලක්ෂයක් වෙනවා කියන්නේ එතන ලොකු වෙනසක් තියෙනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

බලමු අපි අයවැය යෝජනා වලට ඉදිරිපත්කරනවනේ. 100% කරන්න බැරි වුනත් අපි බලමු.

තීරණය

- ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ආදායම් පරීක්ෂකගේ නිර්දේශය පරිදි අබ්දුල් කාදර් මොහොමඩ් ෂන්රාන් මහතාට නව වෙළඳ සංකීර්ණයේ නො. 07 කඩ කාමරය බද්ධට ලබා ගැනීම සඳහා සභාවේ අනුමැතිය ලබා දුන් අතර කඩවල අයිතිය පැවරීමේදී අය කළ යුතු එක්වන් වාරිකය තීරණය කිරීම සම්බන්ධයෙන් 2015 අය වැය සඳහා යෝජනාවක් ලබා දෙන ලෙස තවදුරටත් සඳහන් කරන ලදී.

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ නැත

**(05)** යථා පරිදි කල්දී ඇති යෝජනා

**05:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා (නිළධාරින් විසින් සකස් කරන ලද පරිපාලන යෝජනා ) :-**

**05:01:1** මාසික සභා වාර්තාව විද්‍යුත් තැපැල(E Mail) මගින් ගරු මන්ත්‍රීවරුන්ට ලබා දීම සඳහා අනුමැතිය ලබා ගැනීමේ පරිපාලන යෝජනාව සභාගත කරන ලදී.

ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාම අන්තර්ජාල පහසුකම් ලබා ගෙන ඇති බැවින් නගර සභා කාර්යාලයේ මාසිකව පවත්වනු ලබන මාසික සභාවේ සභා වාර්තාව විද්‍යුත් තැපැල මගින් ගරු මන්ත්‍රීවරුන්ට ලබා දීමට යෝජනා කර තිබු අතර ඒ සඳහා ගරු සභාවේ අනුමැතිය ඉල්ලා තිබුණි.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමණි මට මේ තියෙන ආකාරයෙන්ම සභා වාර්තාව එවන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි සියලුම මන්ත්‍රීවරුන්ට අන්තර්ජාල පහසුකම සපයලා තියෙනවා.එනිසා කාර්යක්ෂම සේවාවක් වෙනුවෙන් මෙය යෝජනා කරලා තියෙන්නේ. විද්‍යුත් තැපැල මගින් එවනව නම් මීට සති 2 ට කලින් එවන්න පුලුවන් සභා වාර්තාව.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමණි නගර සභා අඥාපනතේ වගේම උපවගන්ති වලත් තියෙන පරිදි දින 4 ට කලින් සභා වාර්තාව අපට එවන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

අයි පෑඩ් වගේ ලබා දීලා තිබුණානම් වටිනවා. මොකද අපට යන තැනකදී වුනත් බලන්න පුලුවන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමණි ගරු සභාව සභා වාර්තාව ලිඛිතව මුද්‍රණය කරනවනේ.එනිසා අපට වාර්තාව එවන ඒකේ ගැටලුවක් නෑනේ. එනිසා අපි ආපස්සට යන්න ඕන නෑ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

විද්‍යුත් තැපැල මගින් අපි සභා වාර්තාව එවන්නම්. එනිසා ඊ මේල් ලිපිනයන් ලබා දෙන්න මන්ත්‍රීවරු. අවශ්‍ය මන්ත්‍රීවරුන්ට මුද්‍රිත මාධ්‍යයෙනුත් ලබා දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ඇත්තටම මම මගින් මගටම ස්තුතිවන්ත වෙනවා නිළධාරීන්ට මේ තත්වයට මේ සභාව ගෙන එන්නට උත්සහ කිරීම පිළිබඳව. මොකද අපි වර්තමානයේ ජිවත් විය යුතුයි. අනාගතය එක්ක අපි යන්නේ. යම් අපහසුතාවයකට ලක් වෙන්න පුලුවන්. සමස්ත රාජ්‍ය සේවයම මුලින්ම මේවා වැළඳ ගනිද්දි අපහසුතාවයන්ට ලක්වුණා. මං හිතන්නේ අපි මන්ත්‍රීවරු වෙන්න ඇති අන්තර්ජාල පහසුකම් පරිගණක ආදිය භාවිතා කිරීමේ පසුපසින්ම ඉන්නේ. මොකද සභාවේ නිළධාරීන් ගත්තත් 90 % විතරම පරිගණක දත්ත භාවිතා කරනවා. එක පැත්තකින් අපි සැම කෙනෙක්ම ආයාසයෙන් හරි මේක ඉගන ගත යුතු වෙනවා. අනෙක් පැත්තේන් රාජ්‍ය ආයතනයක් වියට, සභාවක් විදියට මේ දේ ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙන්න ඕන. මොකද පුද්ගලික ආයතනත් සමග කරට කර තරගකාරීත්වයෙන් යුතුව මෙතනට මේක ඒම පිළිබඳව අපි විශාල ලෙස ආඩම්බර විය යුතුයි. එනිසා අපි ලේකම්තුමා ඇතුලු නිළධාරීන්ට මෙවැනි යෝජනාවක් ගෙන ඒම පිළිබඳ ස්තුතිවන්ත විය යුතුයි. මන්ත්‍රීවරයෙක් විදියට මේ පිළිබඳ මගේ ස්තුතිය නැවතත් පුදකර සිටිනවා. ඒ වගේම මම ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන් විද්‍යුත් තැපැල මගිනුත් මුද්‍රිත මාධ්‍ය මගිනුත් සභා වාර්තාව මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කිසිම ගැටලුවක් නෑ. අම්බලන්ගොඩ නගර සභාව මාසික සභා වාර්තාව සහ සියලුම පරිපාලන වාර්තා මින් අනතුරුව ඒ මොහොතෙම ඉතා ඉක්මණින් විද්‍යුත් තැපැලට යොමු කරනවා. ඒ වගේම මන්ත්‍රීවරු අවශ්‍ය යැයි පැවසු නිසා මුද්‍රිත මාධ්‍යයෙනුත් ලබා දෙන්නම්. ඒ වගේම මම බලාපොරොත්තු වෙනවා මේ ආකාරයෙන් විද්‍යුත් තැපැල දිගින් දිගටම භාවිතා කරලා ඒකට හුරු වෙයි කියලා.මෙහි විශාල වාසි තියෙනවා කිත්සිරි මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ. අයි පැඩ් එකක් වගේ තියෙනවනම් ඕනෑම අවස්ථාවක තමන්ගේ වාර්තාව බලන්න පුලුවන්.

**<u>තීරණය</u>**

**මාසික සභා වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ට විද්‍යුත් තැපැල මගින් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම පරිදි මුද්‍රිත මාධ්‍යයෙන් ද ලබා දීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**05:01:2** THW නිවාසලාභීන්ට ඔප්පු ලබා දීම සඳහා අනුමැතිය ලබා ගැනීමේ පරිපාලන යෝජනා සභාගත කරන ලදී.

පහත නම් සඳහන් THW නිවාසලාභීන් 71 දෙනෙකුට නිවාස සඳහා ඔප්පු ලබා දීමට යෝජනා කර තිබුණි.

**<u>T.H.W. නිවාස ලාභීන් සඳහා ඔප්පු ලබා දීම.</u>**

01. T.H.W. නිවාස යෝජනා ක්‍ර මයේ අංක 06 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි මුතුකුමාර ධනසිරි මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.
02. T.H.W. නිවාස යෝජනා ක්‍රබමයේ අංක 07 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි මුතුකුමාර ධනුෂ්ක කුමාර මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.
03. T.H.W. නිවාස යෝජනා ක්‍රිමයේ අංක 08 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි පද්මසිරි දිසානායක මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

04. T.H.W. නිවාස යෝජනා ක්‍රපමයේ අංක 09 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචිව සිටි මනිමෙල්වඩු තිලකාවතී මහත්මිය මිය ගොස් ඇති බැවින් ඇයගේ උරුමකරුවන් වන රත්නායක ආරච්චිලාගේ නිහාල් / රත්නායක ආරච්චිලාගේ ශ්‍රිියානි / රත්නායක ආරච්චිලාගේ රංජනී / රත්නායක ආරච්චිලාගේ ජගත් / රත්නායක ආරච්චිලාගේ බුද්ධික / රත්නායක ආරච්චිලාගේ ජ්‍රියන්ත යන හයදෙනාගේ නමින් ඔප්පුව ලබා දීමට හෝ උරුමකරුවන් සනාථ කරන්නේ නම් තනි අයකුට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

05. T.H.W. නිවාස යෝජනා ක්‍රවමයේ අංක 10 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි හෙන්දහේවා ලාල් නන්දන ද සිල්වා මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

06. T.H.W. නිවාස යෝජනා ක්‍රයමයේ අංක 11 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි අන්ද්‍රලවාස් පටබැදි මදුරාවතී ද වාස් ගුණවර්ධන මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

07. T.H.W. නිවාස යෝජනා ක්‍රිමයේ අංක 12 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි දොන් සිමන් පටබැදි විජිත නොහොත් විජිතපාල මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

08. T.H.W. නිවාස යෝජනා ක්‍රදමයේ අංක14 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි මහගොඩගේ සෝමසිරි මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

09. T.H.W. නිවාස යෝජනා ක්‍රපමයේ අංක 15 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි කන්ද උඩගේ රංජිත් ජ්‍රේනමසිරි මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

10. T.H.W. නිවාස යෝජනා ක්‍ර්මයේ අංක 16 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි නානායක්කාර ඩොයිල් මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

11. T.H.W. නිවාස යෝජනා ක්‍රබමයේ අංක 17 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි කුලප්පුවා වඩු ගුණසිරි මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

12. T.H.W. නිවාස යෝජනා ක්‍රමමයේ අංක 18 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි රාජපක්ෂ මනික්කුනම්බි පියසිරි මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

13. T.H.W. නිවාස යෝජනා ක්‍රවමයේ අංක 20 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි නයිදප්පුවා වඩු දිලිප් මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

14. T.H.W. නිවාස යෝජනා ක්‍රපමයේ අංක 24 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි කුඩාවිදාන චන්ද්‍රලාල් මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

15. T.H.W. නිවාස යෝජනා ක්‍රමමයේ අංක 26 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි ගරුමුණි හේමවතී ද සිල්වා මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

16. T.H.W. නිවාස යෝජනා ක්‍රමමයේ අංක 27 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි හේවාරාළලාගේ ජ්‍රිමයන්ත සේනගේ මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

17. T.H.W. නිවාස යෝජනා ක්‍රහමයේ අංක 28 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි කෝට්ටගේ මනෝරි රසිකා හා කෝට්ටගේ මනෝජා දිල්හානි මහත්මීන්ට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

18. T.H.W. නිවාස යෝජනා ක්‍රකමයේ අංක 29 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි වල්ගමගේ ජ්‍රියන්ත කුමාර මයාට මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

19. T.H.W. නිවාස යෝජනා ක්‍රුමයේ අංක 30 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි ඉගලහේවා නිහාල් නන්දන මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

20. T.H.W. නිවාස යෝජනා ක්රමමයේ අංක 31 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි දොඹගේ සරත් මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

21. T.H.W. නිවාස යෝජනා ක්ර මයේ අංක 32 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි වඩුගේ පත්මා අයිරාංගනී මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

22. T.H.W. නිවාස යෝජනා ක්රමමයේ අංක 33 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි ගුරු ක්රිරස්තෝම්බු මැක්සි චමින්ද ද සිල්වා මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

23. T.H.W. නිවාස යෝජනා ක්රදමයේ අංක 34 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි මන්ත්රීකවිදාන ලොයිටර් මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

24. T.H.W. නිවාස යෝජනා ක්රපමයේ අංක 39 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි කුඩාවිදාන කරුණාසිරි මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

25. T.H.W. නිවාස යෝජනා ක්රපමයේ අංක 40 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි කුඩාවිදාන පත්මානන්ද මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

26. T.H.W. නිවාස යෝජනා ක්රපමයේ අංක 47 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි කෝට්ටගේ සරත් මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

27. T.H.W. නිවාස යෝජනා ක්රපමයේ අංක 48 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි වීරකොන්ඩ ආරච්චි චිත්රා මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

28. T.H.W. නිවාස යෝජනා ක්රමමයේ අංක 49 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි පණ්ඩිතගේ චන්ද්රඩපාල මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

29. T.H.W. නිවාස යෝජනා ක්රමමයේ අංක 50 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි බදුගොඩහේවා බීටා මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

30. T.H.W. නිවාස යෝජනා ක්රමමයේ අංක 51 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි බදුගොඩහේවා ආරියවතී මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

31. T.H.W. නිවාස යෝජනා ක්රමමයේ අංක 52 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි කලුගලහේවා ආරියරත්න මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

32. T.H.W. නිවාස යෝජනා ක්ර්මයේ අංක 53 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි අන්තිඤ්ඤා මරක්කල සුමිත් ජානක මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

33. T.H.W. නිවාස යෝජනා ක්රිමයේ අංක 54 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි වීරකොණ්ඩ ආරච්චි අයේෂා ලක්මිණි මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

34. T.H.W. නිවාස යෝජනා ක්ර මයේ අංක 56 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි මුරුක්කුවාදුර නන්දසිරි මෙන්ඩිස් මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

35. T.H.W. නිවාස යෝජනා ක්රුමයේ අංක 58 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි දේහිංග සුනිල් මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

36. T.H.W. නිවාස යෝජනා ක්ර මයේ අංක 60 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි මහගොඩගේ සෝමලතා මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

37. T.H.W. නිවාස යෝජනා ක්රමමයේ අංක 61 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි දේහිංග රත්නසිරි මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

38. T.H.W. නිවාස යෝජනා ක්ර මයේ අංක 62 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි කොඩිකාර නිමලාවතී සහ කොඩිකාර මිත්ර.ප්රේ‍මා යන දෙදෙනාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

39. T.H.W. නිවාස යෝජනා ක්රදමයේ අංක 63 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි දේහිංග සෝමසිරි මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

40. T.H.W. නිවාස යෝජනා ක්රඔමයේ අංක 64 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි දීවල දාඹුරේ ගමගේ තිලකසිරි මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

41. T.H.W. නිවාස යෝජනා ක්ර්මයේ අංක 65 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි රාජපක්ෂ මනික්කුනම්බි මොරිස් මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

42. T.H.W. නිවාස යෝජනා ක්ර මයේ අංක 68 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි ගැටවකන්දගේ හේමලතා මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

43. T.H.W. නිවාස යෝජනා ක්ර මයේ අංක 69 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි වැල්ලගේ සෝමවතී මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

44. T.H.W. නිවාස යෝජනා ක්රමමයේ අංක 70 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි පරාක්රතමගේ නන්දසිරි කුමාර් රුද්රියගු මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

45. T.H.W. නිවාස යෝජනා ක්ර්මයේ අංක 71 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි කරුපන් පාක්කියම් මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

46. T.H.W. නිවාස යෝජනා ක්රපමයේ අංක 72 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි මනික්කුගම්හේවා ජ්රිසන්න සංජීව මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

47. T.H.W. නිවාස යෝජනා ක්රහමයේ අංක 74 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි සූරියආරච්චගේ කරුණාසේන මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

48. T.H.W. නිවාස යෝජනා ක්ර්මයේ අංක 55 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි කාලිංග සනත් විජේසිරි මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

49. T.H.W. නිවාස යෝජනා ක්රපමයේ අංක 76 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි කෝට්ටගේ ජ්රේසාද් මහින්ද මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

50. T.H.W. නිවාස යෝජනා ක්ර්මයේ අංක 77 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි රකිනාවසම් උපුල් ආනන්ද මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

51. T.H.W. නිවාස යෝජනා ක්ර මයේ අංක 80 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි රාජපක්ෂ පුංචිනයිදා නම්බි සමන්ත කුමාර මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

52. T.H.W. නිවාස යෝජනා ක්රහමයේ අංක 81 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි වීරකොණ්ඩ ආරච්චි ඉනෝකා චාමනී මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

53. T.H.W. නිවාස යෝජනා ක්රනමයේ අංක 82 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි වීරකොණ්ඩ ආරච්චි දිල්ශාන් මදුජ්රීහතික මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

54. T.H.W. නිවාස යෝජනා ක්රරමයේ අංක 83 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි බිංදුගේ ජ්රි්යකමල් නන්දන මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

55. T.H.W. නිවාස යෝජනා ක්රුමයේ අංක 84 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි මාගොඩගේ කල්යායණි මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

56. T.H.W. නිවාස යෝජනා ක්රමමයේ අංක 86 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි ලොකුගේ සුනිල් මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

57. T.H.W. නිවාස යෝජනා ක්ර්මයේ අංක 87 සහ 89 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි ත්රීලමාමාලිම්බඩගේ ඉෂංකා රසාංගි මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

58. T.H.W. නිවාස යෝජනා ක්‍රමයේ අංක 90 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි ගිනිගල්ගොඩගේ නන්දසිරි ද සිල්වා මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

59. T.H.W. නිවාස යෝජනා ක්‍ර මයේ අංක 95 සහ 113 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි රාජපක්ෂ මනික්කුනම්බි අනුෂා උදේනි මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

60. T.H.W. නිවාස යෝජනා ක්‍ර මයේ අංක 96 සහ 114 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි මහගොඩගේ සෝමසිරි මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

61. T.H.W. නිවාස යෝජනා ක්‍රවමයේ අංක 97 සහ 115 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි ගලප්පත්තිගේ පොඩිහාමි මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

62. T.H.W. නිවාස යෝජනා ක්‍රයමයේ අංක 99 සහ 111 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි හඳුන්නෙත්ති ජයවීර මෙන්ඩිස් මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

63. T.H.W. නිවාස යෝජනා ක්‍රයමයේ අංක 100 සහ 110 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි සූරියආරච්චිගේ කපිල මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

64. T.H.W. නිවාස යෝජනා ක්‍රහමයේ අංක 109 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි ලද්දූ පද්මසීලි මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

65. T.H.W. නිවාස යෝජනා ක්‍රපමයේ අංක 102 සහ 108 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි පත්මසිරි වීරක්කොඩි මයාට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

66. T.H.W. නිවාස යෝජනා ක්‍රපමයේ අංක 107 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි රාමන් පද්මාවඩී මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

67 T.H.W. නිවාස යෝජනා ක්‍ර මයේ අංක 104 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි අත්තිඤ්ඤාමරක්කල ජයනි මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

68. T.H.W. නිවාස යෝජනා ක්‍රමමයේ අංක 66 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි ගෝනපීනුවල ගමගේ බන්දුවතී මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

69. T.H.W. නිවාස යෝජනා ක්‍රයමයේ අංක 75 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි කලුදේව සුනීතා මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

70. T.H.W. නිවාස යෝජනා ක්‍රපමයේ අංක 112 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි කෙරමිණියගේ අශෝකා මහත්මියට නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

71. T.H.W. නිවාස යෝජනා ක්‍රමමයේ අංක 59 දරණ කැබැල්ලේ පිහිටි නිවසේ පදිංචි සූරියආරච්චිගේ ලලිත් නන්දන මයාට පවරා දෙන ලෙස ඔහුගේ සොහොයුරන් වන සූර්යආරච්චිගේ ජයරත්න / සූර්යආරච්චිගේ සරත් නන්දන / සූර්යආරච්චිගේ කපිල / සූර්යආරච්චිගේ ඥානරත්න / සූර්යආරච්චිගේ කරුණාසේන යන අය විසින් ඇඟිලි සලකුණු යොදා අත්සන් කල ලිපියක ඡායා පිටපතක් ඉදිරිපත් කර ඇති අතර එම ලිපිය අම්බලන්ගොඩ ප්‍රාෙදේශිය ලේකම්ගේ අනුමැතිය සහිතව හෝ දිවුරුම් ප්‍රරකාශයක් මගින් ඉදිරිපත් කලහොත් තනි පුද්ගලයෙකු නමින් ඔප්පුව ලබා දීම නිවාස කමිටුවේ නිර්දේශය අනුව හිමිකම් ඔප්පු ලබා දීමට යෝජනා කරමි.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

THW නිවාසලාභීන් සුනාමියෙන් අවතැන් වුනහට පස්සේ අපි අම්බලන්ගොඩ නගර සභාව විදියට සභාව සතු ඉඩමක මේ නිවාස ඉදිකරලා ලබා දුන්නා. එක නිවසක් හැර අනෙකුත් සියලුම නිවාස වලට ඔප්පු ලබා දීමට හැකි වීම පිළිබඳව අපි සියලුම මන්ත්‍රිවරුන්ට ස්තුතිවන්ත වෙනවා. මොකද මේ සම්බන්ධයෙන් විශාල කර්තව්‍යයක් කරන්න සිදු වුණා.

**තීරණය**

**මෙම යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා විසින් ස්ථිර කරනු ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05:02** **ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන ලද යෝජනා :- නැත**

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

6: 1 **2014- 10- 30** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම් . ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාව

කළමණාකරන කමිටු රැස්වීම් වාර්තාව

දිනය - 2014.10.30 වේලාව - ප.ව. 2.30

ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

පැමිණීම

1. ඇම්.ඩබ්.අරුණ ප්‍ර දීප් මහතාසභාපති , නගර සභාව ,අම්බලන්ගොඩ.
2. භාරත සමරසේකර මහතා -ලේකම්, නගර සභාව අම්බලන්ගොඩ.
3. ඩී.ඩබ්.පත්මසිරි මහතා - ගණකාධිකාරී , නගර සභාව.අම්බල්නගොඩ.
4. ඩී.වාසනා තරංගී මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී, නගර සභාව , අම්බල්නගොඩ.
5. එම්.ජී.ආර්.පුෂ්පකුමාර මහතා - සංවර්ධන සහකාර, නගර සභාව , අම්බලන්ගොඩ.
6. එස්.ජී.සජීවනී මිය - තාක්ෂන නිලධාරී , නගර සභාව , අම්බලන්ගොඩ.
7. ජී.කුසුම් ද සිල්වා මිය - කළමණාකරන සහකාර - ආදායම් අංශ ප්‍රධානි
8. කේ.ඩබ්.රංජනී මානෙල් මෙනවිය - පුස්තකාලයාධිපති
9. එස්.නිර්මලාද සිල්වා මිය - ප්‍රධාන කළමණාකරන සහකාර
10. ඩබ්.පී. සිල්වා මිය - අභ්‍ය න්තර විගණන නිලධාරී
11. එම්.මලිත් ප්‍ර නාන්දු මහතාතාක්ෂන නිලධාරී

ගරු සභාපති නීතිඥ ඇම් .ඩබ්.අරුණ ප්‍රමදීප් මහතා විසින් පැමිණ සිටි සියළු දෙනා පිළිගනිමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි . පසු ගිය කමිටුවේ දි ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව විමසන ලදුව ලබා ගත් නිවාඩු වෙනුවෙන් ඉල්ලුම්පත් ලබා දෙන ලෙස දන්වා ඇති බව ප්‍රධාන කළමණාකරන සහකාර විසින් දන්වා සිටින ලදි.

**ආයතන අංශය**

ආයතන අංශය විසින් නව බඳවා ගැනීම් සඳහා කටයුතු කිරීමට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් කර ඇති බවත් , පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට යවා ඇති බවට සපපාකො විසින් දන්වා ඇති බව ද දන්වා සිටින ලදි.

**තීරණය** - නැවත සිහිකැඳවීමක් යැවීමට තීරණය කරන ලදි.

සෞඛ්‍යඅංශයේ සේවකයන්ගේ කටයුතු සම්බන්ධයෙන් අදාල රාජකාරී පෞද්ගලික ලිපි ගොනු වලින් ඉටු කරන ලෙස සභාපති තුමා විසින් උපදෙස් දෙන ලදි.

**ගිණුම් අංශය :**

ගණකාධිකාරී ඩී.ඩබ්.පත්මසිරි මහතා විසින් අදහස් දක්වමින් , 2015 අයවැය සකස් කිරීම සඳහා 2014.10.29 දින ලෙකම් හා අදාල අංශ ප්‍රධානීන් හා නිලධාරීන් සමග මූලිකව සාකච්ඡා කළ බව ප්‍රකාශ කරන ලදි. එසේම 2015 ජාතික අයවැය පදනම් කර ගනිමින් සේවක වැටුප් හා දීමනා සංශෝධනය කළ බව ද , පවසන ලදි. කොට්ඨාශ මට්ටමින් රැස්වීම් පැවැත්වීම සඳහා ප්‍රජා සංවර්ධන නිලධාරී ට උපදෙස් දී ඇති බවත්, පසුව සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් හමුවක් පැවැත්වීමටත්, ලබන මස 13-17 කාලය තුල 2014 අයවැයෙන් ඉටුකිරීමට නොහැකි වූ යෝජනා ප්‍රමුඛතාවයටගෙන ඒමටත් නව යෝජනා සකස් කළ පසුව කෙටුම්පත සකස් කිරීමට බලාපොරොත්තු වෙන බවත් පවසන ලදි.එසේම නොවැම්බර් 18- 25 කාලය තුල කෙටුම්පත සභා අනුමැතියට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කළා.

ගරු සභාපති ඇම්.ඩබ්ලිව් අරුණ ප්‍රදීප් මහතා කරුණු දක්වමින් , 2015 අයවැය යෝජනා ලබා ගැනීම සඳහා සියළු කොට්ඨාශ සඳහා නිලධාරීන් පත්කරන ලෙසත් , මෙම රැස්වීම් වලට අදාල සියළු රාජ්‍ය නිලධාරීන් කැඳවන ලෙසත් ඒ සඳහා විධිමත්ව කටයුතු කරන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරීට උපදෙස් දෙන ලදි. ප්‍රජාමණ්ඩල නිලධාරීන් . සිවිල් ආරක්ෂක කමිටු නිලධාරීන්, ග්‍රාම සේවා නිලධාරීන් . ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සම්බන්ධ සියළු සමෘද්ධි , කෘෂිකර්ම , සංවර්ධන , නිලධාරීන් , පොලිසිය අදාල නිලධාරීන් , දැනුවත් කර කැඳවීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටින ලදි.

**තීරණය** : ප්‍රජා සංවර්ධන නිලධාරිණිය විසින් විධිමත්ව සියළු ප්‍රජා කමිටු රැස්වීම් පැවැත්වීමට තීරණය කරන ලදි. මෙම කමිටු රැස්වීම් සඳහා ඉදිරිපත් කිරීමට පවර් පොයින් වැඩසටහන් සකස් කිරීමට තීරණය විය. ඒ සඳහා ප්‍ර<ජා සංවර්ධන නිලධාරී වාසනා තරංගී , සංවර්ධන සහකාර එම්.ජී. ආර් පුෂ්පකුමාර, තාක්ෂන නිලධාරී ජී . සජීවනී , නලීන් මයා , සම්පත් මයා එකතු වී මෙම වැඩසටහන් සකස් කිරීමට ද තීරණය විය.

මෙයට අමතරව කරගෙන යනු ලබන කර්මාන්ත වල ඡායා රූප ගතකිරීම නිසි පරිදි ඉටුකරන ලෙස ද තාක්ෂන සේවා නිලධාරීට පවසන ලදි.

ගණකාධිකාරී විසින් දන්වා සිටියේ නව ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළයුතු බවත්, ඒ සඳහා නව තක්සේරුවකට යායුතු බවත්ය. කඩිනමින් නව තක්සේරුවක් කළ යුතු බවත්, ඒ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව ඉටුකරන තෙක් බලා නොසිට ආදායම් පරීක්ෂක වරුන් ලවා තාවකාලික තක්සේරුවක් කල යුතු බව ද පවසන ලදි.

**තීරණය** : ආදායම් පරීක්ෂක වරුන් මගින් තාවකාලික තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ආදායම් කළමණාකරන සහකාර - ආදායම් අංශය වෙත ගරු සභාපති තුමා විසින් උපදෙස් දෙන ලදි. එසේම වරිපනම් එකතු කිරීම පිළිබඳව වැඩසටහනක් සකස් කර ලබන කමිටුවට ප්‍රගතිය ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ආදායම් කළමණාකරණ සහකාර ජී.කුසුම් ද සිල්වා මහත්මියට දන්වන ලදි.

ගණකාධිකාරී කරුණු දක්වමින්, කඩ කුලී සම්බන්ධයෙනුත් තක්සේරුවකට යන ලෙසත් එය අවුරුද්දකට වරක් වුවද කළ හැකි බවත් පවසන ලදි. එසේ ම වරිපනම් එකතු කිරීම සඳහා ඒ.ඒ.රණවික්‍රම, දමිසිතාර මංජුල නයනජිත් හා ටී .චන්න යන අය යොදවන ලද බවත් , ඔවුන් විසින් මේ වන විට එකතු කරන ලද මුදල් පිළිබඳව ද කරුණු දක්වන ලදි.

**තීරණය:** හිඟ එකතු කිරීම ප්‍රමාණවත් නොවන බවත් , ආදායම් අංශයේ වෙනම රැස්වීම් සති දෙකකට වරක් පවත්වා ඒවායේ ප්‍රගතිය කළමණාකරන කමිටුවට ඉදිරිපත් කරන ලෙසත් තීරණය කරන ලදි.

ගණකාධිකාරී කරුණු දක්වමින් ණයහිමියන් පිළිබඳව විස්තර ඉදිරිපත් කරමින් සභාපතිතුමාගේ දැනගැනීමට වාර්තා කරන ලදි. ලබා දෙන ලද වාර්තාව සභාපති තුමා වෙත ලබා දෙන ලදි.

ගරු සභාපති තුමා අදහස් දක්වමින් , මෙවර වැටුප් ප්‍රතිපූරණය සඳහා වැඩි මුලක් ලද බැවින් අත්‍යාවශ්‍යම වියදම් පමණක් සිදු කිරීමට කටයුතු කරන ලෙස දන්වන ලදි. එසේම සමූකාරයට ඉන්ධන වෙනුවෙන් ලබන සඳුදා වන විට ගෙවීම් කරන ලෙස ද උපදෙස් දෙන ලදි.

**ආදායම් අංශය :** ප්‍ර.ස.කළ.සහකාර ජී. කුසුම් ද සිල්වා මහත්මිය අදහස් දක්වමින් , කොමිස් මුදල් නොගෙවීම පිළිබඳ ගැටළු ඇති බව ප්‍රකාශ කරන ලදි. එය ලබන සතියේ විසඳන බව ගණකාධිකාරී ප්‍රකාශ කරන ලදි. ලෂිකා මිය නිවාඩු යන බැවින් ඒ සඳහා වැඩපිළිවලක් සකස් කරගැනීමට නියමිත බව පවසන ලදි .

**තීරණය :** ප්‍රධාන ආදායම් නිලධාරිනිය මෙම රැස්වීමට පැමිණෙන විට සූදානම් ව පැමිණෙන ලෙස ගරු සභාපති තුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

**කර්මාන්ත අංශය :**

ට්‍රේල සකස් කිරීම් ඇතුළු වැඩ කිහිපයක් අවශය ද්‍රව්‍ය නොමැතිවීමෙන් ප්‍රමාද ඇති බව තාක්ෂන සේවා නිලධාරිනිය ප්‍රකාශ කරන ලදි.

**තීරණය :** අවශ්‍ය ද්‍රව්‍ය පිළිබඳ ලැයිස්තුවක් සකස් කර ගරු සභාපති තුමා වෙත ඉදිරිපත් කරන ලෙස තාක්ෂන සේවා නිලධාරී වෙත දන්වන ලදි.

නගර සභා දෙපල වල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් කර්මාන්ත කරන විට ගැටළු මතුවී ඇති බව තා.සේ.නි. විසින් කරුණු දක්වන ලදි.

**තීරණය :** නගර සභා දෙපල වල කරමාන්ත කිරීමට පෙර නගර සභාවේ එකඟතාවය ලබා ගන්නාලෙස ප්‍රාදේශීය ලේකම් ට දන්වා යවන ලෙස කර්මාන්ත අංශයට උපදෙස් දෙන ලදි.

තාක්ෂන සේවා නිලධාරී කරුණු දක්වමින් , නව ළමා උදයානය ට ආරක්ෂාව ප්‍රාමානවත් නොවන බව පවසන ලදි.

**තීරණය :** අවශ්‍ය නම් ආරක්ෂක නිලධාරීන් එම ස්ථානයට යොදවන ලෙස උපදෙස් දෙන ලදි

**සෞඛ්‍ය අංශය : සෞඛ්‍ය අංශය නියොජනය කරමින් මහජන සෞඛ්‍යල පරීක්ෂක පැමිණ නොසිටි බැවින් නොපැමිණීමට කරුණු විමසන ලෙස ගරු සභාපති තුමා විසින් උපදෙස් දෙන ලදි.**

**ප්‍රජා සංවර්ධන අංශය :**

ප්‍රජාසංවර්ධන නිලධාරී විසින් කරුණු දක්වමින් , 2014 වර්ෂයේ විශිෂ්ඨතම පුස්තකාල සංරක්ෂන මධ්‍ය ස්ථානයට හිමි සම්මානය මෙවර අම්බලන්ගොඩ නගර සභා ප්‍රධාන මහජන පුස්තකාලයට ලැබී ඇති බව ප්‍රකාශ කරන ලදි. එසේම 2010 වසරේ සිට 2014 දක්වා ජාතික කියවීමේ මාසය වෙනුවෙන් සංවිධානය කළ වැඩසටහන් වෙනුවෙන් නගර සභා මහජන පුස්තකාලයට සම්මාන ලබා ගත් බවත් දන්වන ලදි.

**තීරණය :** මෙම සම්මාන ලබා ගැනීමට දායක වූ සියළු කාර්යය මණ්ඩලය ඇගයීමට ලක් කිරීම සඳහා ප්‍රිසංසා සහතික නියමිත් ආකෘතියට අනුව පෞද්ගලික ලිපි ගොනු වලට යෙදීමට ප්‍රධාන කළමණාකරන සහකාර නිර්මලා මියට පවරන ලදි. ඇගයීම සඳහා සුදුසු වැඩසටහනක් සකස් කර සභාවට ඉදිරිපත් කරන ලෙස ගණකාධිකාරී ඩී.ඩබ්. පත්මසිරි මහතාට පවරන ලදි.

මෙයට අමතරව ගරු සභාපති තුමා විසින් දන්වා සිටියේ කාර්යය සාධන තරඟයේ උපරිම ලකුණු ලබා ගන්නා කාර්ය මණ්ඩල සාජිකයන්ට ද ඇගයීම සඳහා වැඩපිළිවලක් යෝජනා කරන බවයි.

නගර ක්‍රිඩා උත්සවය නොවැම්බර් මස අවසානයේ දී පැවැත්වීමට බලාපොරොත්තු වන බව ප්‍රජා සං.නි විසින් දන්වන ලදි.

**තීරණය :** ගරු සභාපති තුමා කරුණු දක්වමින් , ශරීර සුවතා මධ්‍යස්ථානය විවෘත කිරීම නගර ක්‍රීඩා උත්සවයට සමගාමීව කළ යුතු බව පවසන ලද අතර ඒ සඳහා කටයුතු කරන ලෙස තා.සේ.නි. වෙත උපදෙස් ලබා දෙන ලදි. නොවැබර් මස අවසන දී උත්සවය පැවැත්වීමට අවශ්‍යයි කටයුතු කරන ලෙස ද තීරණය කරන ලදි.

ගරු සභාපති තුමා විසින් නව පුස්තකාලය සඳහා සැළසුමක් සකස් කරන ලෙස තාක්ෂන සේවා නිලධාරීට උපදෙස් ලබා දෙන ලද අතර හල්වතුර ප්‍රදේශයේ ඇති කන්ද වසමට වැටෙන කොටසේ අයිතිකරුවන් හා ඒ ඒ කැබලි කාගේ ද යන්න පිළිබඳව වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ආදායම් කළමණාකරන සහකාර ජී.කුසුම් ද සිල්වා මහත්මියට උපදෙස් දෙන ලදි.

අනතුරුව සභා ලේකම් භාරත සමරසේකර මහතා විසින් පැමිණි සියළු දෙනාට ස්තුති කරමින් රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ : එම්.ජී.ආර්. පුෂ්පකුමාර

සංවර්ධන සහකාර

| | |
|---|---|
| ලේකම් | නීතිඥ ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් |
| අම්බලන්ගොඩ නගර සභාව | සභාපති |
| | නගර සභාව අම්බලන්ගොඩ |

**ඒ අනුව 2014 -10- 30 දින පවත්වන ලද කළමණාකරන කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

✠ **තේ විවේකය සඳහා විනාඩි 05 ක කාලයකට ගරු සභාවේ වැඩ කටයුතු නතර කරන ලදී.**

**6: 2** **2014- 10- 20** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද වෙළඳ කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම් . ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>අම්බලන්ගොඩ නගර සභාව වෙළඳ සංගමය සමග පවත්වනු ලබන කමිටු රැස්වීමේ වාර්තාව</u>

දිනය : 2014.10.20 ප.ව.2.30

ස්ථානය : නගර සභා රැස්වීම් ශාලාව

<u>පැමිණීම</u>

1. ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා — සභාපති , නගර සභාව , අම්බලන්ගොඩ.
2. සමන් අත්තනායක මහතා - — වෙළඳ සංගමය, අම්බලන්ගොඩ.
3. ජේ.එච්.වජිර සිල්වා මහතා - — වෙළඳ සංගමය, අම්බලන්ගොඩ.
4. භාරත සමරසේකර මහතා - — ලේකම් , නගර සභාව , අම්බලන්ගොඩ.
5. එම්.ජී.ආර්. පුෂ්පකුමාර මහතා - — සංවර්ධන සහකාර, නගර සභාව අම්බලන්ගොඩ.

2014.10.20 වෙනි දින පැවති මෙම රැස්වීම සඳහා ගණපූරණය ප්‍රමාණවත් නොවූ බැවින් ලබන මාසයට කල් තැබීමට තීරණය කරන ලදි.

සකස් කළේ :

එම්.ජී .ආර්.පුෂ්පකුමාර

සංවර්ධන සහකාර

භාරත සමර සේකර

ලේකම්

අම්බලන්ගොඩ නගර සභාව

ඇම්.ඩබ්.අරුණ ප්‍ර.දීප්

සභාපති

අම්බලන්ගොඩ නගර සභාව

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම රැස්වීම ගණ පූර්ණය නැති නිසා කල් තබලා තියෙනවා. ඒ වාර්තාව මං ඉදිරිපත් කරනවා.

**ඒ අනුව 2014 -10- 20 දින පවත්වන ලද වෙළඳ කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3** **2014- 10- 23** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම් . ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>ක්‍රී ඩා කමිටු වාර්තාව - අම්බලන්ගොඩ නගර සභා</u>ව**

**දිනය - 2014. 10.23**

**වේලාව - ප.ව. 2.30**

**ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව**

**සහභාගිත්වය -**

ඇම්.ඩබ්ලිව්. අරුණ ප්‍ර දීප් මහතා - ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව.

භාරත සමරසේකර මහතා - ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව.

කේ.ජේ.තාබ්රෙමව් මහතා - රියෝ ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ.

ජී. අශෝක කුමාර මහතා - ක්‍රී-ඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.

එච්.යසරත්න ද සිල්වා මහතා - ක්‍රීකඩා භූමි භාරකරු, අම්බලන්ගොඩ නගර සභාව.

ඉඳුනිල් එදිරිවික්‍ර ම සූරිය මහතා - පාපන්දු පුහුණුකරු ,අම්බලන්ගොඩ නගර සභාව.

ඩී.වී.තරංගි මිය - ප්‍රජාසංවර්ධන නිලධාරි, අම්බලන්ගොඩ නගරසභාව.

**පිළිගැනීම- ගරු සභාපති ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍ර,දීප් මහතා**

ක්‍රීගඩා කමිටුව සඳහා පැමිණි සියළුම මහත්ම මහත්මීන් පිළිගනිමින් ක්‍රීඩා කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි.

**පසුගිය කමිටු රැස්වීමේ දී සාකච්ඡා වූ කරුණු සමාලෝචනය**

1. මළල ක්‍රීඩා පුහුණුවීම් සඳහා පොල්වත්ත ක්‍රීඩාංගණය සකස් කිරීම.

**ක්‍රීඩා භූමි උපදේශක**

දිස්ත්‍රික් මළල ක්‍රීඩා පුහුණුකරු සහ ක්‍රීඩා නිලධාරි සමග ක්‍රීඩාංගණයේ මළල ක්‍රීඩා පුහුණු වීම් සඳහා යොදා ගත හැකි ස්ථානය පරික්ෂා කළ බව සහ පළමුවෙන්ම එම ස්ථානය ඩෝසරයක් ආධාරයෙන් එළි පෙහෙළි කළයුතු බව දැන්වීම.

**ගරු සභාපතිතුමා-**

නගර සභාවේ තාක්ෂණ නිලධාරි සමග සම්බන්ධව අදාළ කටයුතු සිදුකරන ලෙස හා ඒ සඳහා වන ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදි.

2. ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරිමට ශ්‍රී ලංකා යුධ හමුදාවට හෝ නාවික හමුදාව වෙත ලබා දීම සුදුසු බවට ඉල්ලීම් කිරිම.

**ප්‍රාදේශීය සංවර්ධන නිලධාරි-**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් මේ පිළිබඳව ලිඛිතව විමසා ඇති බව දන්වන ලදි.

**ගරු සභාපතිතුමා-**

මේ සඳහා වන ඇස්තමේන්තුව හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරනු ලබන්නේ කවුරුන් විසින් යන්න පිළිබඳ තොරතුරු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ගෙන්වා ගැනීමට කටයුතු කිරීමට උපදෙස් ලබා දීම.

3. මාදම්පා ගඟ ආශ්‍රිත භූමිය අත්පත් කර ගැනීමට කටයුතු කිරීම.

**ප්‍රාදේශීය සංවර්ධන නිලධාරි-**

මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලිඛිතව දන්වා ඇති බව.

**ගරු සභාපතිතුමා-**

නගර සභාව මගින් ද මෙම භූමියේ මිනින්දොරු සැළැස්මක් ලබා ගැනීමට කටයුතු කළ යුතු බවට දැනුම් දිම.

**වෙනත් කරුණු-**

නගර ක්‍රීඩා තරග පවත්වා අවසන්ව ඇති බැවින් අවසන් උළෙල පැවැත්වීම සඳහා ගරු ක්‍රීඩා ඇමතිතුමන් සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මැතිතුමන් සහභාගි කර ගැනීමට බලාපොරොත්තු වන බැවින් එතුමන්ලාට මේ සඳහා සහභාගි විය හැකි ලෙස දිනය ලබා ගැනීමට ලිඛිතව විමසීමට ප්‍රාදේශීය සංවර්ධන නිලධාරිට හා පාපන්දු සම්මේලනයේ ගරු සභාපතිතුමන් ද සහභාගි කරගැනීමට පාපන්දු පුහුණු කරු ඉඳුනිල් එදිරිවික්‍රම සූරිය මහතාට උපදෙස් ලබා දීම.

**ඉඳුනිල් එදිරිවික්‍රම සූරිය මහතා**

මහජන ක්‍රීඩාංගණයේ ක්‍රීඩා මණ්ඩපය ඉදිරිපිට විශාල වළක් සෑදි ඇති බව ඉන් දුහදක් ද හමන බව එම වලේ හරක්ද ලැගුම් ගන්නා බව දන්වන ලදි.

**ගරු සභාපතිතුමා-**

මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට එම ස්ථානය පරික්ෂා කර සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට දැනුවත් කිරීමට උපදෙස් ලබා දීම.

**ක්‍රීඩාභූමි භාරකරු-**

ක්‍රීඩා මණ්ඩපයේ ඇති කාමර තුනෙහිම දොරවල් කැඩී ඇති බව හා ලකුණු පුවරුවද දිරාපත්ව ඇති බව දැන්වීම.

**ගරු සභාපතිතුමා-**

ක්රීඩා මණ්ඩපයේ සිදුකළයුතු සියළු ප්රවතිසංස්කරණ කටයුතු සඳහා ඇස්තමේන්තුවක් තාක්ෂණ නිලධාරින්ගෙන් ලබා ගන්නා ලෙසට දැන්වීම හා මේ සඳහා සහයෝගය ලබා දෙන ලෙසට ක්රීකඩා භූමි උපදේශක හා ක්රීඩාභූමි භාරකරුට උපදෙස් ලබා දීම.

**ක්රීඩා භූමි උපදේශක**

කායවර්ධන මධ ස්ථානය සඳහා කැඩපත් මිලදී ගැනීමට අවශ බව දන්වා සිටීම.

**ගරු සභාපතිතුමා-**

සැපයුම් නිලධාරි මගින් මිල ගනන් කැඳවා අදාළ කාර්ය සිදුකරගන්නා ලෙසට දැන්වීම.

**ස්තුති කථාව - ලේකම්, භාරත සමරසේකර මහතා**

අද දින තම වටිනා කාලය හා ශ්රමමය කැප කරමින් කමිටුව සඳහා පැමිණි සියළුම මහත්ම මහත්මීන්ට ක්රීඩාවේ දියුණුව වෙනුවෙන් තම අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම වෙනුවෙන් ස්තුතිය පළකරමින් කමිටුවේ වැඩකටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ-

ඩී.වී.තරංගි,

ජර්ජා සංවර්ධන නිලධාරි.

ලේකම්,

අම්බලන්ගොඩ නගර සභාව.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්රදීප් මහතා කතා කරමින්**

මෙහිදී අපි විශේෂ කරුණක් මතු කරනවා. මාදම්පා ගග ආශ්රිත භූමියේ අම්බලන්ගොඩ නගර සභාව මගින් පිහිනුම් තටාකයක් ඉදිකරලා තියෙනවා. එම තටාක භූමිය සහ ඊට අදාළ භූමිය මැණුම් කටයුතු කරළා එය නගර සභා භූමියක් කියලා ප්රාදේශිය ලේකම් කාර්යාලයෙන් පැවරුම් නියෝගයක් ලබා ගැනිමට මිනින්දෝරු සැලැස්මක් සකස් කිරීම වැදගත් කියලා සාකච්ඡා කර සිටියා. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

මේ සදහා වාරිමාර් දෙපාර්තමේන්තුවෙනුත් අවසර ගන්න ඕන නේද?

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්රදීප් මහතා කතා කරමින්**

අපි වාරිමාර්ගෙනුත් අවසරය අරගන්න ඕන. මෙහෙම දෙයක් තියෙනවා අපි මෙතන මේක හදන්න ලක්ෂ 75 ට වැඩි මුදලක් වැය කරලා තියෙනවා. එතකොට මේ භූමිය නිත්‍යානුකූලව සභාව සතු කර ගැනීම වැදගත්. මං මේ සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකතුමත් එක්ක කතා කළා.එතුමා කිව්වේ ඉල්ලීමක් කරන්න එතකොට අපි ඒ අනුමැතිය ලබා දෙන්නම් කියලා.මෙතනදි මුදල් ගෙවීමක් වෙන්නෑ. නමුත් මේ භූමිය සභාව සතු භූමියක් කර ගන්න ඕන.ඒ අනුව වාරි මාර්ග අධ්‍යක්ෂකතුමා සහ වෙරළ සංරක්ෂණ සහ සියලුම අයගේ අනුමැතියෙන් පසුව අපට පැවරුම් නියෝගයක් ලබා ගන්න පුලුවන්.

**ගරු නගර සභා මන්ත්රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

අපි ඕක මුලින් හදද්දි අපි වාරි මාර්ගෙට ගිහිල්ලා අවසරයක් අරගෙන තමයි මේක කළේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒක හරි. දැන් කරගන්න ඕන මේක සභාව සතු භූමියක් බවට ප්‍රකාශයට පත් කරගන්න එක.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

මගේ අදහස මේක මැණුම් කරන්න කලින් අවසර ලබා ගත්තනම් හරි.ඒක ලිඛිතව ලබා ගන්න. වාචිකව නෙවෙයි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි සාකච්ඡා කළා.ඉල්ලීමක් කරන්න කියලා කිව්වා. පැවරුම් නියෝගයක් ලබා ගැනීම ඉතාම වැදගත්. නැතිනම් කවුරු හරි ඇවිත් වෙන දෙයක් කළත් අපට ප්‍රශ්නයක් වෙනවනේ. මොකද ඔය වගේම වාරිමාර්ග අධ්‍යක්ෂකගෙන් අවසරයක් අරගෙන වෙන කෙනෙකුටත් එන්න පුලුවන්.රට හොඳයි නගර සභාවට පැවරුම් නියෝගයක් ලබා ගන්න එක.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

නෑ එහෙම වෙන කෙනෙකුට දෙන එකක් නෑ. රජයේ ආයතනයක් නිසා තමයි අපටත් එදා දුන්නේ.

**ඒ අනුව 2014 -10- 23 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

☞ **පෙ. ව. 10.56 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය සභාවට පැමිණෙන ලදී.**

**6: 4** **2014- 10- 28** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සංවර්ධන උපදේශන කාරක සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම් . ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාව

සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව

දිනය - 2014.10.28

වේලාව - ප.ව. 2.30

ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

පැමිණීම

12. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතාසභාපති , නගර සභාව ,අම්බලන්ගොඩ.
13. එච්.එල්.අනුර කිත්සිරි මහතා - නගර සභා මන්ත්‍රී,නගර සභාව,අම්බලන්ගොඩ
14. භාරත සමරසේකර මහතා -ලේකම්, නගර සභාව අම්බලන්ගොඩ.
15. ඩී.ඩබ්.පත්මසිරි මහතා - ගණකාධිකාරී , නගර සභාව.අම්බල්නගොඩ.
16. ඩී.කේ.වරුෂවිතාන මහතා - සංවර්ධන උපදේශක කමිටු සාමාජික ප්‍ර ජා නියෝජිත
17. ජී.ඩබ්. ගුණසිරි මහතා - සංවර්ධන උපදේශක කමිටු සාමාජික ප්‍රපජා නියෝජිත
18. ඩී.වාසනා තරංගී මිය - ප්‍රපජා සංවර්ධන නිලධාරී,නගර සභාව , අම්බල්නගොඩ.
19. එම්.ජී.ආර්.පුෂ්පකුමාර මහතා - සංවර්ධන සහකාර, නගර සභාව , අම්බලන්ගොඩ.
20. එස්.ජී.සජීවනී මිය - තාක්ෂන නිලධාරී , නගර සභාව , අම්බලන්ගොඩ.
21. බර්ටි රණසූරිය මහතා - පෝරඹ, උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
22. අනිල් කෝලිත මහතා - උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියොජිත
23. එච්.මහින්දසේන මහතා - ඕකන්ද, උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
24. ජී.කුසුම් ද සිල්වා මිය - කළමණාකරන සහකාර - ආදායම් අංශ ප්‍රෝධානි

25. ජී.ජී.ඉල්ෂා මිය - ආදායම් පරීක්ෂක , නගර සභාව ,අම්බලන්ගොඩ

ගරු සභාපති නීතිඥ ඇම් .ඩබ්.අරුණ ප්ර-දීප් මහතා විසින් පැමිණ සිටි සියළු දෙනා පිළිගනිමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි . 2014 වර්ෂයේ ඉටුකරන ලද කර්මාන්ත වල ප්රතගතිය සළකා බැලීමටත් ප්ර්ජා මණ්ඩල වල අදහස් අයවැය සඳහා ලබා ගැනීමත් , අද දින සාකච්ඡාව පැවැත්වීමේ අරමුණ බවත් අදහස් දක්වමින් ගරු සභාපති තුමා විසින් රැස්වීමේ අරමු ණ පැහැදිළි කරන ලදි. මෙහි දී ඉටු කරන ලද කර්මාන්ත පිළිබඳව වර්තමාන ප්රපගතිකමිටු සාමිජිකයන් වෙත ඉදිරිපත් කරන ලද අතර, මෙම රැස්වීමට ප්රා දේශීශල්කම් කාර්යාලය මගින් ඉටුකරනු ලබන ජාතික සවිය වැඩසටහන යටතේ ඉටු කරනු ලබන කරමාන්ත පිළිබඳ විස්තර ද ඉදිරිපත් කරන ලෙස සභාපති තුමා විසින් කර්මාන්ත අංශයට උපදෙස් ලබා දෙන ලදි. එසේම මේ වන විට ඉටු කරනු ලබන කර්මාන්ත වල වැඩ පිළිබඳව සොයා බලන ලෙස තාක්ෂන සේවා නිලධාරීට උපදෙස් ලබා දෙන ලදි.

පහත සඳහන් පරිදි කර්මාන්ත වල ප්රිගතියකමිටුවට ඉදිරිපත් කරමින් එක් එක් කර්මාන්තය පිළිබඳව සාකච්ඡා කරන ලදි.

**අම්බලන්ගොඩ නගර සභාව**

**සංවර්ධන වැඩසටහන් වාර්තාව - ( 2014-10-15 දිනට)**

**පළාත් නිශ්චිත සංවර්ධන වැඩසටහන - 2014-10-14**

| කර්මාන්තයේ නම | ඇස්තමේන්තු වටිනාකම රු. | අනුමත මුදල | 2014 -10-15 දිනට ප්‍රගතිය |
|---|---|---|---|
| පටබැඳිමුල්ල ජල කරාමය අසල සිට මුහුදු වෙරළ දක්වා ඇති මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම. | 6416663.12 | 425000.00 | 100% (වැඩ අවසන්) |
| හල්වතුර නිවාස යෝජනා ක්‍රමයේ හරස් පාර ප්‍රතිසංස්කරණය කිරීම. | 800000.00 | 450000.00 | 100% (වැඩ අවසන්) |
| ධීරක්කන්ද පාර ප්‍රතිසංස්කරණය කිරීම. | 785000.00 | 825000.00 | - |
| පෝය සීමාව පාර පැති කාණු පද්ධතියේ කොන්ක්‍රීට් කිරීම. | 400000.00 | 400000.00 | - |

**වර්ධන වැඩසටහන** - 2013 (අවිච්ඡේද)

| කර්මාන්තයේ නම | අනුමත මුදල - රු. | 2014-10-15 දිනට ප්‍රගතිය |
|---|---|---|
| තල්ගස්ගොඩ පුංචි පාළම අසල සිට මහ පාළම දක්වා මාර්ගය අයිනේ එක් පැත්තක ශරීර සුවතා මංතිරුවක් ඉදිකිරීම. | 3000000.00 | 90% |

| කර්මාන්තයේ නම | ඇස්තමේන්තුගත මුදල රු. | ප්‍රගතිය |
|---|---|---|
| පනියන්දූව පාරේ මානාන ක්‍රිඩා පිටිය අසල ඇති බෝක්කුව නවීකරණය කිරීම. | 6385000.00 | පළාත් පාලන සහකාර කොමසාරිස් මගින් පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |

**පෝරඹ ප්‍රා.ස.මිටු නියෝජිත බර්ටි රණසූරිය මහතා අදහස් දක්වමින්**

නගර සභාව තුල ඇති කර්මාන්ත නගර සභාවට ඉටුකිරීමට සදාචාරාත්මක අයිතියක් ඇති බවත්, එසේ නොවීම අසාධාරණයක් බවත් ප්‍රකාශ කරන ලදි. එසේම වැඩිදුරටත් අදහස් දක්වමින් කියා සිටියේ පාළු වත්ත පාර තාර දැමීම සඳහා ලක්ෂ 10 ක් වෙන්කර ඇතත්, එම මාර්ගයේ තාර දැමීමට අවශ්‍ය කානු නැති බවත් එහි කාණු සකස් කිරීමට අවශ්‍ය බවත් ඒ සඳහා දැනීමේ හැටියට ලක්ෂ 3 ක් පමණ වැය කිරීමට සිදු වන බවත්, නගර සභාව මගින් මෙම කර්මාන්ත ඉටුකරන්නේ නම් මෙවැනි ගැටළු ඇති වනාවන බවත්ය. මේ සමබන්ධයෙන් ප්‍රාමදේශීය ලේකම් දැනුවත් කිරීමට තීරණය විය.

**ප්‍රා.ස.මිටු නියෝජිත අනිල් මහතා අදහස් දක්වමින්**

ප්‍රාවදේශීය ලේකම් කාරයාලය මගින් මාර්ග සංවර්ධනය කිරීමේ දී විශාල වශයෙන් ගැටළු පවතින බවත් , මේ සම්බන්ධයෙන් කිසියම් ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රිගයාත්මකළ යුතු යැයි ද ප්‍රාකාශ කරන ලදි.

**ප්‍රා.ස.මිටු නියෝජිත වරුෂවිතාන මහතා අදහස් දක්වමින්**

කළුවඩුමුල්ල කොට්ඨාශයේ කර්මාන්ත සඳහා රු.ලක්ෂ 10 ක වැඩ කිරීමට පසුගිය වර නොහැකි වූ බවත්, මෙවර කර්මාන්ත ඉටුකිරීම සඳහා සංවර්ධන සමිතියට උපදෙස් දුන් බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපති නීතිඥ ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රාදීප් මහතා අදහස් දක්වමින්** කිරිපට්ටිය පාර වතුර පිරී ඇති බවත් එම මාර්ගය ඉක්මනින් සකස් කරීමට කටයුතු කරන ලෙසත් තාක්ෂන සේවා නිලධාරි වෙත උපදෙස් ලබා දෙන ලදි.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.එල් අනුර කිත්සිර මහතා අදහස් දක්වමින් ,** යාල දූව මාර්ගයේ දෙපස පස් දමා සකස් කරන ලෙස දැණුම් දුන් අතර එම මාර්ගයේ පස් දැමීම සඳහා ප්‍රා දේශීය ලේකම් දැනුවත් කර ඇති බව තාක්ෂන සේවා නිලධාරී දැනුම් දෙන ලදි.

**පලා දූව පාර පිළිබඳව බර්ටි රණසූරිය මහතා විසින් විමසා සිටි** අතර තාක්ෂණ සේවා නිලධාරී විසින් පිළිතුරු ලබා දෙමින් කියා සිටියේ එම මාර්ගයේ අවසාන නිවසේ අය විසින් පාර සකස් කිරීමට ඉඩ නොදුන් බවත්, ගෙන යන ලද දූවියි නැවතත් රැගෙන ආ බවත්ය. මෙවැනි අවස්ථා වලදී ප්‍රා.ස නියෝජිතයන් දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙස සභාපති තුමා විසින් තාක්ෂන සේවා නිලධාරීට උපදෙස් ලබා දෙන ලදි. සභාපති තුමා මෙහි දී වැඩිදුරටත් ප්‍රකාශ කළේ ජනතාවගෙන් ලබා ගන්නා ලද යෝජනා ක්‍රියාත්මක කිරීමට සියළු දෙනාම කටයුතු කළ යුතු බවය.

**ගරු සභාපති නීතිඥ එම්.ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා අදහස් දක්වමින්**

රජය විසින් සභාවේ සේවය කරන සියළු ස්ථිර කාර්යය මණ්ඩලය වෙත වැටුප් ගෙවීමට මුදල් පළාත් සභාවට ලබා දුන්නද දකුණු පළාත් සභාව විසින් පසුගිය කාලය තුල වරින් වර ලැබිය යුතු මුදල් අඩුවෙන් ප්‍රතිපූරණය කළ බවත් , එබැවින් යම් මට්ටමක මූල්‍ය අර්බුදයකට ලක් වෙමින් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදි. මේ සම්බන්ධයෙන් අදාල අංශ දැනුවත් කර ඇති බවත් ඉදිරියේ දී මේ පිළිබඳව අවධානයෙන් සිටින බවත් දැනුම් දෙන ලදි.

එසේම 2015 අයවැය සකස් කිරීම සඳහා සියළුම කොට්ඨාශ වලින් අදහස් ලබා ගැනීම සඳහා රැස්වීම් පවත්වන ලෙසත් ඒ පිළිබඳව සභාවේ ගරු මන්ත්‍රීවරු දැනුවත් කරන ලෙසත්, ජනතාව දැනුවත් කිරීම සඳහා පෝස්ටර් සහ

ශබ්ද විකාශන යන්ත්‍රසාදා ගන්නා ලෙසත් , ජනතාව දරනුවත් කිරීම සඳහා ඉටු කරන ලද වැඩ පිළිබඳව ඉදිරිපත් කිරීම් කරන ලෙසත් , සියළු රැස්වීම් ලබන සතියේ පැවැත්වීමට කටයුතු කරන ලෙසත් දැනුම් දෙන ලදි.

**ගණකාධිකාරී ඩී.ඩබ්.පත්මසිරි මහතා විසින් ප්‍රකකාකර සිටියේ** 2015 අයවැය සඳහා ලේකම්වරයාගේ ප්‍රාධානත්වයෙන් 2014.10.29 දින මූලික සකච්ඡාවක් අදාල සියළු නිලධාරීන් සමග පවත්වන බවත්, ඉන් අනතුරුව සභාපති තුමා හා ගරු මන්ත්‍රීතුන් සමග සාකච්ඡා සඳහා සූදානම් බවය.

ගරු නගර සභා මන්ත්‍රීඩබ්.එල්.අනුර කිත්සිරි මහතා විසින් ස්තුති කථාව කරමින් අද දින මෙම රැස්වීම සඳහා කාලය කැප කරමින් මෙහි පැමිණි ප්‍රගතියෝජිත මහත්ම මහත්මීන් වෙත ස්තුතිය ප්‍රකාශ කළ අතර ගරු සභාපති තුමා හා සියළු කාර්යය මණ්ඩලයටත් ස්තුතිය ප්‍රීකාශකරන ලදි. ඉන් අනතුරුව රැස්වීමේ කටයුතු අවසන් විය.

සකස් කළේ : එම්.ජී.ආර්. පුෂ්පකුමාර

සංවර්ධන සහකාර

| | |
|---|---|
| ලේකම් | නීතිඥ ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍ර.දීප් |
| අම්බලන්ගොඩ නගර සභාව | සභාපති |
| | නගර සභාව අම්බලන්ගොඩ |

**ඒ අනුව 2014 -10- 28 දින පවත්වන ලද සංවර්ධන උපදේශන කාරක සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 5** **2014- 10- 17** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම් . ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් මහතා මුලාසනය දැරූ 2014/10/17 දින පුස්තකාල කමිටු වාර්තාව.</u>**

| | |
|---|---|
| ■ භාරත සමරසේකර මහතා | (ලේකම්,නගර සභාව අම්බලන්ගොඩ ) |
| ■ කේ.ඩබ්. රංජනී මානෙල් මෙනවිය | (පුස්තකාලයාධිපතිනි) |
| ■ ඩී.වී. වාසනා තරංගි මිය | (ප්‍රජා සංවර්ධන නිලධාරිනි) |
| ■ හර්බට් වීරක්කොඩි මහතා | (කමිටු සාමාජික) |
| ■ සිරිපාල මාදුවගේ මහතා | ( කමිටු සාමාජික ) |
| ■ ටී.ඩබ්. පියසිරි මහතා | (කමිටු සාමාජික) |
| ■ ටී.ඩබ්ලිව්. හරිස්චන්ද්‍ර මහතා | (කමිටු සාමාජික) |
| ■ පී.ඩබ්. ගුණසිරි මහතා | (කමිටු සාමාජික) |
| ■ එන්.එච්. ඩන්කන් ද සිල්වා මහතා | (කමිටු සාමාජික) |
| ■ සුගත් හෙට්ටිආරච්චි මහතා | (කමිටු සාමාජික) |
| ■ පී.එච්.එල්. පියන්ති මෙනවිය | (පුස්තකාල සාහායිකා) |
| ■ ජ්.ඩබ්. ඉන්ද්‍රදාස මහතා | (පුස්තකාල සාහායක) |
| ■ ගෞරි වර්සවිතාන මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ ජ්.පී. රසිකා මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ එම්.ඩබ්.ජේ. සුමංගලි මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ ජ්.පී. ලක්ෂ්මි පෙරේරා මෙනවිය | (පුස්තකාල සාහායිකා) |
| ■ එස්. සුසිලා දීපානි මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ මාලති සමන්තා ආරියසිංහ මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ කේ.ජ්. විසුද්ධි රේණුකා මිය | (පුස්තකාල සාහායිකා) |

ගරු සභාපතිතුමා රාජකාරී අවශ්‍යතාවයක් සඳහා බැහැර ගොස් ඇති බැවින් ලේකම් මහතා කමිටුවට පැමිණි මහත්ම මහත්මීන් පිළිගැනීමෙන් පසු එදින ප.ව 2.30ට සභාවේ වැඩ ආරම්භ කළේය.

■ **පුස්තකාල ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම පළමුව සිදුවිය.**

ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපතිනිය විසින් ඉදිරිපත් කරන ලදි. අනෙකුත් ශාඛා පුස්තකාලවල ප්‍රගති වාර්තා ඒ ඒ ශාඛා භාර පුස්තකාල සාහායිකාවන් ද, විද්‍යුත් පුස්තකාලයේ වාර්තාව ප්‍රධාන පුස්තකාලයේ සාහායිකා පියන්ති මෙනවිය විසින් ද, ඉදිරිපත් කරන ලදි.

■ ජාතික කියවීම් මාසයේ උත්සවය ගැන කමිටු නිලධාරී මහතුන් විසින් විස්තර විමසන ලදි. කමිටු සාමාජික සිරිපාල මාදුවගේ මහතා ආරාධනා පත්‍ර ගැන ප්‍රජා සංවර්ධන නිලධාරිනියගෙන් විමසුවේය. සක්වා ප්‍රින්ටස් ආයතනයෙන් එම මුද්‍රිත ආරාධනා පත්‍ර සවසට ලැබෙන බව එතුමිය පැවසුවාය. කමිටු සාමාජික හර්බට් වීරක්කොඩි මහතා වේදිකාව සරසන ආකාරය ගැන ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියගෙන් විමසුවේය. ගිය සතියේ දිනයක දේශක මහතා පැමිණ වේදිකාව සරසන ආකාරය ගැන ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය දැනුවත් කළබැව් පැවසුවාය. ආරාධිත අමුත්තන් පිළිගැනීම ප්‍රධාන පුස්තකාලය අසල සුදුසු බැව් කමිටු නිලධාරී මහත්වරු පැවසුහ.

■ ප්‍රධාන පුස්තකාලයට හා හෙප්පුමුල්ල ශාඛාවට ඉල්ලා ඇති විදුලි පංකා සවිකිරීමට තාඬණික නිලධාරී මහතුන්ගේ අනු දැනුම ලබාගත යුතුබව ලේකම් මහතා විසින් පුස්තකාලයාධිපතිනිය දැනුවත් කළේය. කමිටු සාමාජික ඩන්කන් මහතා පැවසුයේ කෙරමිණිය පුස්තකාලයේ නාම පුවරුව නවීකරණය කර නොමැති බවයි. භාෂා 3ම ඇතුළත්ව දැන්වීම් පුවරුව සකස් කිරීමේදී පෙර පාසල් සමග යාබදව තිබෙන පුස්තකාලවල නම්ද යොදනවිට ඒ සඳහා විශාල ඉඩ කඩක් යන බැව් සක්වා ප්‍රින්ටස් ආයතනයෙන් පැවසු බැව් ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය පැවසුවාය. පුස්තකාල නාමපුවරු ප්‍රමාද වුයේ ඒ නිසා බැව් ප්‍රජා සංවර්ධන නිලධාරිනිය කමිටුව දැනුවත් කළාය. පුස්තකාලයේ නම වෙනමත් පෙර පාසල්වල නම් වෙනමත් සඳහන් කොට නාම පුවරුව සැදීමට ලේකම් මහතා ගත් තීරණයට කමිටු මහතුන් ද කැමැත්ත ප්‍රකාශ කළේය.

■ පාඨක අදහස් පොත් බැලීමෙන් පසු ලේකම් මහතා විසින් ප්‍රධාන පුස්තකාලයට ඉල්ලා ඇති ග්‍රන්ථ 2ක් ලබාගන්නා ලෙස පුස්තකාලයාධිපතිනියට පැවසුවේය. චම්පික රණවක මහතා විසින් රචිත"බලය සහ බලය" හා "මගේ ජීවිතේ කලාව හා කවිය" මීමන ප්‍රේමතිලක ශූරීන් ගේ එම ග්‍රන්ථ 2ක පුස්තකාලයට ගැනීමට තීරණය විය.

■ කෙරමිණිය ශාඛා පුස්තකාලය දිවා ආහාරය සඳහා නොවසා සවස 5.00 ට වැසීමට පාඨක පිරිස ඉල්ලා ඇති බැව් ලේකම් මහතා කමිටුව දැනුවත් කළේය. කමිටු මහතුන් කියා සිටියේ සෑම ශාඛා පුස්තකාලයකටම සම්මත වේලාවක් තිබීම අත්‍යාවශ්‍ය බවයි. පාඨකයින් එම ඉල්ලීමට ඉඩ නොදිය යුතු බවත් කැමට වේලාවක් තිබීම එම නිලධාරියාගේ අයිතිවාසිකම බවත් කමිටු නිලධාරී මහත්වරු පැවසුහ.

■ වාසනා ප්‍රකාශකයෝ විසින් නගර ශාලාව දින 6 ක් නොමිලේ ලබාදීම වෙනුවෙන් රු.50000 වටිනා පොත් පුස්තකාලයට ලබාදෙන බව ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය පැවසුවාය. එම පොත් තෝරා ගැනීමට කමිටු සාමාජික මහතුන්ගේ අනුග්‍රහය ඇතිව පුස්තකාල ශාඛා සාහායිකාවන් එකතුව පොත් තෝරා ගැනීමට යන බැවින් කමිටුවේ වැඩ කටයුතු අවසන් කිරීමට පළමුව ස්තුති කථාව සඳහා ලේකම් මහතා විසින් ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියට ආරාධනා කළේය. එහිදී එතුමිය ස්වේච්ඡාවෙන් කමිටුවට පැමිණි සියලුම මහත්ම මහත්මීන්ට ස්තුතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ අවසන් කළේය.

.......................................

කමිටු ලේකම්,

නගර සභාව අම්බලන්ගොඩ.

.......................................                .......................................

ලේකම්, අත්සන් කළේ සභාපති,

නගර සභාව අම්බලන්ගොඩ. නගර සභාව අම්බලන්ගොඩ

**ඒ අනුව 2014 .10- 17 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 6** **2014- 10- 27** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම් . ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>පරිසර සෞඛ්‍ය; හා සනීපාරක්ෂක කමිටුව</u>**

**<u>2014.10.27</u>**

**<u>සහභාගීත්වය</u>**

| | | |
|---|---|---|
| 01 | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් | ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව. |
| 02 | පී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ. නගර සභාව |
| 03 | ජේ.ඩබ්.හාෂිනි විජ්සූරිය මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව |
| 04 | භාරත සමරසේකර | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව |
| 05 | එස්.නිර්මලා ද සිල්වා | ප්‍රධාන කළමණාකරණ සහකාර |
| 06 | එම්.පී.බී.ඩබ්.යු.කුමාරි | ආයුර්වේද වෛද්‍ය නිළදාරිනී |
| 07 | කේ.සී.කපිල කුමාර මහතා | උප පොලිස් පරික්ෂක, අම්බලන්ගොඩ පොලිසිය. |
| 08 | එච්.නයනා චාන්දනී | සංවර්ධනසම්බන්ධීකාරක.ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අම්බලන්ගොඩ. |
| 09 | එම්.මලිත් ප්‍රදනාන්දු මහතා | තාක්ෂණ සේවා නිලධාරනි, නගර සභාව. |
| 10 | පි.එස්.එස්.ද.සිල්වා | ම.සෞ.පරීක්ෂක, අම්බලන්ගොඩ නගර සභාව. |
| 11 | එල්.එච්.මංජුල මහතා | බරවා මර්ධන ඒකකය අම්බලන්ගොඩ. |
| 12 | එච්.ටී.ද. සිල්වා | ග්‍රාකම නිලධාරී 87 ඊ ඕකන්ද. |
| 13 | එච්.කේ.ඩබ්.ගුණසේකර | ග්‍රාකම නිලධාරී 88 ඒ හෙප්පුමුල්ල |
| 14 | එම්.එච්.ආශා | ග්‍රාගම නිලධාරිනී අම්බලන්ගොඩ. |
| 15 | ඕ.සජිතා දිශානී | ග්‍රා.ම නිලධාරී 86 බී කෙරමිණිය. |
| 16 | ඒ.ඉරෝෂා මධුමලි | ග්‍රාරම නිලධාරී 86 ඩී තල්ගස්ගොඩ. |
| 17 | වීටා.ආර්.ගාල්ලගේ | ග්‍රාම නිලධාරී 83 කරිත්තකන්ද. |
| 18 | ජී.එම්.මනෝරිද සිල්වා | ග්‍රාම නිලධාරී 84 විලේගොඩ. |
| 19 | ඒ.කේ.කාන්ති ද සිල්වා | ග්‍රාම නිලධාරී 86 සී පෝරඹ. |
| 20 | පී.එච්.කුමාර ද සිල්වා | ග්‍රාම නිලධාරී 86 ඒ.කලුවඩුමුල්ල |
| 21 | පී.එච්.එල්.සී.පුෂ්පරාණි | සංවර්ධන සහකාර, අම්බලන්ගොඩ නගර සභාව |
| 22 | ආර්.සුසිලා නන්දනි | කළමණාකරණ සහකාර අම්බලන්ගොඩ නගර සභාව |

**පිළිගැනීම.**

ගරු සභාපති ඇම් .ඩබ්.අරුණ ප්‍ර දීප් මහතා සෞඛ්‍යහ හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි සිටි ගරු නගර සභා මන්ත්‍රීප දෙපල ඇතුළු සියලු නිලධාරී මහත්ම මහත්මීන් නගර සභා කාර්ය මණ්ඩලයත් ඉතා ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි.

2014.09.23 දින පැවති රැසිවීමේ සාකච්ඡා වු කරුණු සමාලෝචනය.

| මාතෘකාව | සාකච්ජා වු කරුණු | ප්‍රවකාශනය කවුරුන් විසින්ද යන වග | තීරණය |
|---|---|---|---|
| කසල අවසන් බැහැරලන ස්ථානයට ප්‍රවේශ මාර්ගය පස් දමා සකස් කිරීම | මේ පිළිබඳව කාර්මික නිලධාරී මලිත් මහතාගෙන් විමසීම් සිදු කිරීමෙන් පසු ඉටු කිරීමට ඇති අපහසුතාවයන් විමසීමට භාජනය වීම | ගරු සභාපති ඇම් .ඩබ්.අරුණ ප්‍ර දීප් මහතා | |
| | ප්‍ර වේශ මාර්ගය සඳහා කොරිපස් හා කසල තුනි කිරීම සඳහා පස් කියුබ් 500 ක් අවශ්‍යම බවත්,කළින් වතාවේ පස් දැමීම සඳහා ගෙවිය යුතු මුදලින් අඩක් ගෙවා ඇති බැවින් නැවත් පස් ලබා ගැනීමේ දුෂ්කරතා පවතින බව. | කාර්මික නිලධාරී මලිත් ප්‍ර නාන්දු මහතා. | |
| | පස් සඳහා ගෙවිය යුතු මුදලින් කොටසක් ගෙවා ඇති බවත්,ඉතිරි මුදල ගෙවීමට ප්‍රමුඛතාව දිය හැකි බව | ගණකාධිකාරි මහතා. | |
| වාර්ෂික උපත් සංඛ්‍යාබ ලේඛන ලේඛන ගත කළ යුතු බව | දත්ත ලබා ගැනීමට ලිපියකින් ඒ පිළිබඳ දැනුම් දී ඇති බවත් ,පසුගිය කාල සීමාව තුළ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ වැඩ වර්ජනය පැවති නිසා තොරතුරු ලබා දීමේ ප්‍රවමාදයක් පවතින බව. | ගරු සභාපති ඇම් .ඩබ්.අරුණ ප්‍ර දීප් මහතා | |
| සුනඛ වන්ද්‍යඇකරණ කටයුතු සඳහා පසු වෛද්‍යු වරයකුගෙන් සහය ලබා ගැනීම. | මේ පිළිබඳව අම්බලන්ගොඩ පශු වෛද්‍යළ කාර්යාලයෙන් සේවය ඉල්ලා ඇත. | කලමණාකරන සහකාර ආර්.සුසිලා නන්දනී | |
| ලොන්ඩ්රි. ජලය බැහැර කිරීම | තමා මෙම ස්ථානය පර්ක්ෂා කල බවත්,අප ජලය නියමිත පරිදි බැහැර කිරීම සිදුවන බව. | මහජන සෞඛ්‍යව පරීක්ෂක පීඑස්. එස්. ද සිල්වා මහතා | |
| පටබැඳිමුල්ල ඕකඩ ඇළ කාණු පද්ධතිය පිරිසිදු කිරීම | මෙහිදි කාණු පද්ධතිය ආවරණය කර ඇති ලැලි ඉවත් කිරීම අනිවාරියෙන්ම සිදු කළ යුතු බවත් ඒ පිළිබඳ දිගින් දිගටම පරීක්ෂාව සිදු කළ යුතු බවත් | ගරු සභාපති එම් .ඩබ්.අරුණ ප්‍රරදී මහතා. | |
| ආයුර්වේද වෛද්‍ය තුමිය හරහා ගැබිණි මව්වරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රිමයාත්ම කිරීම | ගර්භනී මව්වරුන් සායන සඳහා සම්බන්ධ කර ගැනීම සඳහා යොදා ගත යුතු උපක්‍ර ම පිළිබඳව අවධානය යොමු කළ යුතු බව. | ගරු සභාපති එම් .ඩබ්.අරුණ ප්‍රිදීප් මහතා. | |
| | බටහිර වෛද්‍යඑ ක්‍රබමය හා ආයුර්වේද ක්‍රිමය පරස්පර විරෝධි අදහස් පවතින බැවින් මෙම කාර්ය ඉටු කිරීම තරමක් අපහසු බවත් මව්වරුන් යොමු කර ගැනීමේ ක්‍රමමවේදයක අවශ්‍යේතාව | | |

| | | | |
|---|---|---|---|
| | පවතින බව. ඖෂධ පැළැටි වගා කිරීමට කොම්පෝස්ට් පොහොර අවශ්‍යෂ බව | | |
| | මෙම වැඩ පිළිවෙල වාරියපොල ප්‍රාවදේශිය සභාවේ ක්‍රි්යාත්මක වන බැවින් අත්දැකීම් ලබා ගැනීම සඳහා ආයුර්වේද වෛද්‍යමවරිය එහි යැවිය හැකි බව. | ගරු සභාපති එම් .ඩබ්.අරුණ ප්‍ර දීප මහතා. | |
| **අදහස් හා යෝජනා** | | | |
| ට්‍රැ්ක්ටරය ඉක්මණින් අලුත්වැඩියා කර ගැනීමට අවශ්‍යක බව | ට්‍රැමක්ටරයක් අලුත්වැඩියා සඳහා යොමු කර ඇති අතර එය ඉක්මණින් අලුත්වැඩියා කර ගැනීමට අවශ්‍ය් බව. | | |
| | අවශ්‍යව නම් ට්‍රැඅක්ටරයක් කුලියට ලබා ගැනීම සඳහා සභාවේ අනුමැතිය ලබා ගන්න. | ගරු සභාපති එම් .ඩබ්.අරුණ ප්‍ර දීප මහතා. | |
| අනවසරයෙන් පවත්වා ගෙනු යනු ලබන මානිමුල්ල ගරාජය පැමිණිලි පවත්වන බව. | අනවසරයෙන් පවත්වා ගෙන යනු ලබන මානිමුල්ල ගරාජය සම්බන්ධව මහජන පැමිණිලි පවත්වන බව. | මහ අම්බලන්ගොඩ ග්‍රාබම නිලධාරී, එම්.එච්.ආශා මිය. | |
| | කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වා ගෙන යාම සුදුසු නොවන බැවින් එය නිර්දේශ නොකරන බවත් ,වහාම ඉවත් කර ගන්නා ලෙසත් ,මධ්‍යවම පරිසර අධිකාරිය කර්මාන්තකරු වෙත දන්වා යවා ඇති බවත් , නගර සභාව මඟින්ුත් දැනුම් දුන් බවත් ,පවසන ලදි . ලිපි තුනක් යවා නතර නොකලහොත් මධ්‍යම පරිසර අධිකාරිය මඟින් නඩු පවරන බව. | (සංවර්ධන සහකාර පරිසර ) පී .එච්. එල්.සී. පුෂ්පරාණි මිය. | ලිපි තුනක් යවා නතර නොකලහොත් මධ්‍යම පරිසර අධිකාරිය මඟින් නඩු පවරන බව. |
| ඩෙංගු උවදුර සෑම ග්‍රාරම නිළධාරී වසමකම පවතින බව | ඩෙංගු උවදුර සෑම ග්‍රාරම නිළධාරී වසමකම පවතින බවත් , මේ සම්බන්ධයෙන් යම් ක්‍රි,යා මාර්ගයක් ගතයුතු බව. | ගරු නගර සභා මන්ත්‍රීඅජිත් ශ්‍රීි ලාල් ද සිල්වා මහතා | |
| | තැපැල් කාර්යාලයේ කිහිප දෙනෙකු රෝගි වු බවත් මේ වන විට පටබැදිමුල්ල කොට්ඨාශයේ රෝගීන් බොහොමයක් සිටින බවත් වෙරළ අයිනේ ඇති අබලන්වූ බෝට්ටු නිසා ඩෙංගු මදුරුවන් බෝවන බවත් මෙම බෝට්ටු විනාශ කිරීමට ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍යී වාහන ලබා දිය හැකි බවත් පොලිසිය මැදිහත් වී එම බෝට්ටු විනාශ කිරිමට අවශ්‍ය සහය ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කරන ලදි. | | පටබැදිමුල්ල ග්‍රාදම නිලධාරී වසම සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදි ඩෙංගු මර්ධන වැඩසටහනක් ක්‍රිටයාත්මක කිරීම. |
| | නිවෙස් හා ව්‍යායපාරික ස්ථාන අවවාදාත්මක හා ආයාවනාත්මකව දැනුවත් කිරීම සුදුසු බව. | ගරු නගර සභා මන්ත්‍රීඅජිත් ශ්‍රීි ලාල් ද සිල්වා මහතා | |
| | ආඳාදොළ ප්‍රාදේශයේ නිවෙස් | අම්බලන්ගොඩ උප පොලිස් | |

| | | | |
|---|---|---|---|
| | හිමියෙකුට ඩෙංගු මදුරු කීටයන් බෝවන ස්ථානයක් තිබීම හේතුවෙන් නඩුවක් දැමූ බවත් ,ඉදිරියේදි මේ ආකාරයෙන් නඩු පැවරීමට බලාපොරොත්තු වන බව | පරීක්ෂක කේ .සී.කපිල කුමාර මහතා | |
| නගරයේ සිටින හිගන මිනිසුන් පුනරුත්තාපනය කිරීම. | නගරයේ සිටින හිගන මිනිසුන් අල්ලා රිදිගම පුනරුත්තාපන කඳවුරට ගෙන ගොස් දැමීම සඳහා පොලිසියේ සහය ලබා දෙන ලෙස | ගරු සභාපති ඇම් .ඩබ්.අරුණ ප්‍ර දීප් මහතා | |
| හෙප්පුමුල්ල ප්‍රපදේශය වදුරන් නිසා බොහෝ කරදර සිදුවන බව | හෙප්පුමුල්ල ප්‍රරෝදේශයේ වදුරන් නිසා බොහෝ කරදර සිදුවන බවට මහජන පැමිණිලි ලැබෙන බවත් ,කලුවදුරා සංරක්ෂණය කළ යුතු සතෙක් බවත්,තෙත් කලාපීය ප්‍රදේශවල පමණක් ජීවත් වන සතෙක් බව. | හෙප්පුමුල්ල ග්‍රාතම නිලධාරී එච්.කේ.ඩබ්. ගුණසේකර මහතා | වනජීවී කාර්යාලයට මේ පිළිබඳව දැනුම් දීම. |
| ස්තුති කතාව | නගරයේ සෞඛ්‍යද කටයුතු පිළිබඳ සාකච්ජා කෙරෙන මෙම කමිටුව සඳහා පැමිණි සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීධ මණ්ඩලයටත්,රජයේ නිළධාරීන් සියලු දෙනාටත් ස්තුතිය පුදකරන බව. | ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රීහ ලාල් ද සිල්වා මහතා | |
| නිමාව | ප.ව.4.30 | | |

සකස් කළේ ,

පී.එච්.එල්.සී.පුෂ්පරාණි මිය.

(සංවර්ධන සහකාර පරිසර)

ලේකම්,

භාරත සමරසේකර

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

මට හදිසි කටයුත්තක් නිසා එදා කමිටුවට සහභාගී වෙන්න බැරි වුණා. මම ඉල්ලීමක් කළා ඔබතුමාගෙන් ගෝතමී ප්‍රාථමික විද්‍යාලය ළඟින් ඩෙංගු රෝගීන් කිහිපයක් හමුවෙලා තියෙනවා. එනිසා මේ කාණු පිරිසිදු කරලා මේ ස්කෝලේ ළමයි ආරක්ෂා කර දෙන්න කියලා.නමුත් කවුරුත් ඒක බලලා නෑ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැනට ඩෙංගු රෝගීන් හමුවෙච්ච හැම තැනකම අපි දුමායනය කරලා තියෙනවා.ඩෙංගු රෝගීන් කියලා වාර්තාවක් ඕනෑම රෝහලකින් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයට එන්න ඕන.ඒ අනුව අපේ ප්‍රදේශයේ රෝගීන් වාර්තා වුන සෑම තැනකටම දුමායනය සඳහා එක වරකට ඩීසල් ලිටර් 40 පෙට්‍රල් ලිටර් 10 ත් ලබා දෙනවා. ඒ අනුව වාර්තා වුන සෑම ප්‍රදේශයකම දුමායනය කරලා තියෙන්නේ. අපට දෙන්න පුලුවන් තෙල් විතරයි. එම් .ඕ. එච් . එකෙන් තමයි කෙමිකල් එක දෙන්නේ. දැනට ඩෙංගු රෝගය පිළිබඳ බරපතලම තත්වයක් තියෙන්නේ පටබැඳිමුල්ල ග්‍රාමසේවා වසමේ. එනිසා මේ සම්බන්ධයෙන් පටබැඳිමුල්ල ග්‍රාමසේවා වසමේ සියලුම කාණු මේ වන විට සුද්ධ කරලා තියෙන්නේ.ඒ වගේම සියලුම වතු පරීක්ෂා කරලා තියෙනවා.ඒ වගේම දැනට සොයා ගෙන තියෙනවා පටබැඳිමුල්ලේ ඩෙංගු රෝගය ව්‍යාප්ත වෙන්න මුහුදු වෙරලේ තියෙන කැඩුණු බෝට්ටු වල විශාල වශයෙන් වතුර පිරිලා තියෙනවා. ඒවායේ අයිතිකාරයෝ අපි දැනට සොයමින් පවතිනවා. ඒ වගේම සවසට එන බීමත් අය විසින් දාලා යන හිස් කෑන් ,බෝතල් ,වීදුරු විශාල ප්‍රමාණයක් මේ ගල් වැටියේ බැම්ම ඇතුලට වැටිලා තියෙනවා. දැන් රෝගීන් 15 ක් පමණ වාර්තා වෙලා තියෙන නිසා පටබැඳිමුල්ලේ ගම් වාසීන් එකතුවෙලා පාර්සරික සංවිධානයක් වගේ ඇති කරගෙන තියෙනවා. ඔවුන් විසින් කඩහිමියන්ගේ උදවු ඇතිව බෑග් ලබා දීලා වතුර රැඳෙන සියලුම ස්ථාන නිවෙස් වලින් ඉවත් කරලා තියෙනවා. අපට පවතින තවත් ගැටලුවක් තමයි අපි වෙරළ සුද්ධ කළත් මේ වෙරලේ තියෙන සමහරක් කැඩුණු බෝට්ටු ලක්ෂ 100 ක් විතර වටිනවා. මං යුධ හමුදාවෙන් උදවු ඉල්ලුවා කතා කරලා මොකද

මේවා ටික එකතුකරලා ගිනිවත් තියන්න කියලා.තව දෙයක් මම මන්ත්‍රීවරුන්ට කියන්න ඕන. ඩෙංගු වගේ තවත් රෝගයක් පැතිරෙමින් තියෙනවා. ඒක ඩෙංගු නොවෙයි. නමුත් පේට්ලට් එක වැටෙනවා ඩෙංගු වල වගේ.ඒක වෛරස් උණක්.ඉතින් අපට කරන්න පුලුවන් උපරිමය අපි කරලා තියෙන්නේ. විලේගොඩින් වාර්තා වෙලාද කියලා දන්නෑ.වාර්තා වුණානම් දුමායනය කරාවි.අපි මුදල් ලබා දීලා තියෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

කරාපිටියෙන් ඩෙංගු කියලා දවස් 14 ක් නිවාඩු දීලා තියෙනවා වැඩට යන්න එපා කියලා. පියසීලි මිස්ගේ මුණුබුරා , තවත් කිප දෙනෙක්ට හැදිලා තියෙනවා. සමහරු කියන්නෑ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රීතුමා අම්බලන්ගොඩ කෙනෙක් ත්‍රිකුණාමලයේදී ලෙඩවෙලා රෝහලකට ඇතුල් කළත් අනිවාර්යෙන්ම තමන් ඉන්න ප්‍රදේශයට එම වාර්තාව එවනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

අපට එන්නැනේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නෑ. එම්. ඕ. එච්. එකට එවන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

ඒකනේ එම්. ඕ. එච්. එකෙන් කරන්නෙත් අපෙන් තල්ලුවක් තියෙනවනම්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි ඕනෑම අවස්ථාවක තෙල් ගන්න සල්ලි ලබා දෙනවා.අපි අපට කරන්න පුලුවන් සෑම දේම කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

PHI මහත්තයට කියන්න ඕන ගිහින් බලන්න කියලා. ඉස්කෝලේ ඉස්සරහම ගෙදර මනුස්සයටත් හැදුනා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ අවස්ථාවේ MOH කාර්යාලයේ වෙනමම රැස්වීමක් තියෙනවා. PHI මහත්තයා එතන ඉන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

මම PHI මහත්තයාගෙන් අහන්න හිටියේ මෙහෙම තිලකරත්න කියලා කෙනෙක් ආවද කියලා. මෙතන තියෙන බරපතලම දේ තමයි මෙතන ප්‍රජාපතියේ පොඩි ඉස්කෝලේ තියෙන්නේ. මං දැක්කා පත්තරේ දාලා තියෙනවා මොන්ඩිසෝරියක් සති 2ක් වහලා තිබ්බා කියලා පටබැඳිමුල්ලේ. එනිසා කියන්නේ අඩුමගානේ මේ කාණු ටිකවත් සුද්ධකරන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

ලේකම් මහත්තයා PHI මහත්තයාව දැණුවත් කරන්න ඒ සම්බන්ධයෙන්.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

පටබැඳිමුල්ලෙන් විශාල රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වෙලා තියෙනවා.මේ රෝගීන් සම්බන්ධ වාර්තා නගර සභාවේ තියෙනවද? කොපමණ ප්‍රමාණයක් වාර්තා වෙලා තියෙනවද ?

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ වාර්තා නම් තියෙන්නේ PHI මහත්තයාගාව. එතුමාගෙන් නිවරදි දත්ත අරගෙන මං ඔබතුමාලට ලබාදෙන්නම්. කොහොම වුනත් 10 ට වැඩි.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

මං ඔබතුමා කීව දේ සමග එකගයි.පසුගිය දවසක මං බලපිටිය රෝහලට ගිය දවසක දැන ගන්න ලැබුණා වෛරස් උණක් ගැන. ඒ අවස්ථාවෙත් පටබැඳිමුල්ල ප්‍රදේශයේ ඩෙංගු රෝගීන් 10 ක් පමණ රෝහල් ගතවෙලා හිටියා. ඔවුන් අතරින් ස්ථිරවම ඩෙංගු රෝගීන් කියලා හදුනගෙන තිබුණේ කීප දෙනයි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔය පටබැඳිමුල්ලේ ඉන්න අයගෙන් 75 % වෛරස් වුණ හැදුන අය. නමුත් අපේ වගකීම ඩෙංගු රෝගය තුරන් කරන්න වැඩ කරන එක. ඒ වෙනුවෙන් අපට කරන්න පුලුවන් උපරිමය අපි මේ වන විට කරලා තියෙන්නේ.අපේ පාලනයෙන් බැහැරව තියෙන ප්‍රදේශයක් තමයි මුහුදු වෙරළ. උදේ සවස විශාල පිරිසක් මුහුදු වෙරළේ රැදෙනවා. ඔවුන් කන බොන කිසිම දෙයක් ඔවුන් අයින් කරන්නැ .මං පොලිසියේ සහය ඉල්ලා සිටියා මොවුන් අල්ලලා අධිකරණයට ඉදිරිපත් කරන්න කියලා.ඔබතුමත් අපට සහය දක්වන්න මේ බෝට්ටු වල හිමිකාරයන් සොයාගන්න. මං මේ වෙරළ තීරයේ තියෙන වැටකෙයියා ගස් වල පහල කොටසේ අතුත් කපලා ඉවත් කළා විවිධ අපචාර සිදු වෙන නිසා. සන්ඩිල්ලා එක පල්ලෙහා තියෙනවා විශාල බෝට්ටුවක්.ඒවා පුච්චලා විනාශ කරන්න ඕන.මේ වගේ ඒවා විශාල ප්‍රමාණයක් තියෙනවා වරායේ.මේ සියලුම වෛරස් රෝගීන් සහ ඩෙංගු රෝගීන් වාර්තා වෙන්නෙත් මේ වෙරළ තීරයෙන්.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

මේ සදහා හොදම දේ තමයි නාවික හමුදාව. දැනට වෙරළ ආරක්ෂක කටයුතු සිදුකරනවා අම්බලන්ගොඩ ධීවර වරාය ආශ්‍රිතව.ඔවුනුත් ධීවර පරීක්ෂක මහතාත් ධීවර ප්‍රජාවත් සම්බන්ධ කරගෙන නුදුරු දිනයක අපට ශ්‍රම දානයක් වගේ පවත්තන්න සියලුම ප්‍රජාවන් සමග එකතුවෙලා රට සහයෝගය දක්වන්න පුලුවන්.අම්බලන්ගොඩ තානායම් භූමියෙත් දිවා කාලයෙත් රාත්‍රී කාලයෙත් බීලා බියර් කෑන් පවා දාලා ගිහින් තියෙනවා.ඒ සදහාත් පොලිසිය දැනුවත් කරලා දවසට දෙතුන් වතාවක් එතනට යොමු කරන්න පුලුවන් නම් හොදයි. මොකද විශේෂයෙන්ම පිටස්තර ඇල්පිටිය බටපොල වගේ පැතිවල අයත් ඇවිත් මේ තැන් වල බොනවා. මං මේ ළගදිත් දැක්කා.ඒ වගේම වෙරළ උද්‍යානය පැත්තෙත් මුර සංචාරයක් කරන්න පුලුවන් නම් මං හිතන්නෙ මේ උවදුර නැති කරගන්න විශාල දෙයක් කරන්න පුලුවන්. පටබැඳිමුල්ල කාණු පද්ධතිය මෑතකදී සුද්ධ වුන්නැ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නෑ සුද්ධ කළා. සියලුම කාණු සුද්ධ කළා පටබැඳිමුල්ලේ අපේ කර්මාන්ත අංශයේ සහ සෞඛ්‍ය අංශයේ අයව දාලා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

විශාල ස්ලැබ් කෑලි අයින් කරන්න ඕන.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින**

අපි තැන් කිහිපයක් කඩන්න කියලා තීරණය කරලා තියෙනවා. එකක් ඩෙංගු රෝගීන් වාර්තා වුනයි කියලා ලංකාදීප පත්තරෙත් ගිය තැපැල් කන්තෝරුව ඉදිරිපිට. තැපැල් කන්තෝරුවේ අයට ඩෙංගු හැදුනනම් හැදුනේ තැපැල් කන්තෝරුවේ අයගේ වරදින්මයි.මොකද එතැන කිසිම ස්ලැබ් එකක් උස්සන්න බැරිවිදියටයි ස්ලැබ් දාලා තියෙන්නේ. මං තැපැල් ස්ථානාධිපතිටත් කිව්වා මේවා කඩන්න වෙනවා කියලා. එතන කාණුවට වතුර එන්නේ තැපැල් කන්තෝරුවෙන්ම විතරයි.

මොකද එහා පැත්තේ ගෙදර වතුර යන්නේත් ගාල්ල පැත්තට. එනිසා තැපැල් කන්තෝරුව ඉස්සරහ තියෙන වතුර තැපැල් කන්තෝරුවෙන් එන වතුරමයි.ඒ වගේම මහින්ද ප්‍රෙස් එකෙත් ගෙදර ළඟ ස්ලැබ් එක සම්පූර්ණයෙන්ම දාලා. මං එයාලටත් කිව්වා දැන් කඩනවා කියලා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**</u>

සභාපතිතුමණි මං දකින තව දෙයක් තියෙනවා මහ වීදියේ විශේෂයෙන්ම වතුර රැඳෙන්නේ කුණු රොඩු නිසා නෙවෙයි මුහුදු වැලි නිසා. මේ අවමඟුල් කටයුතු වලදී මුහුදු වැලි භාවිතා කරන එක නවත්තන්න ඕන. මං යෝජනා කරනවා සභාවක් විදියට අපි නීතියක් විදියට මේක ගේමු කියලා.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ආදාහනාගාරය වෙන්කරන්න ආවහම අපි ලබා දෙන කොන්දේසි වලින් එකක් මුහුදු වැලි භාවිතා කරන්න එපැයි කියන එක. දැන් දවසට මරණ 3 ක් ගෙනිච්චොත් මුහුදු වැලි ට්‍රැක්ටර් 3ක් පාරේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**</u>

මෙහිදී සඳහන් කරන්න ඕන කර්මාන්න අංශයේ සේවකයින් සහ නිළධාරීන් විශාල මෙහෙයක් ඉටුකරනවා මේ පිරිසිදු කිරීමේ කටයුතු වලදී නගරයේ සෞඛ්‍ය යහපත් අයුරින් පවත්වා ගෙන යන්න.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අද සියලු දෙනාම නාමල් ඇළ සුද්ධ කරන්න යොදවනවා . ඇළවල් ඔක්කොම සුද්ධ කළා. දැන් නාමල් ඇළත් පටබැඳිමුල්ල හරහා බහින නිසා අපි නාමල් ඇළත් අවසානය දක්වා සුද්ධ කැරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**</u>

අපි ඒ සේවය අගයන්න ඕන කර්මාන්න අංශයේ නිළධාරීන් ඇවිත් සෞඛ්‍ය අංශයේ කටයුතු වලට උදවු කිරීම සම්බන්ධයෙන්. මං ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා මේ පිළිබඳ උපේක්ෂාවෙන් වැඩ කරන්න කියලා. මොකද සමහරක් වෙලාවට වැඩ ප්‍රමාද වීමේදී කර්මාන්ත අංශයට ඇඟිල්ල දික් වෙනවා වැඩි.මේ පිළිබඳ අපි අවබෝධයෙන් වැඩ කරන්න ඕන. විශේෂයෙන්ම මේ වගේ වැහි කාල වලදී සෞඛ්‍ය අංශයට වැඩ තනිවම කරගන්න බැරි වෙන කොට කර්මාන්ත අංශයේ අය ඊට යොදා ගන්නවා. එනිසා මම මේ සියලු දෙනත් එක්ක සාකච්ඡා කරලා කියන්නේ වැඩ අංශයත් පස්ස ගහනවා මන්ත්‍රීවරුන්ගෙන් දොස් අහන්න වෙනවා කියලා පාරවල් සුද්ධ නොකලම. නමුත් මේ ව්‍යසනය අවසන් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා මේ දෙපාර්ශවයේම සහය ලබා ගෙන.මේ සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන් දැණුවත් කරන ගමන් මම කර්මාන්ත අංශයට වගේම සෞඛ්‍ය අංශයටත් ස්තුතිවන්ත වෙනවා මේ කරන සේවය පිළිබඳව.

**ඒ අනුව 2014 -10- 27 දින පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්ෂක වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 7** **2014-10- 30** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද නිවාස කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>නිවාස කමිටු වාර්තාව</u>

දිනය :- 2014/10/30

ස්ථානය :- නගර සභාව ,අම්බලන්ගොඩ

වේලාව :- ප.ව.2.30

සහභාගිත්වය:- එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මයා - ගරු සභාපති

ඩබ්.කමල් ද සිල්වා මයා - ගරු උප සභාපති

ආර්.පී.දේව් රෝහාන් මයා - ගරු නගර සභා මන්ත්‍රී%

ජ්.ඩබ්.ජගත් පුෂ්ප කුමාර මයා - ගරු නගර සභා මන්ත්‍රී'

භාරත සමරසේකර මයා - ලේකම්

එස්.නිර්මලා ද සිල්වා මිය - ප්‍රධාන කළ. සහකාර

ජී.කුසුම් ද සිල්වා මිය - ප්‍රධාන කළ.සහකාර ආදායම්

එම්.ඩබ්.ආර්.දිල්රුක්ෂි මිය - සංවර්ධන නිළධාරී

<u>සංශෝධන</u>

2014/07/15 වන දින පැවති නිවාස කමිටු වාර්තාවේ ගොනු අංක 21 ට අදාළව පිටු අංක 10 හි හේවාරාලගේ ප්‍රියන්ත සේනගේ මයා ලෙස මුද්‍රණය වී ඇති නම හේවාරාලලාගේ ප්‍රියන්ත සේනගේ ලෙස 2014/07/16 දින පැවති නිවාස කමිටු වාර්තාවේ ගොනු අංක 38 ට අදළව පිටු අංක 19 හි කොඩිකාර නිමලාවතී ,කොඩිකාර මිත්‍ර ප්‍රේම මයා නමින් ඔප්පුව ලබා දිය යුතු බවට සඳහන් වී ඇති අතර එය කොඩිකාර විමලාවතී , කොඩිකාර මිත්‍ර ප්‍රේම ලෙසද 2014/07/17 දින පැවති නිවාස කමිටු වාර්තාවේ ගොනු අංක 58 ට අදාළව පිටු අංක 43 කාලිංග විජේසිරි මයා නමින් ඔප්පුව ලබා දිය යුතු බවට සඳහන් වී ඇති අතර එය කලුදේව සුනීතා ලෙසද සංශෝධනය විය යුතුය.

<u>**T.H.W. නිවාස**</u>

ලිපිගොනු අංකය :-12

අංක76/12 ,T.H.W. නිවාස,දළුක්කන්ද,අම්බලන්ගොඩ

අයිතිය:- වීරද්දන රවීන්ද්‍රW මනතුංග සොයිසා මයා

01. ධීවර වරාය ඉදිකිරීමේදී කඩා ඉවත් කරන ලද නිවාස 14 සඳහා නිවාස ලබා දීමේදී වීරද්දන රවීන්ද්‍ර මනතුංග සොයිසා මහතාට මෙම ඉඩම ලබා දී ඇති අතර එය 2003/01/07 දින සභාව විසින් අනුමත කර ඇත.

02. 2002 වර්ෂයේ සිට ඉහත ලිපිනයෙහි පදිංචි බවට ග්‍රාදම නිලධාරි විසින් සහතික කර ඇත.

03. අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් එවා ඇති සුනාමියෙන් අවතැන් වූවන් සඳහා නිවාස ලබා දුන් ලේඛනයේ මෙම නිවස වීරද්දන රවීන්ද්‍රේ මනතුංග සොයිසා යනුවෙන් සඳහන් කර ඇත.

04. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් ජලය ලබා ගෙන ඇත්තේ ඩබ්.ආර්.එම්.සොයිසා වශයෙනි. ලංකා විදුලි බල මණ්ඩලයෙන් විදුලිය ලබා ගෙන ඇත්තේ ඩබ්.ආර්.මනතුංග සොයිසා වශයෙනි..

05. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මිනින්දෝරු අධිකාරිතුමාගේ මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක:22 හෙවත් වරිපනම් අංක 76/12 හි මෙම අය පදිංචි වී සිටී.

**<u>තීරණය</u>**

ඉහත කරුණු සලකා බලා මෙම ඉඩමේ ඔප්පුව **"වීරද්දන රවීන්ද්‍රෙ මනතුංග සොයිසාමයාට ලබා දීම** සුදුසු බවට කමිටුව විසින් සභාවට යෝජනා කරනු ලබයි.

## <u>T.H.W. නිවාස</u>

ලිපිගොනු අංකය :-29

අංක76/29 ,T.H.W. නිවාස,දළුක්කන්ද,අම්බලන්ගොඩ

අයිතිය:- මාදුවගේ නිහාල් මයා

01. 2007 වර්ෂයේ සිට මාදුවගේ නිහාල් මයා ඉහත ලිපිනයෙහි පදිංචි බවට ග්‍රාම නිලධාරි විසින් සහතික කර ඇත.

0 2. අම්බලන්ගොඩ ප්‍රාෂදේශීය ලේකම් විසින් එවා ඇති සුනාමියෙන් අවතැන් වූවන් සඳහා නිවාස ලබා දුන් ලේඛනයේ අනු අංක 29 හි මෙම නිවස මාදුවගේ නිහාල් මයා ට ලබා දුන් බවට සඳහන් වේ.

0 3. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් ජලය ලබා ගෙන ඇත්තේ එම්. නිහාල් නමිනි. ලංකා විදුලි බල මණ්ඩලයෙන් විදුලිය ලබා ගෙන ඇත්තේ එම්. නිහාල් නමිනි.

04. ශ්‍රීල ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මිනින්දෝරු අධිකාරිතුමාගේ මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක:46 හෙවත් වරිපනම් අංක 76/29 හි මෙම අය පදිංචි වී සිටී.

**<u>තීරණය</u>**

ඉහත කරුණු සලකා බලා මෙම ඉඩමේ ඔප්පු **"මාදුවගේ නිහාල් "** මයා නමින් ලබා දීම සුදුසු බවට කමිටුව විසින් සභාවට යෝජනා කරනු ලබයි.

ලේකම්

නගර සභාව - අම්බලන්ගොඩ

**ඒ අනුව 2014 -10- 30 දින පවත්වන ලද නිවාස කමටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 8** **2014-10- 30** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද නිවාස විරෝදතා කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**ටී.එච්.ඩබ්. නිවාස විරෝධතා කමිටු තීරණය.**

**සහභාගී වූවන්**

නගර සභා මන්ත්‍රීa ග්‍රේkෂන් කෙරම්ණියගේ මහතා

නගර සභා මන්ත්‍රීa පුෂ්පික ඉන්ද්‍ර ජිත් මහතා

නගර සභා මන්ත්‍රීa පී.සරත් ශ්‍රීමලාල් මහතා

නගර සභා මන්ත්‍රීaනී භාෂිණී විජේසූරිය මහත්මිය

ජී. කුසුම් ද සිල්වා මහත්මිය - ප්‍රණ.ක.ස. ආදායම්

එම්.ඩබ්.ආර්. දිල්රුක්ෂි මහත්මිය - සංවර්ධන නිළධාරී

එච්.ජී.දිළිනි චතුරිකා මහත්මිය - කළමනාකරණ සහකාර

2014.10.21 වන දින ප.ව. 3.00 ට පමණ විරෝධතා කමිටු සාමාජිකයන් හා විරුද්ධකරු වන බෙට්ටි පිලිප්ප්ගේ ලෙස්ලි කපිල හා ඔහුගේ බිරිද ඒ අවස්ථාවට සහභාගී වූ අතර ඔවුන් විසින් එවන ලද විරෝධතාවය ඔවුන් විසින්ම පිළිගත් අතර ඔවුන් විසින් සදහන් කරන ලද දෑ නිවැරදි බව පිළිගන්නා ලදී. ඒ අනුව මන්ත්‍රීනවරුන් සියළු දෙනාම නිවාස ලාභියා ගසා ඇති අත්සන හා පෙත්සම්කරුගේ අත්සන හා සසදා බැලූ අතර එහි බැලූ බැල්මටම පරස්පරතාවක් ඇති බව සියළු දෙනාගේම මතය විය. එනමුත් ඔවුන් විසින් වාචිකව පවසා සිටියේ තවදුරටත් මේ වෙනුවෙන් විරුද්ධ වීමට ඔවුන්ට උවමනාවක් නොමැති බවයි. පසුව එම ප්‍ර කාශය ලිඛිතව ලියවිල්ලක් ලෙස ලබා ගැනීමට යාමේදී විරුද්ධකරු වන බෙට්ටිපිලිප්පුගේ ලෙස්ලි කපිල මහතා අත්සන් කරන්නට යාමේදී ඔහුගේ බිරිද එය වලකන ලදී. ඒ අනුව අපට හැගී යන්නේ මේ තුළ සිවිල් ආරවුලක් ඇති විය හැකි බවත් එම නිසා මෙම විරුද්ධතාවය ලිඛිතව ඉල්ලා අස්කර ගන්නා තුරු මෙම ඔප්පු ප්‍ර දානය තාවකාලිකව නැවැත්වීමට සුදුසු බවයි.

අත්සන් කළේ නගර සභා මන්ත්‍රීල ග්‍රේෙෂන් කෙරම්ණියගේ මහතා

අත්සන් කළේ නගර සභා මන්ත්‍රී් පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා

අත්සන් කළේ නගර සභා මන්ත්‍රී් පී.සරත් ශ්‍රීමලාල් මහතා

අත්සන් කළේ නගර සභා මන්ත්‍රී්නී භාෂිණී විජේසූරිය මහත්මිය

ඉහත විරෝධතා කමිටුවේ තීරණය සභාවට ඉදිරිපත් කිරීම ස දහා අනුමැතියට ඉදිරිපත් කරමි.

ලේකම්

නගර සභාව - අම්බලන්ගොඩ

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ කමිටුවට සහභාගි වෙලා තියෙනවා ග්‍රේෂන් මන්ත්‍රීතුමා , පුෂ්පික මන්ත්‍රීතුමා , සරත් ශ්‍රී ලාල් මන්ත්‍රීතුමා හා භාෂිණී මන්ත්‍රීතුමිය. මේක තාවකාලිකව තහනම් කරන්න කියලා යෝජනා කරලා තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමණි ,මෙහෙමයි විරෝදතාවය ලිඛිතව එවපු කෙනා සහ බිරිඳ මෙතනට සහභාගී වුණා. සහභාගී වෙලා වාචිකව කීවා අපට දැන් විරුද්ධ වෙන්න හේතුවක් නෑ. මෙයාලා අපිව ගනන් ගත්තේ නැති නිසා තමයි අපි විරුද්ධ වුනේ කියලා. ඒ පාර අපේ නිළධාරියා මේ බව සඳහන් කරලා ලිවුම ලියාගන ගියහම අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළා. එතකොට සභාපතිතුමණි අපි සභාව ගැටලුවකට මුහුණ දෙනවා. මොකද ඔවුන් ලිඛිතව දීපු විරෝදතාවය තවම තියෙනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔබතුමාලා ගත්ත තීරණයට මගේ විරෝදතාවයක් නෑ. නමුත් මේකෙදී සිවිල් ආරවුලක් නෑ. මේ ඔප්පුව ප්‍රධානය කරන්නේ අපි. එනිසා මේ ඔප්පුව කාටද දෙන්නෙ කියන එක ප්‍රතිවිරුද්ධ දේවල් ප්‍රතික්ෂේප කරලා ඕන නම් අපට තීරණය කරන්න පුලුවන් . ඔවුන්ටත් බෑ නඩු කියන්න. මොකද ඔවුන්ට මේවයේ අයිතියක් නෑ. අයිතිය තියෙන්නේ අපිට.අපි කමිටුව ඕන තීරණය කරන්න කාටද දෙන්නේ කියලා.ඒ විරුද්ධ වීම මත ඒ ගොල්ලන්ට ඕන නම් පස්සේ උසාවි යන්න පුලුවන් .

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

ඒත් අත්සන් දෙක පරස්පරයිනේ සභාපත්තුමා. අත්සන් දෙක සමාන නම් ඔබතුමා කිව දේ කරන්න පුලුවන්.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අත්සන් දෙක පරස්පර නෑ. අපි බැලුව.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමණි ,මේකෙදී ඔය කපිල කියන පුද්ගලයගේ දූ තමයි අත්සන් දෙක බලලා ගිහින් ඉංග්‍රීසි අකුරු දෙක ඉස්සරහින් දාලා අත්සන් කළේ . නැත්නම් ඔය අත්සන් දෙකම සමානයි. අත්සන් දෙක ඇවිත් බලලා තමයි ඔය දේ කළේ.මේක එයාලගේ පවුල් වල මොකක් හරි ප්‍රශ්ණයක් තියෙනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙතන සිවිල් අරගලයක් නෑ. මේකේ අයිතිකාරය නගර සභාව.නගර සභාව විසින් තීරණයක් ගත්තනම් මෙන්න මෙයාට දෙනවා කියලා කිසියම් තනි පුද්ගලයෙක්ට. අනෙක් කෙනා උසාවි යාවි. එච්චරයිනේ කරන්න තියෙන්නේ. සියලුම මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීමට කියන්නේ. මීට කලින් නිවාස කමිටුවේ හිටියේ මමත් . උප සභාපතිතුමත් ,දේවි මහන්ත්‍රීතුමත්. ජගත් කුමාර මන්ත්‍රීතුමයි. මෙහිදී මෙම නිවාසය ලබා දීලා තියෙන්නේ ඩබ්.සොපි නෝනා නමින්. එතකොට ඩබ්. සොපි නෝනා මිය ගියා 2014 ජනවාරි 19 වෙනිදා.මිය යෑමට ප්‍රථම සොපි නෝනා විසින් ලියලා දීලා තියෙනවා මෙම මාගේ දුව මොනිකාට මෙම නිවාස ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කරනවා කියලා.ඒ වගේම ඇය මිය ගියාට පස්සේ සහෝදරයන් වන කපිල මහතා ග්‍රාම සේවක ඉදිරියට ගිහිල්ලා මෙය මොනිකා මහත්මියට ලබා දීමට විරුද්ධ නැහැ කියලා අත්සන් කරලා ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒකට අකමැති කියලා තමයි මේ ලෙස්ලි කපිල කියන කෙනා ලිපියකින් විරෝදතාවයක් ඉදිරිපත් කරලා තියෙන්නේ.මේ ලිපි වල අත්සන් දෙක සමානයි ඉංග්‍රීසි අකුර හැර.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

අපටත් ප්‍රායෝගිකව මෙය වැටහෙනවා. නමුත් විරෝදතාවය ලිඛිතව තියෙනවනේ. ඒක සාධාරණීයකරණය කරන්න තමයි ලියුම ගන්න හැදුවේ. ඒත් අත්සන් කරන්න බෑ කීවනේ. දෙනවට විරුද්ධව නෙවෙයි අපි මේ කටයුතු කරන්නේ. නගර සභාව නීත්‍යානුකූලව වැරදිකරුවන් නොවන ආකාරයටයි අපිට වැඩ කරන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

කමිටුවේ නිළධාරීන් විසින් ඒ ආකාරයේ තීන්දුවක් දීලා තියෙනව නම් අපි ඒ තීරණය පිළිගමු. නැතිනම් ඒ කමිටුව හැල්ලුවට ලක්වෙනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රිවරුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් තමයි එයාට මේක දෙන්න කියලා තිරණය කළේ. ඒ පාර විරෝදතා කමිටු කැඳවුවා. අපි කලින් කමිටුවේ හිටිය නිසා කලින් කමිටුවේ හිටිය නැති 4 දෙනෙක් පත්කළා විරෝධතා කමිටුවට. ඒ අනුව එතුමාලගේ තිරණය වන්නේ තාවකාලිකව නතර කිරීම. මං කියන්නේ මේක කාට හරි දෙන්න තිරණය කළා නම් හොඳයි කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

නෑ අපි කියන්නේ කපිල මහත්තයාගෙන් මේකට විරුද්ධ නෑ කියලා අත්සන් කරලා ලිපියක් අරන් එන්න. එතකොට මේ ඔප්පුව දෙන්න පුලුවන්නේ. අපි තිරණය දීලා තියෙන්නේ එහෙමයි. බොහොම සුළු දෙයක් තියෙන්නේ. මේ අය සුහදව කපිල මහත්මයා හමුවෙලා විරුද්ධ නෑ කියලා වාචිකව කියලනේ තියෙන්නේ ,ඒක ලිඛිතව අරගෙන ඉදිරිපත් කරන්නයි තියෙන්නේ.

**ඒ අනුව 2014 -10- 21 දින පවත්වන ලද ☐ එච්. ඩබ්. නිවාස වරෝධතා කමටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**(07)** **ටෙන්ඩර් හා මිළගණන්** :-

**7:1** **ටෙන්ඩර්** :- **නැත**

**7:2** **මිල ගණන්** :-

**7:2:1** මිල ගණන් ලැබී නොමැත.

**7:2:2** පරිගණක තින්ත මිලදී ගැනිම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරිගේ නිර්දේශය පරිදි ඉදිරිපත් කර ඇති අවම මිල ගණන් පිළිගැනිමට ගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Tulip Computers | LSJ Computers Center | Omak Technology |
|---|---|---|---|---|---|
| 01 | (1) Canon LBP 6300 dn මුද්‍රකයට තින්ත | 01<br>High<br>Low | <br>23500.00<br>13900.00 | මිල ගණන් ඉදිරිපත් කර නොමැත | මිල ගණන් ඉදිරිපත් කර නොමැත |

**7:2:3** ටයර්, ටියුබ්, සහ රිම් ටේප් සඳහා මිල ගණන් කැඳවන ලද අතර , තාක්ෂණ සේවා නිලධාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සී/ස රජයේ විවිධ නිති ගත සංස්ථාව | සුමිත් ටයර් සර්විස් | ආසිරි ටයර් වර්ක්ස් |
|---|---|---|---|---|---|
| 01 | 500 x 12 ටයර් | 04 | 5300.00 | 5632.00 | මිල ගණන් |
| 02 | 500 x 12 ටියුබ් | 04 | 500.00 | 740.00 | ඉදිරිපත් කර නොමැත |
| 03 | රිම් ටේප් | 04 | නැත | නැත | |

**7:2:4** මිල ගණන් ලැබී නොමැත

**7:2:5** ව්‍යාජ මුදල් හදුනා ගැනීමේ යන්ත්‍රයක් සඳහා මිල ගණන් කැඳවන ලද අතර ගරු මන්ත්‍රීවරුන් පල කරන ලද අදහස් අනුව ලැබී ඇති මිළ ගණන් ප්‍රතික්ෂේප කළ සභාව නැවත මිළ ගණන් කැඳවීමට තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | I.M. Solution (pvt) Ltd | Buisness Machine Co.(pvt) Ltd | Browns & Company PLC | S.S. Labels (pvt) Ltd |
|---|---|---|---|---|---|---|
| 01 | ව්‍යාජ මුදල් හදුනා ගැනීමේ යන්ත්‍රය | 01 | මිල ගණන් ඉදිරිපත් කර නොමැත | 129500.00 | මිල ගණන් ඉදිරිපත් කර නොමැත | මිල ගණන් ඉදිරිපත් කර නොමැත |

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මෙතන ව්‍යාජ මුදල් හඳුනාගැනීමේ යන්ත්‍රයක් ඉල්ලා තියෙන්නේ. මේකට පොඩි යන්ත්‍රයක් තියෙන්නේ.රු. 3000 -4000 ක් වෙන්නේ. ඒකේ වෝටර් සීල් ටික මහ බැංකුවෙන් අරගන්න ඕන. මේ මැෂින් එක තායිවාන් එකක්. එක් ලක්ෂ හතලිසි දාහක් වෙනවා. ඔය බඩුත් එක්කනේ. ඕවම තියෙනවා රොබට් ඒජන්සි ඒකේ රු. 30000-40000 ට ගන්න පුලුවන්. මම දන්න දේ මේ සභාවට කිවේ. නිල් පාට පොඩි මැෂින් එක නෝට්ටු හඳුනාගන්නයි ,කවුන්ටින් වලට වෙනම මැෂින් එකයි ගත්ත නම් හරි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ මැෂින් දෙකම මේකේ තියෙනවද.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මේකෙන් හොර සල්ලි කොලයක් එලියට එන්නෑ කවදාවත්ම. ඒක අත්දැකිමෙන් දැන ගන්න ඕන දෙයක්. එනිසා රට වඩා විශ්වාසයි මහ බැංකුවෙන් වෝටර් සීල් ටික ගෙන්න ගත්තහම මේක ලේසියි. හැම කොලයක්ම අපි පරීක්ෂා කරන්නේත් නැනේ. සැක සහිත කොළයක් විතරනේ අපි බලන්නේ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සරත් මන්ත්‍රීතුමාට මේ පිළිබඳ අත්දැකීම් තියෙන නිසා අපි එතුමා කියන දේ පිළිගනිමු.ඒ කරුණු අනුව මේ ටෙන්ඩරය අපි ප්‍රතික්ෂේප කරනවා.

**7:2:6** මිල ගණන් ලැබී නොමැත

**7:2:7** පෙර පාසල් ළමුන් සදහා පොත් සදහා මිල ගණන් කැඳවන ලද අතර ප්‍රජා සංවර්ධණ නිලධාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සී/ස රජයේ විවිධ නිති ගත සංස්ථාව | ලුමිනෙක්ස් බුක්ෂොප් | චාමර බුක් ෂොප් | රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව |
|---|---|---|---|---|---|---|
| 01 | පිටු 80 තනි රූල් අගල් 01 | 160 | 21.43 | 31.50 | 35.00 | මිල ගණන් |
| 02 | පිටු 80 කොටු රූල් අගල් 01 | 160 | 21.43 | 31.50 | 35.00 | ඉදිරිපත් කර |
| 03 | පිටු 80 තනි රූල් අගල් 1/2 | 198 | 21.43 | 31.50 | 35.00 | නොමැත |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 04 | පිටු 80 කොටු රූල් අගල් 1/2 | 198 | 21.43 | 31.50 | 35.00 | |
| 05 | පිටු 80 රූල් නැති පොත් | 754 | 21.43 | 31.50 | 35.00 | |
| 06 | පිටු 40 සුදු ඩ්‍රොවින් පොත් | 179 | 32.80 | 54.00 | 60.00 | |
| 07 | පිටු 40 කලු ඩ්‍රොවින් පොත් | 179 | 49.32 | 85.50 | - | |

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ පොත් වල සාම්පල් ගෙන්න ගත්තේ නැද්ද? සාම්පල් ගෙන්න ගෙන බලන්න.මොනවගේ පොත්ද දන්නෑනේ.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

පෙර පාසල් සඳහා විතරද සභාපතිතුමා පොත් ලබා දෙන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැනට එහෙම තමයි. කරන්නේ කොහොමද මේ විදියට පඩි ගෙවන කොට.

**7:2:8** මිල ගණන් ලැබී නොමැත.

**7:2:9** ගබඩා භාණ්ඩ සඳහා මිල ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිලධාරී නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඉඳුනිල් හාඩ්වෙයාර් | BKS කම්පැණි | පූර්ණ වෙළඳසැල |
|---|---|---|---|---|---|
| 01 | වඩිම්බු ලෑලි | දි.අඩි.70 | නැත | නැත | නැත |
| 02 | සිවිලිං සීට් | 25 | නැත | 525.00 | නැත |
| 03 | අගල් 2 බිඩින් පටි | 300 | නැත | නැත | 175.00 |
| 04 | අගල් 2 ඇණ (කම්බි) | 21/2 kg | 190.00 | 170.00 | 175.00 |
| 05 | අගල් 3 ඇණ (කම්බි) | 3kg | 190.00 | 170.00 | 175.00 |
| 06 | අගල් 1 ඇණ (කම්බි) | 1kg | 190.00 | 170.00 | 175.00 |

**7:2:10** ආරක්ෂිත ඇඳුම් කට්ටලයක් සඳහා මිල ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිලධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ආදිත්‍ය එන්ටප්‍රයිසස් | තක්ම්බ්‍රිජ් ට්‍රේඩර්ස් | භාග්‍යා ට්‍රේඩර්ස් | ඇමෙක්ස් එන්ටප්‍රයිසස් |
|---|---|---|---|---|---|---|
| 01 | ඕවරෝල් කිට්(Medium) Cotton Cotton Mix | 02 | 1100.00<br>- | 1475.00<br>1200.00 | මිළ ගණන් | මිළ ගණන් |
| 02 | සපත්තු ජෝඩු (Sizag) | 01 | 3500.00 | 2900.00 | ඉදිරිපත් කර | ඉදිරිපත් කර |
| 03 | මුඛ ආවරණ - Ear band Velcro type | 02 | -<br>180.00 | 120.00<br>150.00 | නොමැත | නොමැත |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 04 | අත් ආවරණ කට්ටල | 02 | 375.00 | 225.00 | | |
| 05 | ආරක්ෂිත හිස් වැසුම් | 01 | 800.00 | 925.00 | | |

**7:2:11** පරිගණක මෘදුකාංග සඳහා මිල ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් ටියුලිප් ආයතනයේ මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Tulip Computers | LJS Computers Center | Omak Technology |
|---|---|---|---|---|---|
| 01 | Operating System (2008.1) | | 600.00 | 1100.00 | මිළ ගණන් |
| 02 | Office Package(2010) | | | 100.00 | ඉදිරිපත් කර නොමැත |

**7:2:12** 4 ½ " පුච්චන ලද ගඩොල් සඳහා මිල ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිලධාරී නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් ප්‍රායෝගිකව නොගැලපෙන නිසා නැවත මිල ගණන් කැඳවීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඉදුනිල් හාඩ්වෙයාර් | BKS කම්පැණි | පූර්ණ හාඩ්වෙයාර් |
|---|---|---|---|---|---|
| 01 | 4 ½ " පුච්චන ලද ගඩොල | 50 | නැත | නැත | 20.00 |

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපි මෝඩයෝ වෙනවනේ සභාපතිතුමා මේවට අත්සන් කළාම. මේ පොඩි ගඩොලක් රු. 10.00 වෙන්නේ .

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ලොකු ගඩොල්ද දන්නෑනේ මේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

නෑ නෑ මේ පොඩි ගඩොල් .අගල් 4 ½ කියලා දාලා තියෙනවනේ. මං දෙන්නම් ගල් ටිකක්.

**7:2:13** මිල ගණන් ලැබී නොමැත

**7:2:14** නගර සභා ආපන ශාලාව බදු දීම සඳහා මිල ගණන් කැඳවන ලද අතර ප්‍රධාන ආදායම් කළමණාකාර සහකාරගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් උපරිම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ජක්. ටී. දමිත් වජිර කුමාර | ඔන්. එච්. ජීවන්ති සුරංගිකා |
|---|---|---|---|---|
| 01 | නගර සභා ආපන ශාලාව | 01 | 122000.00 | 141500.00 |

**7:2:15** 252-0730 අංක දරණ කැබ් රථයේ ප්‍රධාන ලාම්පු දෙක සඳහා මිල ගණන් කැඳවන ලද අතර තාක්‍ෂණ සේවා නිලධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති එකම මිල ගණන් පිළිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | එක්සලන්ස් කාර් ස්ටිරියෝ | විජේසූරිය මෝටර්ස් | නිව් භවානා මෝටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | 252-0730 අංක දරණ කැබ් රථයේ ප්‍රධාන ලාම්පු දෙක සවි කිරිම | 02 | 9950.00 | භාණ්ඩ නොමැති නිසා මිල ගණන් ලබා දී නොමැත | භාණ්ඩ නොමැති නිසා මිල ගණන් ලබා දී නොමැත |

**7:2:16** පොදු වෙළඳපල අංක 6 කඩ කාමරය සඳහා මිල ගණන් කැඳවන ලද අතර ලැබී ඇති මිල ගණන් අසම්පූර්ණ බැවින් නැවත මිල ගණන් කැඳවීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | EDT වික්‍රමසේකර |
|---|---|---|---|
| 01 | පොදු වෙළඳපල අංක 6 කඩ කාමරය | 01 | 3460.00 |

## (08) ගෙවීම්

8.1 ඇ. අංක 1099 යටතේ ටයර් ටියුබ් මිලදී ගැනීම වෙනුවෙන් ගාල්ල විජේතුංග ටයර් සර්විස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 23188.00/= ක් ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

750 x 16 ටියුබ් 06 x 1520.00 = 9120.00

600 x 12 ටයර් 02 x 7034.00 = 14068.00

= 23188.00

8. 2 ඇ. අංක 1106 යටතේ ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ, රජයේ මුද්‍රණ හා නිතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 26850.00 ක් ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

01) නිල් පෑන් (බෝල්පොයින්ට්) 500 x 15.00 = 7500.00

02) කාබන් කොළ පැකට් 12 x 275.00 = 3300.00

03) $A_4$ පැකට් 25 x 575.00 = 14375.00

04 ) ටිපෙක්ස් 20 x 50.00 = 1000.00

05) අඩි කෝදු 25 x 27.00 = 675.00

8.3 ඇ. අංක 1111 යටතේ 20W දගර CFL බල්බ් (Orange අවුරුදු 2.5 වගකීම සහිත) 200 ක් මිලදී ගැනීම වෙනුවෙන් මාතර රජයේ වානිජ විවිධ නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 98999.00 ක් ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.4 ඇ. අංක 1112 යටතේ ලබා ගත් LP Gas 37.5 kg Sylinder 08 මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ, මිළිදු එන්ටර්ප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57744.00 ක් ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

Gas Sylinder 08 x 7218.00 = 57744.00

8.5 ඇ. අංක 1114 යටතේ විදුලි භාණ්ඩ මිළදී ගැනීම වෙනුවෙන් කොළඹ ජෂියන් ඉලෙක්ට්‍රිකල් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 50725.00 ක් ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| 1) 4' x 0' ටියුබ් ලයිට් 25 x 80.00 | = | 2000.00 |
| 2) 2' x 0' ටියුබ් ලයිට් 10 x 80.00 | = | 800.00 |
| 3) ස්ටාටර් පෙට්ටි (Philips) 25 x 17.00 | = | 425.00 |
| 4) වන්ගැන් ස්විච් 25x 100 | = | 2500.00 |
| 5) මකරි බල්බ් (125W) 100 x390.00 | = | 39000.00 |
| 6) 40 W ටියුබ් ලයිට් චෝක් 25 x 150.00 | = | 3750.00 |
| 7) පෝසිලේන් ත්‍රී පින් හෝල්ඩර් 50 x 45.00 | = | 2250.00 |
| | = | 50725.00 |

8.6 ඇ. අංක 1117 යටතේ Toshiba Settel Life $I_3$ (CSO $I_3$ 4 GB / 500 GB /15) ලැප් ටොප් 01 මිලදී ගැනීම වෙනුවෙන් කොළඹ අබාන්ස් ෂෝ රූම් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 61500.00 ක් ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.7 ඇ. අංක 1050 යටතේ 2014 නගර ක්‍රීඩා උළෙල සඳහා ක්‍රිකට් භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් ගාල්ල DD ස්පෝට්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 33780.00 ක් ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.8 ඇ. අංක 1102 නගර ක්‍රීඩා උළෙල සඳහා පදක්කම් මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ සමාරා ප්ලාස්ටික් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 118365.00 ක් ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| රන් පදක්කම් 216 x 195.00 | = | 42120.00 |
| රිදී පදක්කම් 207 x 195.00 | = | 40365.00 |
| ලෝකඩ පදක්කම් 184 x 195.00 | = | 35880.00 |
| | = | 118365.00 |

8.9 ඇ. අංක 1120 යටතේ 2014 කියවීමේ මාසය වෙනුවෙන් පහත සදහන් ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ සක්වා ප්‍රින්ටර්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 47560.00 ක් ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සදහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| සහතික පත් (කොන්ගරා) විශේෂ | 60 x 56.00 | = 3360.00 |
| සහතික පත් (කොන්ගරා) සාමාන්‍ය | 300 x 54.00 | = 16200.00 |
| ආරාධනා පත් | 250 x 34.00 | = 8500.00 |
| ෆයිල් කවර | 300 x 65.00 | = 19500.00 |
| | | = 47560.00 |

8.10 ඇ. අංක 1124 යටතේ වැහි කබා මිලදී ගැනීම වෙනුවෙන් ගල්කිස්ස Sparule Link (pvt) Ltd ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 34200.00 ක් ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සදහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| සම්පුර්ණ වැහි කබා ( මධ්‍යම ප්‍රමාණය) | 03 x 700.00 | = 2100.00 |
| සම්පුර්ණ වැහි කබා ( විශාල ප්‍රමාණය) | 05 x 700.00 | = 3500.00 |
| දණහිස තෙක් ඇති වැහි කබා (මධ්‍යම ප්‍රමාණය) | 09 x 650.00 | = 5850.00 |
| දණහිස තෙක් ඇති වැහි කබා (විශාල ප්‍රමාණය) | 35 x 650.00 | = 22750.00 |
| | | = 34200.00 |

8.11 2014 - iii කාර්තුව සදහා මුද්දර බදු වශයෙන් රු.42513.50 ක් මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සදහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:12 නගර සභාව මගින් පාලනය වන පුස්තකාල සදහා 2014 ජුනි මාසයට සපයන ලද පුවත්පත් වෙනුවෙන් රු. 38935.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සදහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:13 ඇ. අං. 1123 යටතේ රුමේනියන් වර්ගයේ ටොන් 10ක මාර්ග තලනය සදහා නව එංජිමක් මිලදී ගැනීමට යාන්ත්‍රික ඉංජිනේරුගේ තාක්ෂණ වාර්තාවේ නිර්දේශය අනුව රු. 625000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි කුරුණෑගල ගයාන් මෝටර්ස් ආයතනය වෙත සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සදහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:14 සභාපතිතුමා උප සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ගේ ජුනි සහ අගෝස්තු මාස වලට අදාලව ගමන් වියදම් ලෙස රු. 24000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

මං කියන්නේ 8:14 සඳහන් කරලා තියෙනවා සභාපතිතුමා උප සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන් කියලා. නමුත් එහෙම බැලුවොත් පරස්පරයක් තියෙනවා. මොකද එහෙම නම් 30000 ගාණක් වෙන්න ඕන. අපි තුන් දෙනෙක් ගන්නෑ.ඉතින් සියලුම මන්ත්‍රීවරු ගන්නවා වෙන්නේ කෙහොමද.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සමහර මන්ත්‍රීවරු සමහර මාස වල වවුචරය ඉදිරිපත් කරන්නෑ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

මම දීමනා ගන්නෑ. එනිසා මාව මේවට ගාවන්න එපා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල් . අනුර කිත්සිරි මහතා කතා කරමින්**

8 දෙනයි අරන් තියෙන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

භාෂිණි මන්ත්‍රීතුමිය .සරත් මන්ත්‍රීතුමා ,ජයන්ත මන්ත්‍රීතුමා අදාල වවුචරය මෙතෙක් ඉදිරිපත් කර නොමැත.ඉතින් ඒක හරිනේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

අදාල ලේඛණය මෙතෙක් ඉදිරිපත් කරලා නෑ කියන්නේ මම කවදාවත් ගන්නේ නැනේ.මම කියන්නේ මෙතන සියලුම කියලා සඳහන් කරන්න එපා. එතකොට හැමෝම අයිති වෙනවනේ. මට කෙනෙක් ඇවිත් කීවොත් ඔබතුමා කෙහොමද ගත්තේ නෑ කියන්නේ මේ සඳහන් කරලා තියෙන්නේ සියලු දෙනාම කියලා කීවොත් මම මොකද කරන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔබතුමා 3 දෙනයි කීවම අනෙක් අය හිතයි විපක්ෂෙ අය ගන්නේ නෑ කියලා. විපක්ෂෙ මන්ත්‍රීවරු 2 ක් ගන්නේත් නෑ. පාලක පක්ෂෙ 2 ක් ගන්නෙත් නෑ. මෙතන මන්ත්‍රීවරුන් කියලා විතරක් සඳහන් කරන්න එතකොට හරිනේ.

8:15 2014 අගෝස්තු මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 I | 43924.66 |
| 23453 I | 2856.50 |
| 34453 I | 2674.63 |
| 52453 I | 39241.39 |
| 53454 | 19925.50 |
| 62453 I | 23794.24 |
| | 132416.92 |

විදුලි බිල්පත් සඳහා රු. **132416.92** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:16 2014 අගෝස්තු මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම.

| වැය අංකය | ගෙවු මුදල |
|---|---|
| 11453 II | 8921.92 |
| 23453 II | 18136.20 |
| 34453 II | 655.20 |
| 52453 II | 10611.10 |
| 62453 II | 37393.72 |
| | **75718.14** |

ජල බිල්පත් සඳහා රු: **75718.14** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:17 2014 අගෝස්තු මාසයට අදාල දුරකතන බිල්පත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම.

| වැය අංකය | ගෙවු මුදල |
|---|---|
| 11452 | 27585.78 |
| 12452 | 1211.73 |
| 25451 II | 1211.73 |
| 62452 I | 4981,23 |
| | 34990,47 |

දුරකතන බිල්පත සඳහා රු **34990.47** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:18 නගර සභාව සතු GL -9369 ගලි බවුසරය සඳහා 2014 සැප්තැම්බර් මස 15-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13070.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| **ඇණවුම් අංකය** | **ඉන්ධන වර්ගය** | **ප්‍රමාණය ලීටර්** |
|---|---|---|
| 4860 | ඩීසල් | 100 |
| | එංජින් ඔයිල් | 03 |

8:19 නගර සභාව සතු 252- 0730 කැබ් රථය සඳහා 2014 සැප්තැම්බර් මස 15-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 25647.60 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4856 | ඩීසල් | 46 |
| 4866 | ඩීසල් | 60 |
| 4872 | ඩීසල් | 60 |
| 4876 | ඩීසල් | 50 |

8:20 තල්ගස්ගොඩ පුංචි පාලම අසල සිට මහ පාලම දක්වා මාර්ගය අයිනේ එක් පැත්තක ශරීර සුවතා මං තීරුව ඉදිකිරම 2 වන කොටස් මුදල ලෙස රු. 2058762.58 ක මුදලක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි කුරුදුගහහැතැම්ම, පාසල් කන්ද,අංක 273/1හි පිහිටි ඩී. කේ. එස්. බිල්ඩර්ස් වෙත ගෙවීමට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

## (09 ගිණුම්

**9:1** 2014 සැප්තැම්බර් මාසය සඳහා වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාගත කිරීම.

ඒ අනුව 2014 සැප්තැම්බර් මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභා සම්මත විය.

## (10) ඇස්තමේන්තු

**10:1** කලුවඩුමුල්ල , ශ්‍රී විජයාරාම පාරේ වරිපනම් අංක 3/ 4 අසලින් යන පාර කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 202197.60 ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**තීරණය**

☛ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ඇස්තමේන්තු ඒකමතිකව සභා සම්මත විය.

10:2 පොකුණ පාර අවසානයේ ඇති කාණුව කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 808748.13 ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**තීරණය**

☛ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ඇස්තමේන්තු ඒකමතිකව සභා සම්මත විය.

10:3 දළුක්කන්ද හරස් මාර්ගයේ ගල් කුට්ටි ඇතිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 1000000.00 ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**තීරණය**

☛ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ඇස්තමේන්තු ඒකමතිකව සභා සම්මත විය.

10:4 හින් ඇළ හරස් පාරේ වරිපනම් අංක 17/ 6 අසලින් යන පාරේ කුට්ටි ගල් ඇතිරීමේ කර්මාන්තය සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 384230.50 ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල් . අනුර කිත්සිරි මහතා කතා කරමින්**

අපි අවුරුදු 03-04 ට කලින් ඔතන කරන්න ගියහම කරන්න දුන්නෑ අපට.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔව් මෙතන ගැටලුවක් තියෙනවා. ළිදක ප්‍රශ්නයක් තියෙනවා . මීට අවුරුද් 10 විතර කලින් මේක කරන්න හැදුවේ අපි.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල් . අනුර කිත්සිරි මහතා කතා කරමින්**

මේ ප්‍රතිපාදන අපතේ යන නිසා මේක කළාට කමක් නෑ.නමුත් දැනුත් මෙතන සියලු දෙනාම කැමති කියලා දෙයක් නෑ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

මේතන, සභාපතිතුමා දන්නවා මං හිතන විදියට එකපාරක් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා මේකට රු. 75000 ක් වෙන් කළා. සංවර්ධන කමිටුවේදී යෝජනා වෙලා චිනී මහත්තයා ඒකට විරුද්ධ වුණා. අනෙක් අය මේක පවරා ගැනීමට කැමැත්ත දීලා තියෙන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ මාර්ගයේ යම් වැදගත් කමක් තියෙනවා. රේල් පාර හරහා මහ පාරට එන්න තියෙන ළගම මාර්ගය.එනිසා ඒක කරන එක හොඳයි. මොකද නිතරම එතන මඩත් වෙනවා.

මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**තීරණය**

☛ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ඇස්තමේන්තු ඒකමතිකව සභා සම්මත විය.

## (11) වෙනත් කරුණු

**11:1** ‘‘ කෙම්පික්ස් මිලදී ගැනීම සදහා අනුමැතිය ලබා ගැනීම ’ මැයෙන් සැපයුම් නිළධාරිනිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

කෙම්පික්ස් මිළ දී ගැනීමට මිල ගණන් කැදවන ලද අතර 2014.10.13 වන දින විශේෂ සභාවේදී අවම මිළ ගණන් පිළිගත් අතර එම අවම මිළ ගණන් යටතේ අම්බලන්ගොඩ ස්ටාර්ලයින් හාඩ්වෙයාර් ආයතනයට කෙම්පෙක්ස් මිලදී ගැනීමට ගිය අවස්ථාවේදී පරණ තොගය අවසන් වී ඇති බවත් නව තොගයට අනුව 1 kg මිළ රු. 211.00 ක් වන බවත් ඒ අනුව ඊලගට අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති BKS ආයතනයෙන් මෙම ද්‍රව්‍ය මිලදී ගැනීම සුදුසුද නැද්ද යන්න පිළිබද උපදෙස් ලබා දෙන මෙන් සදහන් කර තිබුණි.

**තීරණය**

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් දෙවන අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති BKS ආයතනයෙන් කෙම්පිස් මිලදී ගැනීම සදහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:2** ‘ 2014 සැප්තැම්බර් මස වාර්තාව ’ මැයෙන් නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඖෂධ සංයෝජක විසින් එවා තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ආයතනයෙහි සායන පැවැත්වූ දින ගණන 21 ½ ,ආයතනයට පැමිණි රෝගීන් ගණන 269, රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය 13, මාසය සඳහා වැය වූ ඖෂධවල මුළු වටිනාකම රු.26600.60, රෝගියෙක් සඳහා වැය වූ මුදල රු. 98.88 ලෙස සදහන් කර තිබුණි.

**තීරණය**

☛ **මෙම වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.**

**11:3** ‘ ලැප්ටොප් පරිගණකයක් සහ ඩොංගල් උපකරණයක අවශ්‍යතාවය දැන්වීම ’ මැයෙන් තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

දපාපා/යහ/01/පුහුණු TAF දරණ 2014.10.10 දිනැති සහභාගීත්ව අයවැයකරණය පිළිබද පුහුණු වැඩ මුළුව සදහා වූ ලිපියට අනුව එම වැඩමුළුවට ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් රැගෙන එන ලෙස දන්වා එවා ඇති බවත් ඒ අකාරයේ වැඩ සටහන් වලට සහභාගී වීමේදී භාවිතා කිරීමට ආයතනය සතුව ලැප්ටොප් පරිගණකයක් නොමැති වීම විශාල අඩුපාඩුවක් බවත් සදහන් කර තිබූ අතර මෙම උපකරණය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා තිබුණි.

තීරණය

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභා ආවරණ අනුමැතියට යටත්ව ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් මිලදී ගැනීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:4** නාගරික සීමාවේ පාසල් උත්සවයක් වෙනුවෙන් සභා ආවරණ අනුමැතියට යටත්ව කොඩි කණු 20ක් සහ සිංහ කොඩි 05ක් ලබා දෙන මෙන් ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්මි හේමන්තා සිල්වා මෙනවිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ප්‍රදේශයේ පාසල් උත්සවයක් වෙනුවෙන් 2014.10.14 දිනට කොඩි කණු 20 ක් සහ සිංහ කොඩි 05 ක් සභා ආවරණ අනුමැතියට යටත්ව ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

තීරණය

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් කොඩි කණු 20 ක් සහ සිංහ කොඩි 05 ක් සභා ආවරණ අනුමැතියට යටත්ව ලබාදීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:5** ‘ නගර ශාලාව වෙන්කරවා ගැනීම ’ මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

සාහිත්‍ය මාසය වෙනුවෙන් 2014.10.24 වන දින පාසල් ළමුන් සඳහා සාහිත්‍ය රසාස්වාදන වැඩමුළුවක් පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වා පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති නිසාවෙන් එදිනට නගර ශාලාව ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

තීරණය

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සාහිත්‍ය රසාස්වාදන වැඩමුළුව සඳහා නගර ශාලාව සභා ආවරණ අනුමැතියට යටත්ව ලබාදීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:6** ‘ පුහුණු වැඩසටහනක් පැවැත්වීමට නොමිලයේ නගර සභා ශාලාව වෙන්කර ගැනීම ’ මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

පුහුණු වැඩමුළුව සඳහා නගර සභා ක්‍රීඩාගාරය නොමිලයේ ලබා දීමට කටයුතු කිරීම පිළිබඳ ස්තූතිය පල කර තිබූ අතර මෙම දිනවල පවතින අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් වැඩමුළුව පවත්වන දින වල වර්ෂාව පැවතිය හොත් ධීවර සංකීර්ණය මේ වෙනුවෙන් නොමිලයේ වෙන්කර දෙන ලෙස ඉල්ලා තිබුණි.

තීරණය

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පුහුණු වැඩසටහනක් පැවැත්වීම සඳහා නොමිලයේ නගර ශාලාව සභා ආවරණ අනුමැතියට යටත්ව ලබාදීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:7** ' ශාලාව සඳහා අවශ්‍ය පහසුකම් ලබා ගැනීම ' මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014.10.24 වන දින පාසල් ළමුන් සඳහා වන සාහිත්‍ය රසාස්වාදන වැඩමුළුව සඳහා ශාලාව ලබා දීම පිළිබඳ ස්තූතිය පල කර තිබූ අතර මෙම උත්සවය සඳහා පුටු 250 ක් විදුලි ආලෝකය සහ ජල පහසුකම් නොමිලයේ ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සාහිත්‍ය රසාස්වාදන වැඩමුළුව සඳහා නොමිලයේ පුටු 250 ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ලබාදීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:8** ' 2014 වර්ෂයේ ඔක්තෝම්බර් මස කර්මාන්ත අංශය විසින් ඉටුකිරීමට යෝජිත මාර්ග ශුද්ධ කිරීමේ ලේඛණය ' මැයෙන් වැඩ අධිකාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඔක්තෝම්බර් මස තුළ පහත සඳහන් මාර්ග සුද්ධ කිරීමට යෝජිත අතර අංක 01 සිට අංක 13 දක්වා මාර්ග මේ වන විට ශුද්ධ කර අවසන් බවත් අත්‍යාවශ්‍ය සේවාවන් මත මෙම මාර්ග ලේඛනය වෙනස්විය හැකි බව ද සඳහන් කර තිබුණි.

- අක්කර 18 පාර, 2) විසුකම් පෙදෙස 3) ප්‍රයිම් ලැන්ඩ් විස්කම් පෙදෙස 4) අශෝක උයන පාර 5 ) මානිමුල්ල පටුමග 01 6) සද්ධාසේන පාර 7) පොල්වත්ත කිරි පට්ටිය පාර 8) මුහුදු වෙරළ පාර 9) මුහුදු වෙරළ හරස් පාර 10) චන්ද්‍රාවාස පාර 11) දෙවන හරස් පාර 12) ටී. සී. ප්‍රනාන්දු පාර 13) දෙල්දූව පාර 14) මානිමුල්ල 02 වන පටුමග 15) කරෝලිස් වෙද මාවත 16) තුඩුවමුල්ල පාර 17) මානිමුල්ල පාර 18) මහ අම්බලන්ගොඩ නිවාස යෝජනා ක්‍රම පාර 19) විජේවික්‍රම කොළනිය පාර 20) ධීරක්කන්ද හා පී. එච්. ආර්. සුමනදාස මාවත යාවන මාර්ගය 21) රොබට් වික්‍රමසූරිය පාර 22) ලියනාරච්චි පෙදෙස 23) නම්බිමුල්ල පාර

- **පෙ. ව. 12.20 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා සහ ජේ. ඩබ්. හාෂිණි මෙනුකා විජේසූරිය මහත්මිය සභාවෙන් පිටව යන ලදී.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මං කිව්වා සෑම මාසෙකම මේ වගේ වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා. එතකොට මන්ත්‍රීවරුන්ට දැන ගන්න පුලුවන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජ් . ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**
පොඩි ඉල්ලීමක් කරන්න ඕන සභාපතිතුමා. සමාධි පොටෝ එක ළග ඉදලා අපි තාර නොදාපු කොටසක් තියෙන්නේ. එතනටත් මොකක් හරි කරලා දෙන්න සභාපතිතුමා. වැහි කාල වලට ඒ අඩි 10 යේ යන්න බෑ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
එතන සිමෙන්ති දාන්න බෑ. කොන්ක්‍රීට් ඕන දාන්න. ඒකට ඇස්තමේන්තුවක් ලබා දෙන්න. කලින් ප්‍රශ්නය කියන්නේ අපි ඔය පාර දාගන එද්දී ඔය සමාධි එකේ එක්කෙනා අඩි 10 ක් දීලා තිබුණේ. පස්සේ එයා අඩි 05 ක් මෙහා පැත්තට දාලා වැට ගැහුවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය කතා කරමින්**

සභාපතිතුමා ඕකට ඇස්තමේන්තුවක් අනුමත කළා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මුහුදු වැලි අරගෙන ගලුයි වැලියි අරගෙන ඕක කොන්ක්‍රීට් කරලා දාන්න.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

කරිත්ත කන්ද පාර වික්‍රමසූරිය පාරට සම්බන්ධ වන තැන අග කොටස කොන්ක්‍රීට් තිබ්ලා ගැලවිලා හරි අඩි 200 ක විතර ප්‍රමාණය ප්‍රතිසංස්කරණය කරන්න වෙලා තියෙනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කොන්ක්‍රීට් නෙවෙයි එතන තාර තියෙන්නේ. තාක්ෂණ සේවා නිළධාරී මේ කියන තැන තාර දාලා පිරිමහන්න බෑ. එනිසා එතන කොන්ක්‍රීට් කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය කතා කරමින්**

බවානි එක ළඟ පාර එහාට වෙන්න කැඩිලා. දැන් මිනිස්සු මිනිස්සු අතර ගැටුමක් ඇති වෙලා තියෙනවා පාර කැඩිච්ච නිසා වතුර එක එක්කෙනාගේ වතු වලට යනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

බවානි පපඩම් කර්මාන්තශාලාව ළඟට යන පාර. මන්ත්‍රීතුමිය කියන එක බලන්න.බලලා ඇස්තමේන්තුවක් දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය කතා කරමින්**

මෙතන මිනිස්සු රණ්ඩු වේලා පොලිසිත් යන තත්වෙට උදා වෙලා තියෙන්නේ. එතන සපත්තු පාලමක් දාලා තමයි කරන්න වෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල් . අනුර කිත්සිරි මහතා කතා කරමින්**

මෙතුමිය කියන දේ ඇත්ත. එතන වතුර බහින එක හිරවෙලා තියෙන්නේ. වෙළට වතුර බැස්සේ. දැන් වෙළ ගොඩකරලා. ඒ වගේම ස්භාවික වතුර බැස්මවලුත් හිරවෙලා තියෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමණි දිවි නැගුම යටතේ ආණ්ඩුවෙන් ආපු සල්ලි වලින් ප්‍රාදේශීය ලේකම් හරහා යන ව්‍යාපෘති වල වැඩ ඉවර නෑ සමහර ඒවයේ තාම. කලුවඩුමුල්ලේ තාම නෑ. කන්ද මාවතේ බෝක්කුව ප්‍රායෝගික ප්‍රශ්ණ නිසා කරගන්න බැරි වුණා. මොකද ප්‍රාදේශීය ලේකම් එකට එවැනි ප්‍රශ්ණ නිරවුල් කිරීමේ හැකියාවක් නෑ.මට ජේන විදියට මේ මුදල් ආපසු යයි. ඒක විශාල පාඩුවක් නගර සභාවට. මං කීප වතාවක්ම යෝජනා කළා නගර සභාවෙන් හරි කරමු කියලා.ඒ TO ඒකටත් එකග නෑ. එහෙම කීවම කියනවා කොන්ත්‍රාත්කරුවන් සපයනවා කියලා.එනිසා ඔබතුමා ප්‍රාදේශීය ලේකම්තුමියට කතා කරලා අවසන් දින වකවානු ගන්න මේක කරනවද මොකද කියලා. මේකෙන් නගර සභාවට අගතියක් වෙනවා මේ සල්ලි ආපහු ගියොත්. මේ ගම් බිම් වල මිනිස්සු දැවෙන ප්‍රශ්ණ මේ.එනිසා මේ සල්ලි යන්න දෙන්න එපා. ගොඩක් වැඩ ඉවර වෙලා තියෙන්නේ. ඉවර නොවුණු වැඩ කිහිපයක් තියෙනවා. ඒ ටික ඉක්මණින් කතා කරලා ඉවරයක් කරන්න සභාපතිතුමණි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහෙම දෙයක් තියෙනවා මීට ඉහත අම්බලන්ගොඩ නගරය පුරා සංවර්ධන කටයුතු වල මුදල් ප්‍රාදේශීය ලේකම් එකට ආවත් ඒ මුදල් නගර සභාවට එවලා තමයි වැඩ කළේ. එහිදී අපි ප්‍රාදේශීය ලේකම් එකෙන් ලැබෙන මුදල ප්‍රමාණවත්

නොවුනොත් නගර සභාවෙන් මුදල් වියදම් කළා.උදාහරණයක් ලෙස හීන් ඇළ හරස් පාරට රජයෙන් ලැබුනේ ලක්ෂ 10 යි.ඒකට අපි ලක්ෂ 16 ක් ගිය වර නගර සභාවෙන් ලබා දුන්නා වැඩ ඉවර කරන්න. නමුත් විගණන ගැටලු මතුවෙනවා කියලා තමයි මේ වැඩ සටහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කරනවා කියලා ඉල්ල ගත්තේ. අපි ඒකට අනුමැතිය ලබා දුන්නා සල්ලි ආර්ථික සංවර්ධන අමාත්‍යංශයෙන් ලැබෙන නිසා.නමුත් මෙහිදී මම මතක් කරන්න ඕන මේක සදාතනික ප්‍රතිපත්තියක් වෙලා නෑ.වෙනත් ස්ථාන වල ප්‍රාදේශීය සභාවෙන් මේක කරනවා මේ දිස්ත්‍රික්කෙම. අපි අධීක්ෂණ මන්ත්‍රීවරු විදියට පත්කරලා තිබුණත් දැන් අපි කංකානින් බවට පත් වෙලා තියෙනවා. මොකද අදාල ග්‍රාම සේවා කොට්ඨාශයේ ටෙන්ඩර් එක ලබා ගන්නත් මහ ඇමතිතුමාගේ අනුමැතිය ලබා ගන්න වෙලා තියෙනවා. මේ විදියට පඹයෝ වගේ වැඩ කරන්න නම් මන්ත්‍රීකම වැඩකුත් නෑ. මම විශේෂයෙන් සඳහන් කරන්න ඕන අම්බලන්ගොඩ නගර සභාවට මේ වසර තුළ කෙනහිලිකම් රාශියක් සිදු වෙලා තියෙනවා.ඒක පරිපාලනය තුළින්මයි සිදු වෙලා තියෙන්නේ පළාත් සභාවේ. මම කියන්න ඕන මුදල් ඇමතිතුමා පළාත් සභාවේ ප්‍රධාන ඇමතිතුමා ,ඒ වගේම විෂය භාර ඇමතිතුමා වශයෙන් එතුමා කටයුතු කරන්නේ. අම්බලන්ගොඩ නගර සභාවට මෙවැනි ආකාරයෙන් කෙනහෙලිකම් කිරීම නවත්තන්න කියලා අපි ආයාචනා කරනවා. මොකද පසු ගිය ජනවාරි මාසේ ඉඳන් එතුමා පඩි සඳහා එවපු මුදල පළාත් සභාවෙන් ජනවාරි මාසෙ සඳහා පඩි තුන් ලක්ෂ තිස් පන්දාහක් අඩුවෙන් එවලා තියෙන්නේ.පෙබරවාරි මාසේ සඳහා තුන් ලක්ෂ පනස් තුන්දාහක් අඩුවෙන් එවලා තියෙන්නේ.මාර්තු මාසේ සඳහා තුන් ලක්ෂ හතලිස් හත්දාහක් අඩුවෙන් එවලා තියෙන්නේ.අප්‍රේල් මාසේ සඳහා තුන් ලක්ෂ තිස් දෙදහාක් අඩුවෙන් එවලා තියෙන්නේ.මැයි මාසේ සඳහා තුන් ලක්ෂ හැත්තපන්දාහක් අඩුවෙන් එවලා තියෙන්නේ.ජුනි මාසය සඳහා තුන්ලක්ෂ විසිදාහක් අඩුවෙන් එවලා තියෙන්නේ.ජුලි මාසේ සඳහා තුන් ලක්ෂ හැට අටදාහක් අඩුවෙන් එවලා තියෙන්නේ.අගෝස්තු මාසේ සඳහා තුන් ලක්ෂ පනස්දාහක් අඩුවෙන් එවලා තියෙන්නේ.සැප්තැම්බර් මාසේ සඳහා තුන් ලක්ෂ දහදාහක් අඩුවෙන් එවලා තියෙනවා. මම ඇත්තටම නගර සභා සම්මේලනයේ සභාපතිවරයා වශයෙන් ජාතික මුදල් කොමිෂමත් සමග කතා කළා, රජයේ සේවකයින්ගේ වැටුප් සඳහා මුදල් 100% පළාත් සභාව සඳහා එවනවා.නමුත් ප්‍රධාන අමාත්‍යතුමා, මුදල් ඇමතිතුමා වශයෙනුත් ,පළාත් පාලන විෂයභාර ඇමතිතුමා වශයෙනුත් අම්බලන්ගොඩ නගර සභාවට මාසිකව ලක්ෂ තුනහමාර ගණනේ අඩුවෙන් එවන්නේ.මේ අනුව සභාව වැටෙනවා. ඉතින් එතුමාගේ වගකීමක් වෙනවා ඇත්තවශයෙන්ම අම්බලන්ගොඩ ප්‍රධාන සංවිධායකයා වශයෙනුත් අපේ සභාව රැක ගන්න එතුමා කටයුතු කරන්න ඕන ඇත්ත වශයෙන්ම. මේක දිගින් දිගටම කරගෙන ගියොත් මේ සභාව පවත්වාගෙන යන්න බෑ.මන්ත්‍රීවරු කියනවා මේකට සල්ලි දෙන්න අරකට සල්ලි දෙන්න කියලා නමුත් වැටුප් ගෙවනවට වඩා දෙයක් කරන්න බෑ.අද දික්වැල්ල ප්‍රාදේශීය සභාව මුදල් කොමිසමට ගිහිල්ලා මේ සම්බන්ධයෙන් කටයුතු කරලා දැන් දික්වැල්ල ප්‍රාදේශීය සභාවට සම්පූර්ණ මුදල එවනවා.මං පසුගිය රැස්වීමකත් කිවුවා මෙවැනි තත්වයක් උදාකරන්න එපා මොකද ඉස්සරහට වැඩ නොකර ඉන්නද සභාව වහලා දාන්නද කියලා.මේ සම්බන්ධයෙන් අමාත්‍යංශ ලේකම්ටත් කීවා. දැන් අද ප්‍රාදේශීය ලේකම් එකෙන් ලබා දෙන කොන්ත්‍රාත්තුව කරන කොන්ත්‍රාත්කරු තෝරගන්නත් මහ ඇමතිතුමා ගාවට ලියුමකින් අරන් යන්න ඕන, මෙන්න මෙයාට කොන්ත්‍රාත්තුව දෙන්න කියලා. ඉතින් අපි කංකානි බවට පත්වෙලා ඉවරයි. සරත් මන්ත්‍රීතුමා කියන කතාව ඉතාම වැදගත් දෙයක් .නමුත් එතුමා බොහොම අඥාදායකවයි කටයුතු කරන්නේ. ඇත්තටම පළාතේ මුදල් ඇමතිවරයා වශයෙන් ප්‍රධාන ඇමතිතුමා මේ සභාව වැට්ටීම සඳහා ඇත්ත වශයෙන්ම කටයුතු කරනවා. ඒ ගැන කණගාටුවෙන් කියනවා ඉස්සරහට ඒ දේ වළකාගන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය කතා කරමින්**

මට ඕකට දෙයක් එකතු කරන්න තියෙනවා සභාපතිතුමා. මොකද මටත් එවලා තිබුණා හල්වතුර යෝජනා ක්‍රමයේ පාරක්. ඒ පාර කරන්න ගියහම කොන්ත්‍රාත්කරුවෙක් සොයාගන්න හිටියේ නැතිව මං අන්තිමට කෙනෙක් සොයාගත්තා. සොයා ගත්තට පස්සේ ප්‍රාදේශීය ලේකම්තුමිය කියලා තියෙනවා ප්‍රධාන ඇමතිතුමාගෙන් ලියුමක් අරන් එන්න කියලා. පස්සේ එම තැනැත්තා එතනට ගියහම ඔයා මොකේද, ඔයා පාර්ශිකයෙක්ද කියලා අහලා, මේ දන්න මනුස්සයෙක් ගොඩක් අපහසුතාවයට පත් කරලා තිබුණා ජනිත් මහත්තයා. මං පස්සේ එතුමට කතා කරලා කිව්වා මෙහෙම කරන්න එපා මේක මට එවලා තියෙන්නේ. මේක කරන්න දෙන්න කියලා. ඒ පාර හා බලන්නම් කියලා තමයි ලියුම අත්සන් කළේ.එහෙම අනුමැතියක් ඕන නම් අපි මේකට මැදිහත් වෙන්න ඕන නෑ කියලා තමයි සභාපතිතුමාට මම කියන්නේ. එහෙමනම් ප්‍රධාන ඇමතිතුමා ඇතුලු ඒ අයට ඒක කරගන්න කියන්න. අපට අධීක්ෂණය කරන්න කියලා ලියුම් එව්වහම ඒ සමිතිවල ඉන්න මහත්වරු ඇවිත් මගෙන්

අහනවා මේක කරන්නැද්ද මේක කරන්නැද්ද කියලා. මං කිවුවා කොන්ත්‍රාත්කරුවෙක් සොයා ගත්තා දැන් කරනවා කියලා. ඒත් ලියුම ගන්න දවස්ගානක් යන්න වෙලා තියෙනවා. සභාපතිතුමා කියපු දේ මං ඇත්තටම පිළිගන්නවා මොකද මං අත්දැකීමෙන් කියන්නේ ,නැතිව මං කවුරුත් විවේචනය කරනවා නෙවෙයි.එහෙම නම් සභාපතිතුමා අපට මේ රාජකාරිය කරන්න බෑ.මොකද මේ ජනතාව අපට ඡන්දේ දීලා තියෙන්නේ අපි ජනතාවට සේවයක් කරන්න ඕන.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මෙතුමිය සඳහන් කළා මහ ඇමතිතුමාගේ නිර්දේශ්‍ය සඳහන් ලියුමක් ඕන කියලා. නමුත් අපටනම් එහෙම ඕනවුන්නෑ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒක තමයි අපි අධීක්ෂණය කරනවා නම් අපට නිදහස තියෙන්න ඕන.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

විශේෂයෙන්ම කියන්න ඕන සභාපතිතුමා මට නම් එහෙම තත්වයක් උදා වුන්නෑ. අපට තමා කතා කරලා කීවේ සමිතියක් නම් කරන්න කියලා. සභාපතිතුමා දැන් ප්‍රකාශ කළා මාසෙකට මෙහෙම තුන් ලක්ෂ ගාණක් අඩුවෙන් එවනවා කියලා. එහෙම නම් මේක ප්‍රධාන ඇමතිතුමත් එක්ක සාකච්ඡා කරලා විසඳගත යුතුයි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මධ්‍යම ආණ්ඩුව වගකීම ඉෂ්ට කරනවා 100% ක්. ඒ පිළිබඳව අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද රාජ්‍ය සේවකයින්ට මුදල් එවන්නේ මුදල් කොමිසම මගින්. මුදල් කොමිසම මගින් පැහැදිලිවම සහතිකයක් ලබා දුන්නා රජයේ සේවකයෝ සියලු දෙනාට 100% ක් වැටුප් එවනවා කියලා.නමුත් මාසෙකට ලක්ෂ තුනහමාරක් අඩුවෙන් එවන කොට පළාත් සභාව අපේ සල්ලි ලක්ෂ තුනහමාරක් හොරකන් කරනවා. මාසෙකට තුනහමාරක් කියන්නේ ඇත්ත වශයෙන්ම අවුරුද්දකට ලක්ෂ පනස්ගාණක්. මං කිවා පළාත් සභාවෙන් අපට කිසිම සල්ලියක් එපා. අපේ පඩි ටික හරියට එවන්න කියලා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එතුමා පහු ගිය මාසේ අපි කැඳවලා මාර්කට් එක හදන්න ලක්ෂ 500 ක් දුන්නේ. ඔබතුමා ඉල්ලීමක් කළාම පුස්තකාලේ හදන්න කියලා එතුමා ඒකටත් සල්ලි දුන්නා. ඒ වගේ ලොකු මුදලක් නගර සභාවට දෙන කොට මේ වගේ සුළු දේවල් කරයි කියලා හිතන්න බෑ. අපි දන්නෑ මේවා නිළධාරීන් කරනවද කියලා එතුමා නොදැණුවත්ව .එනිසා අනිවාර්යෙන්ම එතුමා දැණුවත් කරන්න ඕන.දැන් මෙතුමියත් කිවා එතුමාගේ මාධ්‍ය ලේකම් ජනිත් මහත්මයා තමයි කොන්ත්‍රාත් එකට ලියුම ගේන්න ඕන කියලා කීවේ කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වාචිකව දන්වලා තියෙනවා අදාල සමිතිය ප්‍රධාන ඇමතිතුමා ලව්වා සහතික කරන් එන්න කියලා. එතකොට අධීක්ෂණ මන්ත්‍රීකම බොරුවක්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මේ පිළිබඳව ඉතාම ඉක්මනින් සාකච්ඡාවක් කැඳවන්න කියලා ඉල්ලනවා. මේ වගේ මුදලක් පඩි ගෙවීම සඳහා රජයෙන් අහිමි වෙනව නම් මෙය ඉතා ඉක්මනින් විසඳගත යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල් . අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමණි ,ඔබතුමා පැවසු කාරණය ඉතාම බරපතල දෙයක් එහෙම නිර්මාණය වෙලා තියෙනවනම්. මොකද පසු ගිය දා විශාල මුදලක් ලබා දීලා මේ වගේ ලක්ෂ තුනහමාරක් අපට අහිමි කරනවා නම් මේ සම්බන්ධයෙන් අපි එතුමාත් එක්ක

කරුණු සාකච්ඡා කළ යුතුයි.තව දෙයක් සභාපතිතුමණි පසු ගිය වසර වල මෙම මුදල් ප්‍රතිපූර්ණය ඒ ආකාරයෙන් අඩු පාඩු සිද්ධ වෙල් වර්ෂ අවසානේ.....

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒකත් මම කියන්නම්. 2013 වසරේ මෙන්න මේ ආකාරයට තමයි මුදල් ප්‍රතිපූර්ණය කරලා තියෙන්නේ.ජනවාරි මාසේ විසි එක්දාස් එකසිය තිස් නවයයි සත විසිහතරක් අඩුයි. පෙබරවාරි මාසේ එක්ලක්ෂ හැට හතරදාහක් වැඩිපුර එවලා තියෙනවා.මාර්තු මාසේ විසිපන්දාහක් වැඩියෙන් එවලා තියෙනවා.අප්‍රේල් මාසේ පනස් අටදාහක් වැඩියෙන් එවලා තියෙනවා.මැයි මාසේ හැට හතරදාහක් වැඩියෙන් එවලා තියෙනවා.ජුනි මාසේ ආපහු පනස්දාහක් අඩුයි.ජුලි මාසේ පනස්හතරදාහක් අඩුයි.අගෝස්තු මාසේ පනස්හයදාහක් අඩුයි.සැප්තැම්බර් මාසේ එක්ලක්ෂ විසි අට දාහක් අඩුයි.ආපහු ඔක්තෝම්බර් මාසේ හැත්ත හයදාහක් වැඩියෙන් එවලා තියෙනවා.නොවැම්බර් මාසේ හැට නවදාහක් වැඩියෙන් එවලා තියෙනවා.දෙසැම්බර් මාසේ හතලිස් නව දාහක් වැඩියෙන් එවලා තියෙනවා.මේ තත්වය උද්ගත වුනේ 2014 ජනවාරි මාසේ ඉදන්.මේ අවුරුදු දෙක ඇතුලත නගර සභාවට සමස්තයක් වශයෙන් විසිනව ලක්ෂ අටසිය තුනයි සත හැත්ත හතරක් අඩුවෙන් එවලා තියෙනවා.මේ තත්වය දිගින් දිගටම යනවා. මේක මෙහෙම වෙනවනම් ප්‍රධාන ඇමතිතුමා වශයෙන් එතුමා, පළාත් පාලන ඇමතිතුමා වශයෙන් එතුමා, ඒ වගේම අදාල අම්බලන්ගොඩ ප්‍රදේශයේ නායකයා වශයෙන් එතුමා මේ සභාව නිකම්ම වැටෙනවා. පසු ගිය දවස්වල තිබ්බ පළාත් පාලන ප්‍රධානීන්ගේ අමාත්‍යංශ ලේකම් එක්ක තිබ්බ රැස්වීමේදී මම මේක මතු කරලා පෙන්නුවා. එතකොට පොරොන්දු වුණා ඊලග මාසේ වෙනස් කරලා දෙන්නම් කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල් . අනුර කිත්සිරි මහතා කතා කරමින්**

අපේ අභ්‍යන්තරයේ එහෙම දෙයක් තියෙනවනම් අපි එතුමාත් එක්ක කතා කළ යුතුයි.මොකද ලක්ෂ 7000 ක මුදලක් අපේ අම්බලන්ගොඩ නගර සභාව ප්‍රමුඛව ලබා දෙනකොට...

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ දුන්න ක්‍රමේ වුනත් අපි පඹයෝ වගේ. මෙහේ ඉන්න TO මුකුත් දන්නෑ.සමහර ඒවයේ අඩුපාඩු තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල් . අනුර කිත්සිරි මහතා කතා කරමින්**

ඔබතුමන්ලා අපි ගැන තියෙන අසීමිත විශ්වාසය නිසා තමයි එතුමා යෝජනාවක් විදියට අපිට ඉදිරිපත් කරන්න කියලා කිව්වේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සමහර වෙලාවට විශ්වාසය තියලා ඇත්තේ ඔබතුමාලා කීප දෙනෙක් ගැන විතරක් වෙන්න ඇති.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල් . අනුර කිත්සිරි මහතා කතා කරමින්**

එහෙමනම් සභාපතිතුමණි, ඒ ලක්ෂ 3000 -4000 හේ ලැබීම අපි පුද්ගලිකව ලබාගත්ත ජයග්‍රහනයක් කියලා ඔබතුමා කියනවනම් අපි ඒ ගැන ආඩම්බර වෙනවා.එතුමා අම්බලන්ගොඩ නිදහස් පක්ෂයේ ප්‍රධාන සංවිධායකයා විදියට අම්බලන්ගොඩ ආසනයේ ප්‍රධානියා සහ දකුණු පළාතේ ප්‍රධානියා හැටියට ඒ වගේ මේ සුළු කොට ලඝු කොට තිරණ ගන්න පුද්ගලයෙක් කියලා මම විශ්වාස කරන්නෑ.අපිට මෙය කණ්ඩායම් රැස්වීමේදී මේක සාකච්ඡා කරන්න තිබුණා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කණ්ඩායම් රැස්වීමට එව් කියලා හිතුවා. මාස 08 ක් විතර ආවේ නෑ. ආවනම් කතාකරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල් . අනුර කිත්සිරි මහතා කතා කරමින්**

එතුමා අපිව සාකච්ඡාවට යොමු කරානේ 1 වෙනිදා. 21 වෙනිදා සන්ධ්‍යා භාගයේදී ඒ ලක්ෂ 7000 ක ප්‍රතිපාදන අම්බලන්රෙගාඩ කේන්ද්‍රගත කොටගෙන දෙන කොට....

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පැහැදිලි දත්ත අනුව මම කතා කරන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල් . අනුර කිත්සිරි මහතා කතා කරමින්**

ඒක තමයි ඔබතුමාට ඒ අවස්ථාවේදි කියන්න තිබුණා ලක්ෂ 29 ක රික්තකයක් තියෙනවා මේක පුරවන්න කියලා. අපි ඉක්මණින්ම නොපැකිලිව ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් මේ පිළිබඳ සාකච්ඡාවක් කැඳවලා මේ තියෙන ගැටලු කාරණා විසදගමු. අනෙක් එක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අධීක්ෂණ නිළධාරියාගෙන් නම් ලිපියක් ලබා ගත්තා සම්තිය බලාත්මක කරන්න කියලා. මොකද අපේ විරෝධතාවයක් නැතෙයි කියලා. එහෙම සහතිකයක් මීට පෙර කර්මාන්ත වලදීත් ලබා දුන්නා අම්බලන්ගොඩ නගර සභාව විදියට ,මොකද මේ සම්තිය අධීක්ෂණ මන්ත්‍රීවරයාගේ විරෝදතාවයක් නොමැතිව කටයුතු කරනවා කියලා.ඊට අමතරව ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ලිඛිත අවසරයක් ඕනය කියලා ප්‍රාදේශීය ලේකම් එකෙන් මේ තත්වය තුලදී මෙතෙක් සිද්ධ වුනේ නෑ. එනිසා මේ වගේ දෙයක් ලඝු කොට සලකන්න එපා කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා අම්බලන්ගොඩ නගර සභාවේ මන්ත්‍රීවරයෙක් විදියට.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

ඇත්ත වශයෙන්ම මේ සභාව වසර 23 නියෝජනය කළ මන්ත්‍රීවරයෙක් හැටියට 2002 දී අපි සභාව පත් වුනහම මෙන්න මේ ඔබතුමාට තියෙන අරියාදුව අපටත් තිබ්බා. ඒ වෙලාවේ ඔබතුමා විපක්ෂ නායකයා හැටියට කටයුතු කළා. අපි ඒ වෙලාවේ ඉතාම වේදනාවෙන් අපේ සභාවට සල්ලි එවන්නැති වුනහම, මුද්දර බදු එවන්නැති වුනහම අපි කෑ ගැහුවේ.නමුත් අපට ප්‍රධාන අමාත්‍යතුමා අම්බලන්ගොඩ නගරයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක හැටියටත් ,අම්බලන්ගොඩ පුරවරයේ පුරවැසියෙක් හැටියටත් මේ දේ 2002 දී අපේ පාළන කාලයේදී අපට කළා. අද ඔබතුමා සභාපතීත්වය තියෙන මේ සභාවේ, ඇත්ත වශයෙන්ම ඔබතුමා එතුමත් එක්ක කළක් සුහදව වැඩ කළා. ඔබතුමා පසු ගිය පළාත් සභා මැතිවරණයට තරග කළාට පස්සේ ඒ තත්වය නැතිවුණා. සරත් මන්ත්‍රීතුමා මතුකළ කංකානි ප්‍රශ්නය මත තමයි අපි මේක දැනගත්තේ.අද හැදි දෙකකින් බෙදන බව අපට හොදට තේරෙනවා. අපි පාලක පක්ෂයේ ඉද්දිත් මහ ඇමතිතුමා අපට හැදි දෙකකින් බෙදුවා. අපේ සල්ලි දුන්නෑ. පළාත් සභාවෙන් කරන්න පුලුවන් උපරිම අරියාදුව කළා අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන්.අද ජනවාරි මාසේ ඉදලා ලක්ෂ 30 ක් මේ සභාවට අහිමි කරලා මේ සභාවේ අයබදු ගෙවන ජනතාවට කරන සේවයට අවනම්බු කරලා ප්‍රධාන අමාත්‍යතුමා කටයුතු කරනව නම් අපි විපක්ෂයක් විදියට අපේ අප්‍රසාදය එල කරනවා. ඒ පිළිබඳව.එතුමාට ඔබතුමත් එකික පෞද්ගලික ප්‍රශ්නයක් තියෙන්න පුලුවන්. නමුත් මේ නගරයේ ප්‍රධානියා විදියට ඔබතුමා පාලක පක්ෂේ වුනත් ජනතාව පත්කරපු මන්ත්‍රීවරු විදියට අපි ඔබතුමා එක්ක මේ අවස්ථාවේ අත්වැල් බැඳගන්නවා. මොකද මේක අය බදු ගෙවන ජනතාවට කරන අරියාදුවක්. මේ තුළින් කුණු ටික ඇදෙන්නෑ. පාරවල් ටික හැදෙන්නෑ.මැසි මදුරු ගැටලුව විසදෙන්නෑ.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

මං මේ අවස්ථාවේ මතු කළේ මීට හාත්පසින්ම විරුද්ධ කාරණාවක්. එය වැරදි ආකාරයෙන් මේ සභාවේ සාකච්ඡා වුණා. එවැනි වැරදි වැටහීමකට ඉඩ ලබා දෙන්න බෑ.මම මතු කළ ප්‍රධානම කාරණාව රජයෙන් ලැබිච්ච මුදල් ආපසු යන්න නොදී රැක ගන්න එක සභාවේ වගකීම කියන එක විතරයි. මේකෙදී යම් යම් කාරණා මතු වුණා ඒකෙදී උත්තර දීම නොදීම මන්ත්‍රීවරු ප්‍රකාශ කළා. නමුත් මහ ඇමතිතුමා ගැන කිසියම් ප්‍රකාශයක් සිද්ධ වෙනව නම් එතුමා අපේ ප්‍රධාන සංවිධායකයා, අනෙක් අතට පළාතේ මහ ඇමතිවරයා. ඔබතුමා ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛන ඉතාමත් නිවරදි ඇති.මේ තත්වයන් නගර සභාවට උදාවෙලත් ඇති.නමුත් අපට අඩුවෙන් තක්සේරු කරන්න බෑ මහ ඇමතිතුමා පොදු වෙළඳපල සාදන්න ලක්ෂ 500 ක් දෙන්න පොරොන්දු වෙලා මාසයක් නෑ.එනිසා එතුමා මුණ නොගැසී එතුමාට මේ කාරණය දන්වන් නැතිව දොස් කියන එක වැරදි.එනිසා අපි ඉස්සෙල්ලා අවස්ථාවක් ගමු. ඇත්තටම මටත් අවශ්‍යතාවයක් තියෙනවා නගර සභාව පැත්තෙන් යම් යම් ප්‍රතිපාදන ලබා ගන්න. ඒවා අපි සාමුහිකව එකතුවෙලා ලබා ගමු කියලා ඉල්ලනවා. එනිසා මේකට හොදම විසදුම සාකච්ඡා කිරීම. නැතිනම් මෙහෙම වාද විවාද කිරීමෙන් අගතියක් වෙන්නේ.එනිසා මම ඉල්ලීමක් කරනවා අපි මන්ත්‍රීවරු 12 දෙනාම ඉල්ලීමක් කරලා එතුමා සමග සාකච්ඡා කරලා මේ ප්‍රශ්නය විසදගමු කියලා.

**තීරණය**

☛ **මෙම වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සදහා ඉදිරිපත් කරන ලදී.**

**11:9** කාර්යාලය විධිමත් පරිදි සකස් කර ගැනිම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ඉල්ලීම් කර වැඩ අධිකාරි විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

සභාපතිතුමා 2014.10.13 වන දින කර්මාන්ත අංශයට පැමිණි බවත් කාර්යාලය විධිමත්ව සකස් කර ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය ඉල්ලීම් කරන ලෙස උපදෙස් ලබා දුන් බව සඳහන් කර තිබූ අතර ඒ අනුව කාර්යාලීය ලියන මේස 08 ක් ඇදි රහිත ප්ලාස්ටික් පුටු 08 ක් සහ මේස රෙදි 08 ක් ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් කර්මාන්ත අංශයේ නවීකරණ කටයුතු සඳහා වැඩ අධිකාරි විසින් ඉල්ලුම් කරන ලද ශෘහ භාණ්ඩ ලබා දීමටත් ඉල්ලුම් කරන ලද ප්ලාස්ටික් පුටු වෙනුවට කාර්යාලයට සුදුසු පුටු ලබා දීම සඳහාත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:10** 2014.12.31 දිනට ගබඩා භාණ්ඩ , ඉන්වෙන්ට්‍රි භාණ්ඩ, සහ පුස්තකාල පොත් සමීක්ෂණ සඳහා නම් කරන ලද සමීක්ෂණ මණ්ඩලය සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනිම සඳහා අභ්‍යන්තර විගණන නිළධාරි විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ ප්‍රධාන ගබඩාවේ සමීක්ෂණ මණ්ඩල නිළධාරීන් ලෙස 1. එස්.සී.දයාරංසි මිය (සභාපති) 2. වෙනත් රාජ්‍ය / පළාත් පාලන ආයතනයකින් පැමිණෙන නිලධාරියෙක් (සාමාජික) 3. එම්.එච්. ගයාත්‍රිප නිසංසලා මි(යාාක්ෂ ණ නිලධාරි) 4.එම්.ඩබ්.රජිතා දිල්රුක්ෂි (සාමාජික) නිළධාරීන්ද ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිළධාරීන් ලෙස 1.එස්.යූ.එස්. ද සිල්වා මිය (සභාපති) 2.වෙනත් රාජ්‍යu / පළාත් පාලන ආයතනයකින් පැමිණෙන නිලධාරියෙක් (සාමාජික) 3. ටී.එන්. නදීකා නිල්මිණි මිය (සාමාජික) නිළධාරීන්ද පුස්තකාල පොත් සමීක්ෂණ මණ්ඩල නිළධාරීන් ලෙස 1. එම්.එච්.රෝෂිණී මිය (සභාපති)2.වෙනත් රාජ්‍යa / පළාත් පාලන ආයතනයකින් පැමිණෙන නිලධාරියෙක් (සාමාජික) 3. ආර්.ඩබ්.ඩී.මල්කාන්ති මෙවි (සාමාජික) නිළධාරීන්ද ප්‍රධාන ගබඩාවේ සමීක්ෂණ මණ්ඩල නිළධාරීන්ගේ සහය සඳහා 1. කේ.එම්.මල්කි මිය (ගබඩා භාර නිලධාරී) 2. එල්.ආර්.මිගෙල්හේවා මිය (ගබඩා විෂයය භාර නිලධාරී - ගබඩා ලැයිස්තු ලිවීම හා ගබඩා ශේෂ සමීක්ෂයණ වාර්තාවල සටහන් කිරීම සඳහා ) 6. එච්.ඒ.ජයලත් මයා (ගබඩා කම්කරු ) යන නිළධාරීන් සහ සේවකයින්ද පුස්තකාල පොත් සමීක්ෂණ මණ්ඩලයේ නිළධාරීන්ගේ සහය සඳහා 1.කේ.ඩබ්.මානෙල් රංජනී මිය (පුස්තකාලයාධිපති) යන නිළධාරීන්ද සුදුසු බවට නම් කර තිබූ අතර මෙම සමීක්ෂණ මණ්ඩලය පත්කර ගැනීම , සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් වෙනත් රාජ්‍ය හෝ පළාත් පාලන ආයතන වලින් නිළධාරීන් 3 දෙනෙකු යොදා ගැනීම , සමීක්ෂණ මණ්ඩලයට සහ සහාය කාර්යය මණ්ඩලයට අතිකාල ගෙවීම , අධීක්ෂණය සඳහා ගරු මන්ත්‍රීවරුන් 06 දෙනෙකු පත් කර ගැනීම ,අධීක්ෂණ නිළධාරියකුගේ සේවය ලබා ගැනීම යන කරුණු සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් භාණ්ඩ සමීක්ෂණය සඳහා අභ්‍යන්තර විගණන නිළධාරි විසින් නම් කරන ලද නිළධාරි මණ්ඩලය සඳහා සභාවේ අනුමැතිය ලබාදුන් අතර ප්‍රධාන ගබඩාවේ සමීක්ෂණ කටයුතු අධීක්ෂණය සඳහා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා ද ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණ කටයුතු අධීක්ෂණය සඳහා ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා සහ**

**කේ. පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා ද පුස්තකාල පොත් සමීක්ෂණ කටයුතු අධීක්ෂණය සඳහා ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා සහ ජේ. ඩබ්. ජයන්ත මහතා ද නම් කරන ලදී.**

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** **'** ජල කාන්දු අලුත්වැඩියාව සඳහා මාර්ගය වසා තැබීම **'** මැයෙන් අම්බලන්ගොඩ ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ පාදේශීය ඉංජිනේරු විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ ජල සම්පාදන ක්‍රමය යටතේ කරිත්ත කන්ද පන්සල මාර්ගයේ දුම්රිය හරස් මාර්ගයේ ඇති ජල කාන්දු අලුත්වැඩියා කටයුත්ත 2014.11.05 වන දින යොදා ගෙන ඇති බැවින් අදාල නඩත්තු කටයුත්ත සඳහා එම මාර්ගය 20104.11.05 වන දින ප. ව. 2.00 සිට පසු දින උදෑසන 6.00 දක්වා කාලය තුළ වසා තැබීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ජල කාන්දු අලුත්වැඩියාව සඳහා කරිත්ත කන්ද පන්සල මාර්ගය 20104.11.05 වන දින ප. ව. 2.00 සිට පසු දින උදෑසන 6.00 දක්වා කාලය තුළ වසා තැබීම සඳහා සභාවේ අනුමැතිය ලබා දුන් අතර මාර්ගයේ පලුදුවන ස්ථානය සඳහා සහ මීට පෙර අලුත්වැඩියා කටයුතු වලදී මාර්ගයේ පලුදුකරන ලද ස්ථාන සඳහාද ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී.**

**12:2** **'** ගී රඟ සොබා නාට්‍ය ගීත එකතුව**'** මැයෙන් අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයීය සෞන්දර්ය ඒකක ව්‍යාපෘතිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ධර්මාශෝක විද්‍යාලයීය සෞන්දර්ය ඒකක ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අරමුදල් සපයාගනු පිණිස ධර්මාශෝක විද්‍යාලීය සෞන්දර්ය ඒකක ව්‍යාපෘති කමිටුව හා විද්‍යාලීය කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය ඒකාබද්ධව පැරණි නාට්‍ය ගීත ප්‍රසංගයක් 2014.10.30 දින විද්‍යාලීය තෝමස්ද සිල්වා අනුස්මරණ ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවත් ඒ අනුව විද්‍යාලීය සෞන්දර්ය ඒකක ගොඩනැගිල්ල ඉදි කිරීම වෙනුවෙන් අරමුදල් තර කර ගනු පිණිස පැවැත්වෙන මෙම ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම ව්‍යාපෘතිය පවත්වා අවසන් බැවින් ගී රඟ සොබා ව්‍යාපෘතියේ ආදායම් වියදම් ඇස්තමේන්තුවක් මගින් ඉදිරිපත් කරන ලෙස ලිපියක් මගින් ධර්මාශෝක විද්‍යාලයට දැනුම් දීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**12:3** අනුබෙදුමේ **1%** ගාස්තු නිදහස් කර ගැනීම සඳහා අංක 88/90 , මුහුදු වෙරළ පාර , පටබැදිමුල්ල ලිපිනයේ පදිංචි මන්ත්‍රී විදාන චන්ද්‍රා යන අය විසින් ඉදිරිපත් කර තිබූ දිවුරුම් ප්‍රකාශය සභාගත කරන ලදී.

නගර සභාවට තමන් විසින් ඉදිරිපත් කර ඇති අනු බෙදුම් අයදුම් පත්‍ර අංක SD / 2014/ 45 හි සඳහන් වන අංක 352 දරණ පිඹුරේ A,B,C යනුවෙන් බෙදා වෙන් කර ඇති කැබලි 3නේ A කොටසේ පර්චස් 07.16 කොටස දිවුරුම් ප්‍රකාශකාරිය වන තාමට අයත් බවත් පර්චස් 15.22 වන B කොටස ඥාති පුත්‍රයකු වන මාර පතිරගේ ගයාන් නදිකට අයත් බවත් පර්චස් 16.37 ක් වන C කොටස ඥාති සහෝදරියක් වන පද්මා මන්ත්‍රී විදාන මහත්මියට අයත් බවත් මෙම ඉඩම අයිතිකරුවන්ගේ කොටස් පැහැදිලිව හදුනා ගැනීම පිණිස කැබලි කළා මිස වෙන්දේසියකට හෝ විකිණීමට කැබලි නොකළ

බව දිවුරා ප්‍රකාශ කරන බවත් දිවුරුම් ප්‍රකාශකාරියට අයත් A කොටස පමණක් ඉදිරිකාලයේදී විකිණීමට බලාපොරොත්තු වන බවද ප්‍රකාශකර තිබුණි.

**තීරණය**

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් SD / 2014/ 45 අංක දරණ අනුබෙදුමේ B සහ C කොටස් විකිණීම මත අයකරන 1% ක ගාස්තුවෙන් නිදහස් කිරීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**12:4** "දකුණු පළාතේ සංචාරක නාම පුවරු සවි කිරීම " මැයෙන් රුහුණු සංචාරක කාර්යංශයේ කළමණාකාර අධ්‍යක්ෂක විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

දකුණු පළාතේ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා සංචාරක මඟ පෙන්වීමේ නාම පුවරු සකස් කර සවි කිරීම වාර්ෂිකව සිදු කරන බවත් 2014 වසරටත් එම කටයුත්ත සැලසුම් කර ඇති බවත් ඒ අනුව මෙම නාම පුවරු දෙස් විදෙස් සංචාරකයන්ගේ සහ මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා සවි කරන බැවින් නාම පුවරු සවි කිරීමට තෝරාගත් ස්ථාන වල නාම පුවරු සවි කිරීම සඳහා මුදල් අය කිරීමකින් තොරව අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් දකුණු පළාතේ සංචාරක නාම පුවරු සවි කිරීම අය කිරීමකින් තොරව සිදු කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

**12:5** ' මා පිය මෙහෙවර වැඩසටහන- සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කොට්ඨාශය අම්බලන්ගොඩ' මැයෙන් අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.
දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය හා සෞඛය අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමාගේ උදාර සංකල්පනාවකට අනුව මතෘ ළමා සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා පවත්වනු ලබන මාපිය මෙහෙවර වැඩසටහන් මාලාව යටතේ අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කොට්ඨාශයේ පවත්වන වැඩ සටහන අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයේදී 2014 නොවැම්බර් 04 දින පැවැත්වීමට කටයුතු යොදා ඇති බව සඳහන් කර තිබූ අතර මේ සඳහා කොඩි කණු එසවීම සඳහා කොඩි කණු 03 ක් , කාර්යාලීය ගේට්ටුව අසල පිළිගැනීමේ තොරණක් ඉදිකර ගැනීම , කාර්යාලීය භූමිය කොඩි වලින් සරසා ගැනීම සඳහා කොඩි කණු සහ කොඩි 12 ක් ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයට මා පිය මෙහෙවර වැඩ සටහන වෙනුවෙන් කොඩි 12 ක් කොඩි කණු 15ක් සහා ආවරණ අනුමැතියට යටත්ව නොමිලයේ ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

12.6 " නගර ශාලාව ලබා ගැනීම සඳහා " මැයෙන් අම්බලන්ගොඩ පොලිස් ස්ථානය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014.10.29 වන දින පැය 12.00 සිට පැය 13.15 දක්වා ගා /ශ්‍රී දේවානන්ද විදුහලේ 8, 9, 10 වසර වල සිසුන්සඳහා ළමා අපචාර සහ ඒවා වළක්වා ගැනීම සඳහා දේශනයක් කිරීම සඳහා නගර සභා දේශන ශාලාව අය කිරීමකින් තොරව ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට අය කිරීමකින් තොරව 2014.10.29 වන දින නගර ශාලාව සහා ආවරණ අනුමැතියට යටත්ව ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:7** **'** කඨින පිං කම සඳහා පුටු 100 ක් ලබා ගැනීම **'** මැයෙන් 8, කන්ද මාවත, පටබැඳිමුල්ල ලිපිනයේ පදිංචි කේ. ඩබ්. අශෝක රංජිත් මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

කරිත්ත කන්ද පන්සලේ කඨින පිංකම සඳහා පුටු 100 ක් නොමිලයේ ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මං දැක්කා සභාපතිතුමණි ලක්ෂ්මි මන්ත්‍රීතුමියත් පුටු 25 ක් ඉල්ලලා ලිපියක් යොමු කරලා තිබුණා. ලැජ්ජයි සභාපතිතුමා මන්ත්‍රීවරු හැල්ලුවට ලක්වෙනවා. මේ කොඩි කණු 20 යි කොඩි 05 යි පුටු 100 යි ඉල්ලලා ලියුම් සභාවට දාන්න ඕනද. මන්ත්‍රීවරුන් කෙරේ විශ්වාසය තියන්න බැරිද. සභා තීන්දුවක් අරන් තියෙනවා මළ ගෙදරක් වුනොත් පුටු 50 ක් 100 ක් නොමිලේ ලබා දෙන්න කියලා. පොදු දේකටනේ මේක ඉල්ලන්නේ. මන්ත්‍රී කෙනෙක් පුටු 100 ක් 50 ක් ඉල්ලුවොත් ඒක ලබා දෙන්න නිදහස් කරන්න කියලා මං ඉල්ලනවා ගරු සභාවෙන්. මං යෝජනා කරනවා සභාපතිතුමණි.පාලක පක්ෂයේ වෙන්න පුලුවන් විපක්ෂයේ වෙන්න පුලුවන් පුටු 100ක් හරි 50 ක් හරි ඉල්ලලා මේ සභාවට හැම දාම ලියුම් දානවා. සභාවෙත් කාලය නාස්ති වෙනවා. මන්ත්‍රීවරුන්ගේ කාලයත් නාස්ති වෙනවා. මළගෙදරකට දෙනවා වගේ මන්ත්‍රීවරයෙක් ඉල්ලුවොත් පුටු 50 ක් හරි කොඩි 100 ක් හරි ඒක නොමිලයේ ලබා දෙන්න කියලා මං යෝජනා කරනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහෙම දෙයක් තියෙනවා ඔය දේ කෙරෙන කාර්යය පටිපාටිය කොයි ආකාරයෙන්ද කියන එක තමයි ගැටලුව. අනෙක් මන්ත්‍රීවරු මේකට එකඟ නම් මගේ ගැටලුවක් නෑ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

කිත්සිරි මන්ත්‍රීතුමා මොකක් හරි එකකට පුටු 25 ක් ගන්න මට ලියුමක් එවලා තිබුණා. මං එවේලාවෙත් කීවා දෙන්න කියලා. මොකද පුටු 25 ක් ඉල්ලන්නේ පොදු කටයුත්තකට මහජන ඡන්දයෙන් පත්වෙච්ච මිනිස්සු විදියට.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පුටු කීයක්ද යෝජනා කළේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

පුටු 100 ක් සහ කොඩි කණු ටිකක් ඉල්ලුවම ලබා දෙන්න කියලා යෝජනා කළේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හැබැයි ඔයාලටත් මේක ප්‍රශ්ණයක් වෙනවා අන්තිමට. මොකද බඩු නැති වුනහම. තව දෙයක් තියෙනවා ඔය පුටු 100 දුන්නා කියමු අපි අපේ නමින් ඒ පාර භාණ්ඩ සමීක්ෂණයේදී අඩු වුනහම අපේ පඩියෙන් කපනවා. එහෙනම් මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම මත පොදු කටයුතු සඳහා පුටු 100 ක් සහ කොඩි කණු ලබා දෙන්න අනුමත කරනවා.

තීරණය

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් කරිත්ත කන්ද පන්සලේ කඨින පිංකම වෙනුවෙන් පුටු 100ක් සහා ආවරණ අනුමැතියට යටත්ව නොමිලයේ ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

12.8 පළාත් පාලන ආයතන සතු වාහන පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ (නගරාධිපති/සභාපති) නිල වාහන ලෙස භාවිතා කිරීම' මැයෙන් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන අමාත්‍ය ගරු ෂාන් විජයලාල්ද සිල්වා මැතිතුමා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

දකුණු පළාතේ පළාත් පාලන ආයතනයන්හි ගරු නගරාධිපතිවරුන්ට සහ ගරු සභාපතිවරුන්ට පළාත් පාලන ආයතන සතු වාහනයක් තම නිල වාහනය වශයෙන් භාවිතා කිරීමටත් එම නිල වාහනය තමන්ගේ පෞද්ගලික කාර්යයන් සඳහා යොදා ගැනීමටත් පහත සඳහන් කොන්දේසි වලට යටත්ව අනුමැතිය ලබා දෙන බව දන්වා තිබුණි.

(අ) සභාව සතු මගී වාහන අතුරෙන් නගරාධිපතිගේ / සභාපතිගේ නිල කාර්යයන් සඳහාම වාහනයක් වෙන් කරනු ලබන්නේ නම් සභාවේ සාමාන්‍ය සේවාවන් පවත්වාගෙන යාමට ඉන් බාධාවක් නොවන පරිදි වෙන් කිරීම කළ යුතුය.

(ආ)නගරාධිපතිවරුන් /සභාපතිවරුන්ගේ නිල කාර්යයන් සඳහා නිශ්චිත වාහනයක් වෙන් කිරීම සහ එම වාහනයට ලබා දිය යුතු උපරිම මාසික ඉන්ධන ප්‍රමාණය කවර ප්‍රමාණයක්ද යන්න පූර්වයෙන් සභාව විසින් විධිමත් පරිදි සම්මත කරන ලද යෝජනා සම්මුතියක් මගින් තීරණය කළ යුතුය.

(ඇ)සභාව සතු මගී වාහන අතුරින් නගරාධිපති/සභාපති නිල කාර්යයන් සඳහාම වාහනයක් වෙන් කිරීමට ඉහත (අ) ජේදය යටතේ සභව තීරණය කිරීමෙන් පසු එම වාහනය නගරාධිපතිවරයා /සභාපතිවරයා විසින් ස්වකීය පෞද්ගලික කාර්යයන් සඳහා යොදවා ගැනීමේදී අවශ්‍ය ඉන්ධන පෞද්ගලිකව සපයා ගත යුතු අතර , වාහනයට අයත් වන වෙනත් සියලුම වියදම් පළාත් පාලන ආයතනය විසින් දැරිය යුතුය.කෙසේ වෙතත් ඉහත සියලු කටයුතු සඳහා රියදුරු විසින් සාමාන්‍ය පරිදි ධාවන වාර්තා පවත්වා ගත වුතුය.

(ඈ) පළාත් පාලන ආයතනයන් හී නගරාධිපතිතුමන් /සභාපතුමන් ගේ නිල කාර්යයන් සඳහා වෙන් කළ වාහනයක් ඔවුන් විසින් ස්වකීය පෞද්ගලික කාර්යයන් සඳහා යොදා ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා නගරාධිපතිවරුන් /සභාපතිවරුන් සෑම ලිත් මාසයක් සඳහාම ඒ සම්බන්ධයෙන් රු. 300.00 ක මුදලක් පළාත් පාලන ආයතන අරමුදලට ගෙවීම් කළ යුතුය.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ලේකම් මහත්තයා මං පෞද්ගලික ගමන් වලට මේ වාහනය භාවිතා කරන්නේ නැනේ.අවශ්‍යතාවයක් වුනොත් විතරනේ ගන්නේ. එනිසා ඉන්ධන සීමාවක් අවශ්‍යනැනේ. මොකද ඉන්ධන අවම භාවිතයක් මෙතන වෙන්නේ. මට පෞද්ගලික ගමනකට අවශ්‍ය වුනොත් මං ඒ රු. 300.00 බැඳලා හැම මාසෙකම යන්න ඕන නම් යන්නම්. එනිසා මං සභාවෙන් ඉල්ලා සිටිනවා ,හැම විටම මේ වාහන භාවිතා කරන්නේ නිළධාරීන්. නිළධාරීන්ම ඒ විදියට භාවිතා කරන්න.මට අවශ්‍යතාවයක් වුනොත් රු.300.00 බැඳලා වාහනය අරගන යන්න අවසර ලබා දෙන්න කියලා.

<u>තීරණය</u>

☛ **කාර්යාලීය වාහන වැඩි වශයෙන් භාවිතා කරනුයේ නිළධාරීන් නිසාවෙන් සහ ගරු සභාපතිතුමා විසින් තම පෞද්ලගික කටයුතු සඳහා කාර්යාලීය වාහන භාවිතා නොකරන බැවිනුත් යම් අවශ්‍යතාවයක් ඇති වුවහොත් රු.300.00 ක මුදල පළාත් පාලන ආයතනයට ගෙවීමෙන් කාර්යාලීය වාහනය භාවිතා කිරීමට ලබා ගැනීමට , සභාපතිතුමා විසින් ගරු සභාවේ අවසරය ලබාගන්නා ලදී .**

**12:9** ' කෘෂිකාර්මික වෙළඳ පොල හා ප්‍රදර්ශනය -2014 අම්බලන්ගොඩ ධීවර සංකීර්ණය වෙන් කිරීම වෙනුවෙන් සහනයක් ලබා ගැනීම ' මැයෙන් අම්බලන්ගොඩ උද්‍යාන විද්‍යා හා මල් වගා කරුවන්ගේ සංගමය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සීමාවේ පදිංචි ඉතා කුඩා බිම් ප්‍රමාණයක් ඇති ගෙවතු අලංකරණය සඳහා උනන්දුවක් දක්වන ප්‍රදේශවාසීන්ගෙන් සැදුම්ලත් අම්බලන්ගොඩ උද්‍යාන විද්‍යා හා මල් වගා කරුවන්ගේ සංගමය දකුණු පළාතේ කෘෂි කර්ම

දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය යටතේ වසර 17 ක් තිස්සේ ප්‍රදේශයට පොදු වැඩ පිළවෙළක් හදුන්වා දෙමින් සේවය කරන බවත් 2014 නොවැම්බර් 28 හා 29 දෙදින පෙ.ව. 8.00 සිට ප. ව. 6.00 දක්වා අම්බලන්ගොඩ ධීවර සංකීර්ණයේදී කෘෂිකාර්මික වෙළද පොල හා ප්‍රදර්ශනය පැවැත්වීමට අදහස් කර ඇති බවත් මෙම කටයුත්ත වෙනුවෙන් අම්බලන්ගොඩ ධීවර සංකීර්ණය වෙන් කිරීම වෙනුවෙන් යම් සහනයක් ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

**<u>තීරණය</u>**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මේ සදහා පසු ගිය වසරේදී ලබා දෙන ලද සහනයම ලබා දීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**12:10** ‘ ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ කාගිල්ස් ෆුඩ් සිටි FA කප් පාපන්දු තරගාවලිය - 2014 තරගාවලිය නියෝජනය කිරීම සදහා අනුමැතිය ලබා ගැනීම ’ මැයෙන් නගර සභා පාපන්දු සංචිතයේ පාපන්දු පුහුණුකරු ඉදුනිල් එදිරිවික්‍රමසූරිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභා පාපන්දු සංචිතයේ පාපන්දු කණ්ඩායම 2013 වර්ෂයේදී ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය මගින් පවත්වනු ලැබූ FA කප් පාපන්දු තරගාවලිය සදහා සහභාගී වී B කාණ්ඩයේ අර්ධ අවසන් පූර්ව තරගය දක්වා ඉදිරියට යමින් විශිෂ්ඨ ජයග්‍රහණයක් අත්කර ගත් බව සදහන් කර තිබූ අතර ප්‍රථම වරට අම්බලන්ගොඩ පාපන්දු සංගමය සංවිධානය කරන ලද අන්තර් ක්‍රීඩා සමාජ ලීග් තරගාවලියේ අවසාන මහා තරගයටද කණ්ඩායම් 16 ක් අතරින් නගර සභා පාපන්දු කණ්ඩායම අවසාන මහා තරගයට තේරී ඇති බවද සදහන් කර තිබූ අතර 2014 වර්ෂයේ කාගිල්ස් ෆුඩ් සිටි FA කප් පාපන්දු තරගාවලිය සදහා නගර සභා පාපන්දු සංචිතයට ආරාධනා ලැබී ඇති බවත් ඒ සදහා සහභාගී වීමට අනුග්‍රහය සහ අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලා තිබූ අතර මේ සදහා වන දළ ඇස්තමේනතුවක්ද ලබා දී තිබුණි.

**<u>තීරණය</u>**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් කාගිල්ස් ෆුඩ් සිටි FA කප් පාපන්දු තරගාවලිය සදහා නගර සභා පාපන්දු සංචිතයට සහභාගී වීම සදහා අනුමැතිය සහ අනුග්‍රහය ලබා දීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**12:11** ‘ අම්බලන්ගොඩ නගර ශාලාව සහනදායි මිලට ලබා ගැනීම සම්බන්ධවයි ’ මැයෙන් Ilead වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයේ ආයතන පරිපාලන නිළධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අඩු ආදායම්ලාභී තරුණ ප්‍රජාව වෙනුවෙන් නොමිලයේ පාඨමාලාවක් පවත්වාගෙන යන Ilead වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය මගින් සාමය හා සංහිදියාව යන තේමාව යටතේ 2014.11.22 වන දින පවත්වනු ලබන එකමුතුකමේ පා ගමන අවසානයේ වෘත්තිය අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් ඉදිරිපත් කරනු ලබන කුසලතා දැක්ම අම්බලන්ගොඩ නගර සභා ශාලාවේදී පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් ඒ සදහා නගර සභා ශාලාව අඩු මුදලකට ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

**<u>තීරණය</u>**

☞ ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් අඩු ආදායම්ලාභී දරුවන් වෙනුවෙන් කරන වැඩසටහනක් සහ සාමය සහ සංහිදියාව වෙනුවෙන් පවත්වන වැඩ සටහනක් වන බැවින් මේ සදහා 50% කින් ශාලා ගාස්තු නිදහස් කිරීමට ගරු සභාව තීරණය කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

සභාපතිතුමණි මේ කසල එකතු කිරීමේ වැඩ සටහන ටිකක් දුර්වල වෙලා තියෙනවා විලේගොඩ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔව් ඒක තමයි. අපි ලබා දීපු පෝග්‍රෑම් එක අනුව වැඩ කරන්නෑ. ඒ නිසා මේක රිවයිස් කරලා අදට ගැලපෙන ආකාරයෙන් ඉදිරිපත් කරන්න කීවා. මටත් තේරුම් ගන්න බෑ මේ ඉදිරිපත් කරපු විදිය. එනිසා මෙය නිසි පරිදි සකස් කරලා ලබන සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

දැන් ට්‍රැක්ටරයක් කැඩිල නම් උදේ දුවන එකක් හවසට හරි දාලා මේ කුණු අදින්න කියන්න. මොකද දැන් සමහර තැන් වල පණුවොත් ගහලා. එනිසා මේවා අයින් කරන්න. මට කීප දෙනෙක්ම පැමිණිලි කළා.

**12:12** ' 2014 ඔක්තෝම්බර් මස වාර්තාව ' මැයෙන් නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඖෂධ සංයෝජක විසින් එවා තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ආයතනයෙහි සායන පැවැත්වූ දින ගණන 21 ,ආයතනයට පැමිණි රෝගීන් ගණන 268, රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය 13, මාසය සඳහා වැය වු ඖෂධවල මුළු වටිනාකම රු.22623.55, රෝගියෙක් සඳහා වැය වු මුදල රු. 84.41 ලෙස සඳහන් කර තිබුණි.

**තීරණය**

☛ **මෙම වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.**

**12:13** ' නොම්ලයේ පවත්වන සාමාන්‍ය පෙළ සම්මන්ත්‍රණ වැඩ සටහන සඳහා නගර ශාලාව වෙන් කරවා ගැනීම ' මැයෙන් පුස්තකාලයාධිපතිනිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඩබ්. නදුන් තුෂාර ද සිල්වා මහතා විසින් 2014.11.04 වන දින ෆැක්ස් පණිවිඩයක් මගින් දන්වා එවන ලද ලිපිය අනුව 2014.11.12 වන දින නොම්ලයේ සාමාන්‍ය පෙළ සිසුන් සඳහා සම්මන්ත්‍රණයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බවත් ඒ අනුව 2014.11.12 වන දින ප. ව. 2.30 සිට ප.ව. 5.00 දක්වා නගර ශාලාව නොම්ලයේ වෙන් කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සාමාන්‍ය පෙළ සිසුන් සඳහා සම්මන්ත්‍රණයක් පැවැත්වීමට 2014.11.12 වන දින ප. ව. 2.30 සිට ප.ව. 5.00 දක්වා නගර ශාලාව නොම්ලයේ ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:14** ' තල්ගස්ගොඩ පුංචි පාලම අසල සිට මහපාලම දක්වා මාර්ගය අයිනේ එක්පැත්තක ශරීර සුවතා මං තීරුව ඉදිකිරීම - Am/uc/3/2/CBG/2013/1 ' මැයෙන් කුරුදුගහ D.K.S බිල්ඩර්ස් ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාව සමග ගිවිසුම් ගතව කරණු ලබන ඉහත සඳහන් කර්මාන්තයේ ගිවිසුම් කාලය 2014.04.03 වන දිනෙන් අවසන් වු බවත් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ උපදෙස් අනුව එම කර්මාන්තය මේ වන විට තාවකාලිකව නවතා ඇති බවත් මෙම මං තීරුව පස් දමා තුනී කර තැලීමේදී එය අඩියර 3 ක් යටතේ සිදු කළ බවත් එම සෑම අඩියරකදීම තත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට සිදු වු බවත් ඒ අනුව 2014.01.09 වන දින 2014.04.22 වන දින සහ 2014.07.08 වන දින යනහි තත්ව පරීක්ෂණ කටයුතු සිදු කළ බවත් ඒ සඳහා යම් කාලයක් ගත වු බවත් සඳහන්

කර තිබු අතර පසු ගිය දිනවල පැවැති වැසි සහිත කාළ ගුණික තත්වය නිසාද මෙම කර්මාන්තයේ වැඩ කටයුතු අඛණ්ඩව කරගෙන යාමට නොහැකි වු බවද සදහන් කර තිබු අතර මේ පිළිබඳ කාරුණික අවදානය යොමු කර මෙම කර්මාන්තයේ ගිවිසුම් කාලය 2014.10.31 දක්වා දිර්ඝ කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

දැන් මේ මං තීරුව හදද්දී මාර්ග සංවර්ධන අධිකාරියෙන් අවසර ගත්තද, මොකද මේක අපට අයිති පාරක් නෙවෙයිනේ .නැතිනම් අපට ගැටලුවක් වෙයි මේක.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අවසර අරගෙන තියෙන්නේ.

**තීරණය**

☛ මේ සම්බන්දයෙන් වැඩ අධිකාරිගේ නිර්දේශය සලකා බැලු ගරු සභාව පළාත් පාලන ආයතනයේ ප්‍රධාන ඉංජිනේරුගේ නිර්දේශය පරිදි මෙම කර්මාන්තයේ ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සුදුසු බව තීරණය කරන ලදී.

## ✪ වෙනත් කරුණු

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

ගිය සභාවේත් මතක් කළා දුර ගමන් බස් නැවතුම්පල සම්බන්ධව. ඒ වුනත් ඒක තාම වෙනස් වෙලා නෑ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එතන අපේ නමින් බෝඩ් එකකුත් ගහලා තියෙන්නේ

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

නමුත් තාමත් බස් නවතන්නේ නෑ එතන.පරන පුරුදු විදියටම තමයි බස් නවත්තන්නේ. ඒ වගේම සභාපතිතුමා පොල්වත්ත බුද්ධ දත්ත පටුමගේ ගැටලුවක් තියෙනවා ඕබඩගේ ශානාත් ක්‍රිෂාන් ජයවර්ධන කියලා. ඒක ඇත්ත වශයෙන්ම අපේ නගර සභාව මගින් මීට කලින් තාරත් දැම්මා. දැන් ඒ පුද්ගලයා ඇවිල්ලා අපට කියනවා එයා කිසිම ආකාරයකින් මේ පාර නගර සභාවට පැවරුවේ නැතිලු. ඇත්ත වශයෙන්ම මේක පැවරීමක් නොකර තාර දැම්ම නම් අපි වැරදි. ඔය 5 බී කියන කොටස පෞද්ගලික ඉඩමක් විදියට මේ ප්ලෑන් වල තියෙන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒක තාර දාලා තියෙන්නේ. එතකොට ඒක පොදු පාරක් බවට පත් වෙලා තියෙන්නේ දැන්. හිටපු නාගරික මන්ත්‍රී ජගත් සේනාරත්ත මහත්තයා , ඔය කියන කෙනාගේම ඉල්ලීම නිසා තමයි ඕක කරලා තියෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

ඒක තමයි මාත් ඒක දන්නවා. නමුත් දැන් තියෙන ගැටලුව එතුමා ලියුමක් යොමු කරලා තියෙනවා ඔබතුමාට .

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒකෙදි මං TO වාර්තාවක් අරගත්තා මේක පොදු පාරක් කියලා. එහෙම වුනොත් මේක අපි සියලු දෙනාම කරපු වරදක් වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

දැන් ඔතන අනෙක් ඉඩම කැඩීමේදී ඉඩමට යන්න ප්‍රවේශ මාර්ගයක් තියන්න ඕනනේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔව් ඉතින් නගර සභාවෙන් තාර දාපු පාරක් තියෙනව නම් ඊට වඩා තව දෙයක් ඕන නැනේ. TO හරි UDA නිළධාරියා හරි බලන්නේ තාර දාපු පාරක් තියෙනවද කියලා විතරනේ. එතනින් එහා දෙයක් නෑ.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

පැවරීමක් නොකර තියෙනව නම් මොකද කරන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒක අපි දෙගොල්ලන්ගේ ප්‍රශ්නයක්නේ. එහෙම නම් අපි සියලු දෙනාම වැරදී තමයි . නමුත් මම දන්න විදියට ශානාත් මහත්තයාගේ ඉල්ලීමට තමයි ඔය පාර තාර දැම්මේ.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

ඒ වගේම සභාපතිතුමා එදා කතා කළා ගාලු පාර දෙපැත්ත පස් දාන එක ගැන. නමුත් තාම ඒක මුකුත් වෙලා නෑ.ඒක ඉක්කමණින් මොකක් හරි කරන්න. මේ ධර්මාශෝක ඉස්සරහ එහෙම යන්නම බෑ. වැටෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ ක්‍රීඩාංගනය පිළිබඳ අලුත්තම තත්වය මොකක්ද?

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒකත් ආරම්භ වෙයි කියලා අපි හිතනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

දෙසැම්බර් මාසේ සල්ලි යනවනේ ආපහු

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔව් කොන්ත්‍රාත්කරුවෙක් හොයා ගෙන තියෙන්නේ. වැඩ ආරම්භ වෙයි කියලා හිතෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

මං ගිය සභා වාරයකදීත් කතා කළා අම්බලන්ගොඩ බටපොල පාරේ චාමර ගෙදර ළඟ මාර්ග බාධකය දාන එකට මාර්ග සංවර්ධන අධිකාරිය දැණුවත් කරන්නම් කිව්වා. නමුත් ඒක තාම මුකුත් වෙලා නෑ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒක නම් අනුමත කරන්න බෑ මන්ත්‍රීතුමා. තවත් මිනිස්සු මැරෙයි කන්ද පල්ලෙහා බන්පර් එකක් දැම්මොත්. මං දන්න තරමින් කිසිම ප්‍රධාන පාරක මාර්ග බාධක යොදවන්නෑ. ගාලු පාරෙත් හික්කඩුවේ දාපුවත් කඩලා අයින් කළා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

මං ඊයෙත් ගාලු යන කොට තිබුණා මාර්ග බාධක ගාලු පාරේ. මෙතන විශාල අවදානම් තත්වයක් තියෙනවා ඒකයි කියන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
දන්වන්න නම් පුලුවින්. ඒත් මං හිතන්නෑ මොකද මෙතන පල්ලම නිසා මාරග බාධකයක් යොදන්න අමාරුයි.

**ගරු නගර සභා මන්ත්‍රජ් .ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**
කැටන්තොට පෙර පාසලේ වතුර බිල වැඩියි. ඒක ටිකක් බලන්න කියන්න සභාපතිතුමා. ටොයිලට් එකේ දොර ඇරලා වතුර අරගෙන නානවා මිනිස්සු.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
TO කැටන්තොට පෙර පාසලේ ටොයිලට් එකේ දොර ඇතුල්පැත්තෙන් දාන්නකෝ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**
සභාපතිතුමා මහ පන්සල ළග කාණුව දැන් තුන් හතරපලක් පලක්ම කැඩිලා තියෙන්නේ.මං හිතන්නේ නගර සභාවට කාණුවම හදන්න වෙයි දැන්ම හැදුවෙ නැති වුනොත්. මොකද ලොකු වතුර පාරක් එන්නේ. කාණුව උඩින් යන්නේ වතුර.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**
ගිය වර සභාවේ වෙනත් කරුණු යටතේ සභාපතිතුමණි අපි කතා කළා දහම් පාසල් සම්බන්ධයෙන් ඔබතුමන්ම කියලා තියෙනවා 42 පිටුවේ. මේ සම්බන්ධ සාකච්ඡාව කවදද පවත්වන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
දිනයක් දුන්නා . ඒත් දිනය ටිකක් කල් දාන්න වුණා හදිසි රැස්වීම් වගයක් නිසා.

.

**ප. ව. 01. 08 ට පමන සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

| | |
|---|---|
| භාරත සමරසේකර, | ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්, |
| ලේකම් , | සභාපති, |
| අම්බලන්ගොඩ නගර සභාව. | අම්බලන්ගොඩ නගර සභාව. |

**2014 – 11 – 20 දින,**
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**